ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2015 ක් වූ මාර්තු 15 ඉරිදා 149 වෙළුම 40 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 - පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/20/NEWS/2015

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

## සුදුතුම් පිය තතු මව් බසින් ගෙන එන "වතිකාන සුළඟ" වෙබ් අඩවිය

වතිකානය සහ පාප්තුමන් විසින් නිකුත් කරන වටිනා ඉගැන්වීම් , තොරතුරු , පුවත්, ඡායාරූප සියල්ල සිංහල සහ දෙමළ බසින් ලබාදීම සඳහා වෙබ් අඩවියක් පසුගිය සුදුතුම් පිය පදවි ප්‍රාප්ත දිනයේ (මාර්තු 13) අන්තර්ජාලයට මුදාහැරියේය.

vathikanasulaga.blogspot.com යන වෙබ් ලිපිනයෙන් ඔබටත් එයට පිවිසිය හැකි අතර 'වතිකාන සුළඟ' වෙබ් අඩවිය සංස්කරණය දැනට කැනඩාවේ වෙසෙන ප්‍රවීන කිතුනු මාධ්‍යවේදී සමන් කපිල විජේසූරිය සහ නුවන් ලියනගේ විසිනි





**ඉස්ලාමීය රාජ්‍යය ත්‍රස්තවාදීන් අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්ට ජීවිත තර්ජන එල්ල කර ඇති බව වතිකානයේ පොලිස්පති ඩොමිනිකෝ ගියානි ප්‍රකාශ කර සිටී.**

"තර්ජනයක් පවතිනවා. මේ මොහොතේ දී මට ප්‍රකාශ කළ හැකි වන්නේ වතිකානයට හෝ ශුද්ධෝත්තම පියතුමාට ප්‍රහාරයක් එල්ල කරන්නට සැලසුමක් ඇති බව පමණ යැ"යි ඔහු ප්‍රකාශ කරන්නේය. මේ අතර අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ඉස්ලාමීය රාජ්‍යය ත්‍රස්තවාදීන්ගේ අමානුෂික ක්‍රියාමාර්ගයන් හෙළා දකිමින් ඉරාකයේ හා සිරියාවේ කිතුනුවන්ට එරෙහි ප්‍රහාර එල්ල කිරීම ගැන විවෘත ප්‍රකාශයක් කළේය.

# සසුන් පියාගේ ජීවිතය අනතුරේ

## ISIS ත්‍රස්තයන්ගෙන් තර්ජන ඇති බව වතිකානය තහවුරු කරයි

## අතිගරු ඇන්සලම් ද ක්‍රෑස් පියතුමා ස්වර්ගස්ථ වේ



කොළඹ අගරදගුරු වසමේ ජ්‍යෙෂ්ඨ හා වියත් පියතුමකු වූ ගරු ඇන්සලම් ද ක්‍රෑස් පියතුමා මාර්තු 10 වැනිදා සගසුව දිනුවේය. කොළඹ අගරදගුරු වසමේ කළුතර මුල්ම කලාපීය නාහිමිපාණන් වූ එතුමා පලාතොට දහම් සෙවන පූජක දෙව්සත්හලේ අධ්‍යක්ෂ ලෙසද සේවය කළේය.

ජෝශප් එම්මානුවෙල් ඩි ක්‍රෑස් හා මේරි ප්ලොරන්ස් යුවළට දාව 1933 මැයි 04 දා මීගමුවේදී උපත ලද එතුමා මීගමුව මාරිස්ටෙල්ලා විදුහලෙන් අධ්‍යාපනය ලබා 1958 පෙබරවාරි 03 වැනිදා පූජක වරම් ලැබීය. බොරැල්ල කනිටු දෙව්සත්හලේ සේවය කළ එතුමා හපුතලේ එමාඩ් දෙව්සත්හල් අධ්‍යක්ෂ ලෙස 1965 දී පත්විය.

15 »»»

## කෙටි කලකින්ම වර්බුම් රූපවාහිනිය ජනතා හදවත් දිනාගත්තා

### සමීක්ෂණයකින් හෙළිදරව් වේ

ශ්‍රී ලංකාවේ ප්‍රථම කතෝලික රූපවාහිනී නාලිකාව වන වර්බුම් නාලිකාව විකාශනය කරන සිය විවිධත්වයේ වැඩසටහන් තුළින් ජනතා හදවත් දිනා ඇති බව කළ සමීක්ෂණයකින් හෙළි වී තිබේ. සමස්ත කතෝලික ජනතාවගෙන් 60% ප්‍රතිශතයක් දැනටමත් වර්බුම් රූපවාහිනී නාලිකාව දිනපතා නරඹන අතර තවත් 10% ක් මේ නාලිකාවේ වැඩසටහන් සතියකට දෙවතාවකට වඩා නරඹා ඇති බව ද තහවුරු වී තිබේ.

වර්බුම් රූපවාහිනී ආයතනය ගිහි මූලිකත්වයෙන් ආරම්භ කළ විකාශනයක් වන අතර එහි නිර්මාතෘ හා කළමනාකාර අධ්‍යක්ෂක වන්නේ රාගම මිලන් ද සිල්වා මහතායි.

15 »»»

## තේවත්ත ළමා දිනය



## කිතුනු පවුලේ හිනැහෙන දරුවන් දෙව්මව් සමඟයි

15 »»»

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ තේමාව අවධාරණය කරති



"පාපය මඟින් මරණයට පත් වූ ඔබ වරප්‍රසාදය මඟින් ගැළවුණාහුය." (එපීස 2:4-10)

ඥානාර්ථ ප්‍රදීපය

# සමාව ලබාගෙන ඔබත් අන් අයට සමාව දෙන්න!

රදගුරු පදවි වගතුග

## පදවියෙන් පදවියට

ක්‍රිස්තු වර්ෂ 2015
මාර්තු 15 ඉරිදා

## ඇතුගල්පුර රදගුරු හිමිපාණෝ ඇරියුම් කරති

**මේ චතාරිකය, මෙ වරප්‍රසාදිය කාලය තුළ ස්වාමින් වහන්සේ ඔබට ආරාධනා කරනවා, දෑත් දිගුකරගෙන බලාගෙන ඉන්නවා ඔබව පිළිගන්න ඒ ආරාධනය පිළිගන්න. සමාව දීම අපගේ පරමාදර්ශය විය යුතුයි. මේ වරප්‍රසාදීය කාලය තුළ අපට සමාව දුන් අයට සමාව දීමට බැරිනම් වෛරය උපද්දවන කාර්යයක නිරත වෙලා ඉන්නවනම් එය නැවැත්විය යුතු කාලය දැන් එළඹිලා. හොඳ අවබෝධයකින් යුතුව, ස්වාමින්වහන්සේ ඔබට ලබාදෙන සමගිවීමේ ප්‍රසාද නිධානය නම් ශුද්ධවු සක්‍රමේන්තුව මගින් සමාව ලබාගෙන ඒ සමාව ලැබුණු විධියට අපත් අන් අයට සමාව දිය යුතුයි.**

5 වැනි වරටත් තඹකන්ද කල්වාරි පුදබිමේ පැවති කුරුණෑගල පදවි පශ්චත්තාපික දිනයේදී කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ පැවසූහ.

විශ්‍රාමික රදගුරු අතිඋතුම් රේමන්ඩ් පීරිස් ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ හා පදවි පරිපාලන අතිගරු පියල් ජානක, භාණ්ඩාගාරික අතිගරු බැසිල් රොහාන් ප්‍රනාන්දු, පදවියේ ගරු පියතුමන්, ගරු පැවිදි සොහොයුරියන් හා සොහොයුරන් ද දෙදහසකට නොඅඩු සැදැහැවත් සංඛ්‍යාවක්ද සහභාගි වූහ.



සිංහල හා දමිළ බසින් මෙහෙයවු වැඩසටහනට ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින්ද, කුරුණෑගල පදවියේ සැදැහැවතුන්ද සහභාගි වී සිටි අතර තඹකන්ද මීසම් සේවක ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාගේ මඟපෙන්වීම යටතේ තඹකන්ද මීසම් සංඝය විසින් මෙය සංවිධානය කරන ලදි.

**ජී. බී. එච්. ලිවේරා**

### යහපාලනයෙන් පුදබිමට ආලෝකය

නාලවලාන මීසමට අයිති හෙණ්ඩියගල දේවස්ථානය වසර 15 ක් මුළුල්ලේ පැවති අඳුරු යුගය නිමාකරමින් දේවස්ථාන ගොඩ නැගිල්ලට වත්මන් රජය මගින් විදුලි බලය ලබා දී ඇත.

**ප්‍රින්සි ජයසූරිය**

## සුබාසිංසන









කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය මාර්තු 18 වෙනිදාටද, අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මේරියස් පීරිස්, ත්‍රිකුණාමලය රදගුරු අතිඋතුම් කිංස්ලි ස්වාමිපිල්ලේ, මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝසප්, මඩකලපුව රදගුරු අතිඋතුම් ජෝශප් පොන්නයියා හිමිපාණන්ගේ නාමසාන්තුවර මංගල්‍යය මාර්තු 19 වැනිදාට යෙදේ. එතුමනට ප්‍රදීපයෙන් පිදෙන උණුසුම් සුබාසිංසන.

## ශුද්ධ වූ ජුසේ වාස් මුනි මංගල මෙහෙයක්!

ලන්දේසීන්ගෙන් එල්ල වු ජීවිත අවදානමද නොතකා කැලෑ මං පෙත් ඔස්සේ පා ගමනින් උතුරුකරේ සිට ඇරඹු ධර්ම ප්‍රචාරක සදහම් චාරිකාවේ දී පින්කට්ටිය ග්‍රාමයේ වත්මන් සුසාන භූමිය පිහිටි වෙල්ලවලට ද සාන්ත ජුසේවාස් මුනිඳුන් පැමිණ ඇති බව පැරණි ඉතිහාස ගත මූලාශ්‍ර වල සඳහන් බව අම්පිටිය ජාතික දෙව්සත්හලේ ගරු රොබට් ජයතිලක පියතුමා පැවසීය.

බත්තුළුඔය පින්කට්ටිය ජනතාවගේ ඉමහත් කැපවීම මත වෙල්ලවල ග්‍රාමයේ ස්ථාපිත කළ ශු. ජුසේ වාස් මුනි ප්‍රතිමාවේ පළමු මංගල මෙහෙයේදී එතුමා ඒ බැව් පැවසීය. සාන්ත ජුසේ වාස් මුනි ප්‍රතිමාවෙන් බැතිමතුන් ආසිරි ගැන්වීමෙන් පසු අගුණවිල මීසම් සේවක ගරු අනුර ගම්ලත් පියතුමාගේ ස්තුති කථාව පැවැත්විය.

**පීටර් කැමිලස් සුබසිංහ**



වැලිහේන දකුණ සාන්ත සෙබස්තියන් මුනිඳු දෙව් මැඳුරෙහි 53 වැනි වාර්ෂික මංගල උත්සවය පසුගියදා එම දෙව්මැඳුර මීසම් සේවක ගරු අමිල ගෝමස් පියතුමන්ගේ ආරාධනයෙන් පැමිණි සාන්ත මරියා විදුහල්පති ගරු ජයන්ත වික්‍රමසිංහ පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් උත්සවශ්‍රියෙන් පවත්වන ලදි.

**මි. ඒ. කල්දේරා**

## මොරටුව සිරිහද දිසා පාදනමස්කාරය

අපගේ ජීවිතයේ අප ඉල්ලන දේ නොලැබෙන විට අප ස්වාමින්වහන්සේගෙන් ඈත්වී වෙනත් මාර්ග සොයා යනවා. අප ඉල්ලන හැම දෙයක්ම ස්වාමින්වහන්සේ දෙන්නෙ නැහැ. උන්වහන්සේ දන්නවා අපට අවශ්‍ය දේ. අපගේ යාච්ඤා වලදී ඉල්ලන්න ඕන උන්වහන්සේට වඩාත් සම්බන්ධ වීමට. පාපය අපව දෙවියන්ගෙන් ඈත් කරනවා. මේ සුදානම් වීමේ කාලය තුළ අපගේ ඇතුලාන්තය වෙනස් විය යුතුයි. මේ පාදනමස්කාරය අපගේ ජීවිතයට සම්බන්ධ කරගෙන එතුළින් පන්නරයක් ලබා දෙවිඳු ආදරය අත්දකිමු' යයි විල්ලෝරාවත්ත මීසම් සහයක ගරු ට්‍රොෂාන් චමින්ද පියතුමා මොරටු දිසා දිව්‍ය හෘද සමිති එකතුව දම්පෙ ලූර්දු මාතා දේවස්ථාන භූමියේ පැවැත්වු පාදනමස්කාරයෙන් පසු සිදුකළ දිව්‍ය පූජා යාගයේදී පැවසීය.

සිරිහද සමිති දිසා උපාධ්‍ය රත්මලාන මීසම් සේවක ගරු රොනී වික්‍රමසිංහ පියතුමා හා දිසා කමිටුව සංවිධානය කළ මෙයට සාමාජික සාමාජිකාවන් 200 කට වැඩි පිරිසක් සහභාගි වූහ.

**ඩොරින් පෙරේරා**



ජුසේවාස් පියතුමන් ශුද්ධවරයට එසැවීමෙන් අනතුරුව උන්වහන්සේගේ පා පහස ලැබූ මාරවිල ශ්‍රී කුරුස ජාතික පුදබිමේ ශු. ජුසේවාස් මුනිඳුන්ගේ ප්‍රතිමාවක් ස්ථාපිත කරනු ලැබූ අතර හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් අතින් පසුගියදා ආසිරි ගන්වා විශේෂ දිව්‍ය පූජා යාගයක් සිදුකරන ලදි. සිද්ධස්ථාන පාලක ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු, සහයක ගරු දිනේෂ් කීර්ති පියතුමන්ලාගේ අනුශාසකත්වයෙන් එය සංවිධානය කර තිබූ අතර සැදැහැවතුන් විශාල පිරිසක් ඒ සඳහා සහභාගී වූහ.

**ශම්මිකා ප්‍රනාන්දු**

## තරුණ දූ පුතුන්ට වැඩසටහනක්!

තරුණ දූ පුතුන්ගේ ජීවිත වඩාත් යහපත් මාර්ගයකට යොමුකිරීමේ සහ ඒ තුළින් ඔවුන් දෙමාපියන් වෙන කීකරු යහපත් පවුලක් ගොඩනැගීමේ කාර්යයට හවුල්කරුවන් කිරීමේ අරමුණින් යුක්තව දියත් කෙරෙන තෝරාගැනීමේ වැඩසටහනක් (Choice) පසුගියදා වෙන්නප්පුව සකරියස් ශාලාවේදි පැවැත්විණි.




හලාවත පදවි ජනවන්දනා කටයුතු අධ්‍යක්ෂ සහ ලෝක විවාහ හමු සංසයේ ශ්‍රි ලංකා නියෝජිත ගරු ජූඩ් නික්ලස් ප්‍රනාන්දු පියතුමන් විසින් වැඩසටහන මෙහෙයවන ලදි. වෙන්නප්පුව මීසම් සේවක ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමන්ගේ සහ වෙන්නප්පුව විවාහ හමු සංසයේ සංවිධානයෙන් වැඩසටහන සංවිධානය විය. වැඩසටහන අවසානයේ එයට සහභාගි වූ තරුණ දූ පුතුන් චොයිස් වැඩසටහනේ දේශන ඉදිරිපත් කළ ගරු ජූඩ් නික්ලස් පියතුමා ගරු රෝස් පැවිදි සොහොයුරිය, ඇක්වයිනස් රෝස් යුවළ සාගර සුදිතා යුවළ සුරංග හිරුණි, රවිඳු, රේවියන් යන අය සමග ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු.

**සටහන - ප්‍රියන්ත පීටර්ස් ; සේයා - තරංග පීටර්ස්**

## කතෝලික සිසු දිනයට ඉහළ ප්‍රතිචාර

ජා-ඇල කලාපීය තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ යොවුන් දිනය, දුන්ගාල්පිටිය දොන් බොස්කෝ ශාලාවේදී පවත්වනු ලැබීය. දේව අම්මාගේ මැදහත්කම තුළින් අපහට ලබාගත හැකි බොහෝ දේ ගැන තරුණ තරුණියන්ගේ අධ්‍යාත්මයට ඇතුලු කිරීමේ විශේෂ උත්සාහයක මෙහිදී යෙදුන අතර, නාට්‍ය හා චිත්‍රපට දර්ශන තුළින් එය වඩාත් අර්ථ ගන්වන ලදී.

අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් හා ජා-ඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ති කුමාර් වැලිවිට පියතුමන් සමග තුඩැල්ල, රාගම, කඳාන හා ජා-ඇල දිසානායක පියතුමන්ද මෙම අවස්ථාවට එක්ව සිටි අතර, සිසු සිසුවියන් 900 කට අධික ප්‍රමාණයක් සහභාගිවු මෙම තරුණ දිනය සංවිධානය කරනු ලැබුයේ ජා-ඇල කලාපීය තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය භාර ගරු තුසිත් ප්‍රදීප් පියතුමන් විසිනි.

**සෙබස්තියන් පෙරේරා**



වැලිවේරිය මීසමේ වාර්ෂික අළුත් සහල් මංගල්‍යය පසුගියදා වැලිවේරිය නැදුන්ග මුව වෙල්යායේදී පැවැත්විණ. තම අස්වැන්නෙන් ගත් නාඹුල් එල දෙවිඳුන්ට පඬුරු පිණිස පිදීමත්, එම එල වලින් සැදු කිරිබත් සහ කැවිලි වර්ග පැමිණි සැම දෙනා එකමුතුවී රස විඳීමත් මෙදින විශේෂත්වයයි. නැදුන්ගමුව එක්සත් ගොවි සංවිධානය විසින් මෙය සංවිධානය කරන ලදී. වැලිවේරිය මීසම් සේවක ගරු ලක්ප්‍රිය නෝනිස් පියතුමා දිව්‍ය පූජාව පැවැත්වු අවස්ථාව.

**ඩබ්. එම්. නිලානි පිරිස්**

### රත්නපුර පදවි වන්දනා ගමන ලබන සෙනසුරාදා

රත්නපුර පදවි වාර්ෂික වන්දනා එකමුතුව මාර්තු 21 සෙනසුරාදා පෙ.ව. 9.30 ට කුඩාගම ලූර්දු සිද්ධස්ථාන භූමියේදී පැවැත්වේ.

රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්‍ද්‍රසිරි සා.බෙ.නි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්, අතිග රු ඩේමියන් ප්‍රනාන්දු අනුනායක පියතුමන්ගේ මෙහෙයවීමන් පැවති රත්නපුර පදවි ධර්මසේවා සභා මහා සභා රැස්වීමේදී මේ තීරණය ගැනිණ.

**තියබෝල්ඩ් සමරතුංග**

### ශු. බයිබල් වැඩ සටහනක්!

කැලණිය මීසමේ වරාගොඩ ශාන්ත පාවුළු දේවස්ථානයේ මරිය හමුදාව මගින් මීසම් සේවක ගරු ජෝසප් ඉන්දික පියතුමාගේ මග පෙන්වීම යටතේ සංවිධානය කරනු ලබන දේව වචනයට සවන් දීමේ ශු. බයිබල් වැඩසටහනක් ආරම්භ කරන ලදී.

ඇක්වයිනස් විශ්ව විද්‍යාලයේ පීඨාධිපති ගරු ඇන්ටන් සමන් හෙට්ටිආරච්චි පියතුමාගේ මෙහෙයවීම යටතේ පසුගියදා ආරම්භ කරනු ලැබු අතර, මෙම වැඩසටහන සැම මසකම පළමු ඉරුදින සවස 5 ට පැවැත්වීමට කටයුතු යොදා ඇත.

**ක්ලැරන්ස් ලෙනාඩ්**

ආරම්භය : 1866 ජුනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

**කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586**

**ඊමේල්:** pradeepaya@yahoo.com, **වෙබ් අඩවිය:** www.colombocatholicpress.lk

**ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 15 ඉරිදා**



# වර්බුම් රූපවාහිනී නාලිකාව ගිහි නායකත්වයේ සැබෑ කැඩපතක්

ගිහි නායකත්වයේ මූලිකත්වයෙන් ආරම්භ කළ ප්‍රථම කතෝලික රූපවාහිනී නාලිකාව වන වර්බුම් රූපවාහිනිය ඉතාම කෙටි කලකින් ජනතා හදවත් ඇද බැඳගෙන ඇති බව දක්වන සමීක්ෂණ වාර්තාවක් අද ප්‍රදීපයේ මුල් පිටුවෙන් ගෙන එනු ලබයි. මෙය සත්‍යයකි. ශ්‍රී ලාංකේය කතෝලික සභාව නියෝජනය වන විවිධ පදවි හරහා පූජක - පැවිදි අංශ අතර කෙතරම් කතිකාවන් වසර ගණනාවක් පුරා ඇදී ගියද මෙවන් නාලිකාවක සාර්ථකත්වයක් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූ බව රහසක් නොවේ. පෙර පැවති රජයන් පවා මෙවන් සහනයක් කතෝලික සභාවට ලබා දෙන්නට කිසිදු සූදානමක් තිබූ බවක්ද නොපෙනිණි. අන්තර් පදවි අතර සාකච්ඡා වලදී පවා මූලික ගැටලුව බවට පත් කරගෙන තිබුනේ මූල්‍යමය පදනමයි.

නමුත් මිලන් ද සිල්වා නමැති ගිහි කතෝලික නායකයා පූර්ණ වශයෙන් දෙවිඳුන් වෙත පමණක්ම විශ්වාසය තබා තම අත රැඳුනු මුදල් සම්භාරය මුළුමනින්ම යොදවා විවිධ බාධක මධ්‍යයේ වුවත් සාර්ථක අන්දමින් මෙම සිහිනය යථාර්ථයක් බවට පත් කරමින් පසුගිය ජනවාරි 30 වන දින පියෝ ටී. වී. හා ඩයලොග් ටී. වී. සමාගම් සමග ගිවිසුමකට එළඹ මෙම වර්බුම් රූපවාහිනී නාලිකාව ආරම්භ කිරීම සැබෑ ලෙසින්ම ආශ්චර්යයකි. සිය වත්කම මෙයට යෙදවීම ගැන ඔහු දෙගිඩියාවක නිරත වූයේ නැත. උපයා ගත් සිය ධනය මෙයට යෙදවීමෙන් ඇති වන අවදානම ගැන ඔහු දෙවරක් සිතුවේ නැත. ඔහුගේ භාර්යාව හා සමග පෙරමුණ ගෙන මේ සමස්ත ව්‍යාපෘතියට ඔහු අතගැසුවේ දියඹටම ඔරුව දියත් කරන්නටයි. විශ්වාසය තුළ දෙවියන්ගේ වචනය ගැන පමණක්ම විශ්වාසය තබන්නටයි. දෙවිඳු වචනය ප්‍රියමනාප සේ දසුන් රස ගන්වමින්, මනස කුළුගන්වමින් අභ්‍යන්තරය විවෘත කරවමින් වර්බුම් නාලිකාව දියඹට දියත් කිරීම තුළ මේ කෙටි කාලය තුළදී නොසිතු විරූ අයුරින් ජනතා ආකර්ශණය සම්පූර්ණයෙන්ම ලබාගන්නට මෙම නාලිකාව සමත් වී ඇති බව සමීක්ෂණ වලින්ද තහවුරු කර ඇත.

බස්නාහිර පළාතේ සිට, දකුණ, වයඹ, මධ්‍යම, සබරගමුව, උතුරු මැද, නැගෙනහිර, උතුර ආදි සියලු දිසාවන් දිග් විජය කරමින් විශාල ජනතා ප්‍රතිචාරයක් මැද්දේ වර්බුම් රූපවාහිනී ආයතනය පෙන්වා ඇති අභිමානය සැබවින්ම ජයග්‍රහණයකි. මිලන් මහතා පවසන අන්දමින්ම එහි ජයග්‍රහණයත්, දියුණුවත්, මහිමයත් දෙවිඳුන්ම සතු වන්නේය. මෙය විශ්වාසයේ සැබෑ ආශිර්වාදාත්මක ගමනක් බව පුන පුනා පැවසිය යුතු නොවේ. කතෝලික ජන ජීවිතයේ සම්ප්‍රදාය කුළු ගන්වා ඉස්මතු කරමින් විවිධ දිශා කෝණයන් තුළ දෙවියන්ගේ වචනය සොයා යන්නට බාල, මහළු, තරුණ කොයි කා හටත් විවර කර ඇති මාර්ගය ඉතා පැහැදිලියි.

ලෝක පූජිත EWTN (Eternal Word Television Network) කතෝලික ජාලය හා අත්වැල් බැඳ ගනිමින් විශ්ව සභාව ගෘහස්ථ දෙව්මැඳුරක් සේ සියලු නිවෙස් ආලින්දයට කැඳවා ගෙන ඉස්මතු කිරීමට වර්බුම් ගන්නා ප්‍රයත්නය සැබවින්ම දැන් මල් ඵල දරා ඇත. වයස් ගත අප සහෝදර විශ්වාසිකයන්ට මෙය සැබෑම ඖෂධයක් බව ඔවුන්ගේ දුවා දරුවන්ගේ වචනයෙන්ම සපථ කර ඇත. ජපමාල උච්චාරණයෙන් දවස ආරම්භ කර අරුනළු පිබිදෙන මොහොතේ සැම දෙනාගේම මුවග තොල මත නමෝ මරිය පතිත කරවීම සිත් සතන් ප්‍රබෝධයෙන්ම දල්වා ඇත. බයිබලීය විමර්ශන, සුදුතුම් පිය චාරිකා, විශ්ව සභා පොදු ආකල්ප, සක්‍රමේන්තු අවබෝධය. දේව දයාවේ අනුහස් බව, කතෝලික මාධ්‍යවේදී භූමිකාව, සුව සහනයේ අත්දැකීම, දිව්‍ය පූජා සංග්‍රහය, පවුල් එකමුතුවේ වටිනාකම් ආදි මෙකී නොකී සියලු සම්ප්‍රදායේ විශ්වාසයේ ලකුණු තියුණු ලෙසින් සනිටුහන් කරන්නට කෙටි කලක් තුළ පෑ පෙළහර අපට කියා පාන්නේ අවංකත්වයේ ගිහි නායකත්වය දෙවිඳු ඇසට කෙතරම් ප්‍රසන්න වේද කියා නොවේද? එම නිසා ඉතාම කෙටි කලකින් මුළු ශ්‍රී ලංකාවේම ගෘහස්ත දෙව්මැඳුරු ආලින්දය සරසන්නට පොදු නාලිකා පහසුකම් අයිතිය වර්බුම් ආයතනයට හිමිවේවා යන්න අප

## හෘද සාක්ෂියට ඉඩදීම




ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 15 ඉරිදා

ප්‍රාර්ථනයයි. තනි ගිහි පුද්ගලයෙකුට මේ කර්තව්‍ය අධික මූල්‍යමය වියදමක් තුළ තනිව ගෙන යා හැකි කටයුත්තක්ද නොවන බව අපි අවබෝධ කර ගනිමු. එහෙයින් දානපතීන්ගේ නොමසුරු දායකත්වයත් මෙයට හිමි විය යුතුයි.

පදවි ක්‍රියාකාරීත්වයන් හටද එක්තරා අභියෝගයක් වෙමින් ගිහි නායකත්වයේ අත්‍යන්ත විශ්වාසය නිසා ගිහියෙකු අතින්ම ආරම්භ වී අද සභා උන්නතිය වෙනුවෙන්ම කැපවී තිබෙන මේ වර්බුම් නාලිකාව අදටත් වඩා හෙට දවසේ රැකිය යුතු බවද සියළු දෙනා හට අවධාරණය කිරීමටද කැමැත්තෙමු.

# පැවිදිවරු සහ පැවිදි වරියෝ ශු. සභාව තුළ කැපවූ පුද්ගලයෝ වෙති

**ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා විසින් 2015 වසර කැපවූ ජීවිතය වෙනුවෙන් වෙන්කර ඇති අතර කැපවූ ජීවිතය නමැති තිළිණය වෙනුවෙන් විශේෂාකාරයෙන් දෙවියන් වහන්සේට තුති ප්‍රශංසා කරමින් ශු. සභාව තුළ අප ලබා ඇති කැඳවීමෙහිලා අපවම අලුත් කර ගනු සඳහා ශ්‍රී ලාංකීක පැවිදි අපහට ආධාරයක් වනසේ කැපවූ ජීවිතය නමැති සංකල්පය පිළිබඳව මෙනෙහි කිරීමට මම කැමැත්තෙමි.**

### දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ අවධාරණය

ශු. සභාව දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් 'කැපවීම' පැවිදි ජීවිතයෙහි නියම පදනම බව ඉතා ප්‍රබලව පෙන්වා දෙයි. මෙවන් අවධාරණයක් මගින් මන්ත්‍රණ සභාව පැවිදිවරුන්ට සහ පැවිදිවරියන්ට ආරාධනා කරන්නේ දෙවියන්වහන්සේගෙන් ලබන ලද විශේෂ ආරාධනය නිර්මාණාත්මක විශ්වාසවන්තකමෙන්ද ශුද්ධවන්ත ජීවිතය සඳහා නිරන්තර වෙහෙසීමෙන්ද ජේසුතුමන්ට වඩා සමීප ලෙස අනුගමනය කිරීමෙන්ද ජීවත්වන්නටත් නිදහසින් සහ විවෘතබවින් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් හට පිළිතුරු දෙනු සඳහා අනවශ්‍ය ඇළුම්කමෙන්ද ලෞකිකත්වයෙන්ද මිදී දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ විශේෂ දූත මෙහෙවර සඳහා තමන් දානය කිරීමටත්ය.

කැපවීම යනුවෙන් අවධාරණය වන්නේ යම් පුද්ගලයකුගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ සියල්ල වසාගන්නාවූ ප්‍රේමාන්විත වැඩසිටීම සහ එම පුද්ගලයා දෙවියන්වහන්සේගේ කැඳවීමට දෙනු ලබන ප්‍රතිඋත්තරයයි. වේදහාර උච්චාරණය මගින් පුද්ගලයෙක් පාපය සහ ලෞකිකත්වය ප්‍රතික්ෂේප කරමින් (රෝම 6:11) දෙවියන් වහන්සේ වෙනුවෙන් පමණක් ජීවත්වීම සඳහා වන දේව කැඳවීමට පිළිතුරු දෙයි. වඩා පැහැදිලිව පවසන්නේ නම් කැපකිරීම සිදුකරන්නේ දෙවියන් වහන්සේමය. මක්නිසාද ශුද්ධවත් කරනු ලබන ශුද්ධවූ තැනැන්වහන්සේ දෙවියන්වහන්සේ වන හෙයිනි. දෙවියන්වහන්සේ සිය සර්වබලැති ප්‍රේමය මගින් ජේසුතුමා මෙලොව ජීවත්ව සිටියදී පෙන්වා දුන් ලෙසට ලෝකය තුළ දෙවියන් වහන්සේගේ වටිනාකම් සහ ධර්මගුණ වර්ධනය කරනු සඳහා තමන් මුළුමනින්ම දානය කළ හැකිවන පරිදි ශු. සභාව තුළ අවිවාහකව සිටින්නට සමහර පුද්ගලයින් මෙහෙයවන සේක. එසේ අවිවාහකව කැපවන පුද්ගලයින් සභාවේ පැවිදිවරුන් සහ පැවිදිවරියන් ලෙස හඳුන්වනු ලැබේ.

කැපවීම යන අදහස ප්‍රබලව ඉදිරිපත් කිරීම මගින් දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පැවිදිවරුන් සහ පැවිදිවරියන්ට ආරාධනා කර ඇත්තේ ශු. සභාවේ ජන වන්දනාව තුළ ප්‍රසිද්ධව සහ දෘශ්‍යමානව, නිදහසින් තමන් දෙවියන්වහන්සේට දෙන ලද පිළිතුරට විශ්වාසවන්ත වන්නටය.

### කැපකරන ලද තැනැන්වහන්සේ වන ජේසුස් වහන්සේ

ජේසුතුමා මුළුමනින්ම දෙවියන්වහන්සේට අයත්වූ අතර දෙවියන්වහන්සේගේ සැලැස්ම ඉටුවනු සඳහා තමන්වම පවරා දුන්සේක. ප්‍රැන්සිස් ජේ. මෙලෝනි (එස්. ඩී. බී) 'අනුගාමිකයින් සහ දිවැසිවරුන්' නමැති සිය ග්‍රන්ථයෙහි 113 වන පිටුවේ මෙසේ සඳහන් කරයි. 'ජේසුතුමා බඹසර බව වෙත යොමුකරන ලද්දේ උන්වහන්සේගේ ජීවිතය තුළවූ මහත් ප්‍රබල බලය මගිනි. විගස පැමිණිය යුතු දෙව්රාජ්‍යයෙහි පැවැත්ම, උන්වහන්සේ කෙතරම් ආකර්ෂණය කරගත්තේදයත් ඒ වෙනුවෙන් තමන්වම දානය කිරීම හැර අන් කිසිවක් කරන්නට උන්වහන්සේට නොහැකි වූයේය.' 'සමාන්තර චරිත වන ජේසුතුමා සහ පාවුළුතුමා' නමැති සිය ග්‍රන්ථයෙහි 60 වන පිටුවේ ජෙරොම් මර්ෆි ඔකොනර් සඳහන් කරන්නේ 'ජේසුතුමා හට විවාහවීමේ ණය යුක්තියක් පැවතියද උන්වහන්සේ එසේ නොකළ සේක (උත්. 1:20). මෙසේ කළේ බඹසර බව කෙරෙහිවූ ඇප කැපවීම නිසා නොව දෙවියන්වහන්සේගේ කැමැත්ත තමන් වෙත ඒමේදී සම්පූර්ණ නිදහසින් පිළිතුරුදීමට හැකිවන සේ සියලුම බැඳීම්වලින් නිදහස්ව සිටීමට එතුමාට අවශ්‍යවූ හෙයිනි.'

### ශ්‍රී ලංකාවේ වර්තමාන පැවිදිවරුන් සහ පැවිදිවරියන්

ශ්‍රී ලංකාවේ වර්තමාන පැවිදිවරුන් සහ පැවිදිවරියන්ව හට කැපවූ පුද්ගලයින් ලෙස ඉටුකළ යුතු දූත මෙහෙවරක් වෙයි.එ ය අභිරහස්‍යමය සහ දිවැසිවර දූත මෙහෙවරකි. එවන් දූත මෙහෙවරක් සඳහා ශුද්ධාත්මයාණන්ට විවෘතවද ශ්‍රී ලංකාවේ වර්තමාන පරිණාමික සන්දර්භය තුළ දෙවියන් වහන්සේ කැමති දේ තෝරාගනු සඳහාවූ අභ්‍යන්තර නිදහසකින් යුතුවද කෙරෙන පුද්ගලීක සහ සාංඝික යාච්ඤාවද තුළ සිදුවන නිරන්තර දේව කැමැත්ත විමර්ශනය අවශ්‍ය වෙයි. යාච්ඤාව තුළ දේව කැමැත්ත ලෙස විමර්ශනය කෙරෙන දේ ක්‍රියාවට නැංවීමද අවශ්‍යවෙයි. නියම වන්දනාව සහ යාච්ඤාව මගින් පැවිදිවරුන් සහ පැවිදිවරියන් ජනතාවගේ වේදනාවන්ට සහ අරගලවලටද අනතුරට පත්ව තුවාලවී සිටින පෘථිවියටද සංවේදී කළ යුතුය. පැවිදිවරුන්ගේ සහ පැවිදිවරියන්ගේ සත්‍යවාදී යාච්ඤා ජීවිතය නිසා කරදරයට පත්වූවන් සනසමින්ද අයහපත් ව්‍යුහයන් සහ ආයතන නිත්‍යානුකූල කරමින්ද ඒවා වැදගත්කොට සලකමින්ද සුව පහසුවෙන් ජීවත්වන්නන් අසහනයට පත්කරමින් තම ජීවිත අවස්ථා තුළ දිවැසිවරුන් බවට පත්වෙති. පැවිදිවරුන් සහ පැවිදිවරියන් තමන් යාච්ඤාවේ නිරතවන දිවැසිවරුන් බව ප්‍රකාශ කළද යථාර්ථය නම් සමහරෙක් සාවද්‍ය වටිනාකම්, ව්‍යුහයන් හෝ යල් පනින ලද අධ්‍යාත්මිකත්වයන් මත රැඳෙමින්ද සම්ප්‍රදායන් සහ චාරිත්‍රවලට යට වෙමින්ද පසුබට වීමයි.

### ශුද්ධොත්තම පියතුමාට අනුව විසඳිය යුතු වැදගත් කරුනු දෙකක්

ජනවාරි 19 වන දින ශුද්ධොත්තම පියතුමා මැනිලා නුවර සිට රෝමයට යන අතර තුර ගුවන්යානයෙහිදී වාර්තා කරුවකු විසින් ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව විමසන ලද පැනයට පිළිතුරු දෙන ලද්දේ ප්‍රධාන කරුණු දෙකක් එනම් දිළිඳුකම සහ කුල ක්‍රමය ආශ්‍රයෙනි. එතුමාගේ පිළිතුර මෙසේවිය. 'දිළිඳුන් ඉවතට විසිකරනු ලැබීමේ සංස්කෘතියෙහි ගොදුරු වේ. අපි පුද්ගලයින් ඉවතට දමමු. වෙනස්කම් කිරීම ඉවත දැමීමේ එක් ක්‍රමයකි. මෙම ජනතාව අත්හැර දමා ඇත. කුල ක්‍රමයේ ස්වරූපයද මා සිතට නැඟෙයි. මෙය තවදුරටත් ගෙනයාමට නොහැකිය. නමුත් අද පුද්ගලයින් ඉවත දැමීම සාමාන්‍ය දෙයක් බවට පත්වී තිබෙනු පෙනේ.'

ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා විසින් වර්තමාන ශ්‍රී ලංකාවේ පැවිදිවරුන්ට සහ පැවිදිවරියන්ට ආරාධනා කරනු ලබන්නේ දිළිඳුන්ටද ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශයන්හී යම් කණ්ඩායම් විසින් නිත්‍යානුකූල කර වැදගත් කමක්දී ඇති කුල ක්‍රමය නිසා පීඩාවට පත්වූවන්ටද තමන් සමාන උදාරත්වයකින් හෙබි පුද්ගලයින්ය යන්න හැඟෙන්නට සලස්වන ලෙසයි. එමගින් සභාව මෙන්ම සමාජය තුළද පවතින අසමානත්වය සහ ඇතුළත්කර නොගැනීම හැකිතාක් දුරට නවතාලන ලෙසයි. තේවතුවල, මුඩුක්කුවල, ධීවරයින්, සංක්‍රමණික කම්කරුවන් ගොවීන්, රැකියා නොමැතිවූවන්, ඉඩම් අහිමිව සිටින්නන් සහ හිසට සෙවනක් නොමැතිවූවන් අතරෙහි දිළිඳුන් සොයාගත හැකිය.

පැවිදිවරුන් සහ පැවිදිරියන් වන අප පුද්ගලයින්, කණ්ඩායම් සහ සංඝයන් ලෙස දිළිඳුන් සංවර්ධනය කරනු සඳහා ඔවුන් වෙතට ලඟාවන්නෙමුද? මානුෂීකත්වයට වඩා පහල මට්ටමකින් වඩා උසස් මානුෂිකත්වයක් වෙත ඔවුන් මෙහෙයවනු සඳහාවූ ක්‍රමෝපාය සහ ශිල්ප ක්‍රම අප සතුවේද? දිළිඳුන් සහ කුල ක්‍රමයේ ගොදුරු බවට පත්වූවන් හා අනන්‍යවන සමහරකු සිටියත් සම්ප්‍රදායන්, චාරිත්‍ර සහ පවුල් පසුබිම නමැති බැම්වලට හසුවූවන්ද සිටිති. 'දිවැසිවරුන් ලෙස ඔබගේ සමාජය නැගිටුවන්න' යනුවෙන් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා ශ්‍රී ලංකාවේ පැවිදිවරුනට සහ පැවිදි වරියනට පවසන බව මට හැඟී යයි. දිවසිවරු දෙවියන්වහන්සේගේ නාමයෙන් කථා කරති. මෙම ආරාධනය. සියල්ලන්ටම තමන් වටිනා බව සහ ගරුත්වයෙන් සලකනු ලබන බව හැඟෙන්නාවූ අර්ථාන්විත සහ ආශාවෙන් බලා සිටින්නාවූ වෙනසක් ශ්‍රී ලංකාව තුළ ඇතිකරනු සඳහාවූ ශුද්ධොත්තම පියාණන් විසින් කරනු ලබන ආරාධනයකි.

**ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු නි.ම.නි පියතුමා**



ඥානාර්ථ ප්‍රදීපය

# අගරදගුරු වසමේ මීසම් මට්ටමින් පවුල් කමිටු ළගදීම අරඹනවා!

## කාදිනල් හිමිපාණෝ අනාවරණය කරති

"විවාහය යන පවුල් දිවිය දෙවියන් වහන්සේ අපට ලබාදුන්නේ ශුද්ධවත් ජීවිතයක් ගත කිරීමටයි. එය හුදෙක් අන් අයට ආදර්ශයකි. පවුල තුළ එකමුතුකම වර්ධනය කරමින්, ආදරය තුළ දරුවන් බිහිකරමින් දෙවිඳුන් වෙනුවෙන් සාක්ෂි දරණ පවුලක් වන්නටය. එනම් පවුල් දිවිය ශුද්ධ වූ සක්‍රමේන්තුවයි. එය ශු. සභාව තුළ කේන්ද්‍රස්ථානයක් ලෙස හඳුන්වා දීමට පුළුවනි. පවුල් වීමට බලාපොරොත්තු වන යුවළවලට මීසමේ පියතුමා මගින් විශේෂ දැනුම්වත් කිරීම හා මඟ පෙන්වීමක් තුළ පවුල ගොඩනගා ගැනීමට රුකුලක් වන බවත් ඉදිරි කාලය තුළ මීසම් මට්ටමින් පවුල් සේවා කමිටු ආරම්භ කරමින් දෙදරා නොයන කතෝලික පවුල් බිහිකිරීමට සැලසුම් කරන බවත්" කොළඹ සාන්ත ජෝසප් වාස් දේවධර්ම නිකේතනයේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය දිනයේදී කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කළහ.

මෙම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය දිනයේ තේමාව වූයේ 'පවුල් වසරේ උත්තරීතර දැක්ම හා කිතුනු පවුලේ කාලීන වගකීම්ය.' මෙම දිනය විශේෂයෙන් පවුල් වසර මුල්කර ගනිමින් සිදුකළ අතර දේවධර්ම නිකේතනයේ අදියුරු ගරු දයා වැලිකඩආරච්චි පියතුමාගේ මඟපෙන්වීම මත නිකේතනයේ කාර්ය මණ්ඩලය ඇතුලු සිසු සිසුවියන් විසින් සංවිධානය කරන ලදි.

**අසික ප්‍රියදර්ශන**



කොළඹ අගරදගුරු පදවි ශාන්ත වින්සෙන්තිද පාවුළු සංගමයේ මධ්‍යම මණ්ඩල චතාරික පාදනමස්කාරය හා ධර්ම විවේකය මෙවර තේවත්ත පුදබිමේදී ගරු සුමේධ දිසානායක හා ගරු එමසි ප්‍රියාන්ත පියතුමන්ලාගේ මෙහෙයවීමෙන් පවත්වන ලදි. මධ්‍යම මණ්ඩල ආත්මික අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස්, බෝලවලාන දිසා අධ්‍යක්ෂ ගරු තිළිණ සමිත් සොයිසා පියතුමන්ද සහභාගි වූ අතර මධ්‍යම මණ්ඩල සභාපතිනිය ඇතුළු සියලුම දිසා කොන්ෆරන්ස සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් ද සහභාගි වූහ.

**ඇනක්ලීටස් සිල්වා**

## මීසමෙන් මීසමට

අපේ මීසමේ වගතුග

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 15 ඉරිදා

## පොලොන්නරුව විජයබාහුපුර එළිමහන් පාදනමස්කාරය

පොලොන්නරුව පළුගස්දමන මීසමේ එළිමහන් පාදනමස්කාරය ප්‍රථමවතාවට විජයබාහුපුර ශාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ දේවස්ථානයේදී පසුගියදා පැවැත්විය.

මේ පාදනමස්කාරය සඳහා පළුගස්දමන, පුලස්තිගම, විජයබාහුපුර යන ප්‍රදේශයන් හී ජනතාව පැමිණ සිටි අතර මීසම් සේවක ගරු බෙනට් මෙල්ලව පියතුමාගේ ප්‍රධානත්වයෙන් පාදනමස්කාරයෙන් පසු දේව මෙහෙය සිදුකෙරිනි.

මේ පාදනමස්කාරය විජයබාහුපුර තරුණ කවය සංවිධානය කර තිබූ අතර දේව මෙහෙය අවසානයේ තරුණ කව පැමිණ සිටි ජනතාවට තේපැන් සංග්‍රහයක්ද ලබාදුනි.

**බී. රංජිත් මැන්ඩිස්**

## දළුපත විසෙන්තියාන ආධාර

දළුපත විසෙන්තියාන සංගමයේ ශුද්ධ වූ අන්තෝනි කොන්ෆරන්සය මගින් වාර්ෂික ආහාර පාර්සල් බෙදා දෙනු ලැබීය. දළුපත සිද්ධස්ථාන පාලක ගරු ජූඩ් ලක්ෂමන් පියතුමාගේ නොමද අනුග්‍රහය හා අධීක්ෂණය යටතේ මෙය සිදුකැරිණ.

මීසමේ හා අවට දිළිඳු පවුල් තෝරා ඒ අය නොදැනුවත්ව නිවසට ගොස් වියලි ආහාර පාර්සල් ලබාදීම මෙවර විශේෂත්වය විය. මෙයට සමගාමීව එකී කොන්ෆරන්සිය මගින් දිළිඳු ශිෂ්‍යයන් පිරිසකට පාවහන් යුගල බැගින්ද බෙදා දෙන ලදී.

**කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි**

## සඳවට රන්තරු අද වාද්දුවේදී



කිතුනු කලාකරුවකු වන, වාද්දුව සුසිත කලායතනයේ අනුශාසක සනී. එස්. ප්‍රනාන්දු මහතාගේ 'සඳවට රන්තරු' ගී ප්‍රසංගය 2015 මාර්තු 15 දින (අද) ප.ව. 6.00 ට වාද්දුව විජය කුමාරතුංග රඟහලේදී පැවැත්වේ.

මෙහි නර්තනාංගයන් ඉදිරිපත් කරනුයේ සනි මහතාගේ දියණියක වන නර්තන ආචාරිනි සුසිතා සුරංගි විසිනි. සංගීතය ක්ලැයිස් බෝයිස් වාදක වෘන්තයෙනි.

**කුමර**



නාත්තන්ඩිය නව සහයක ගරු සුජාන් නිශ්ශංක පියතුමා මීසම් සේවක ගරු උපාලි චර්චිල් පියතුමන් සමග මීසම් ජනතාව විසින් පිළිගන්නා ලද අවස්ථාව.

**ශ්‍රියාංගනි පිලිෂියා**

## පන්නිපිටිය විසෙන්ති පාවුලා සාමාජිකයින්ගේ සේවා දැක්මක්

කෝට්ටේ දිසාවට අයත් පන්නිපිටිය ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරට සම්බන්ධව ක්‍රියාත්මක වන විසෙන්ති පාවුලා සංගමය වසර 40 ක සේවා කාලයක් සම්පූර්ණ කරයි. ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමාගේ මීසම් සේවා කාලයේ ඇරඹුණ මෙම සංගමය ගෙවී ගිය කාලය තුළදී දිළිඳු පවුල් නැංවීමේ සේවාවන් රැසක් ක්‍රියාත්මක කොට තිබේ.



පසුගියදා මෙම සංගමයට විශේෂ අවස්ථාවක් උදාවිය. ඒ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික සාමාජිකාවන් තිදෙනෙකු සිය සේවාවේ රජත ජයන්තිය සැමරීමයි. වරින්වර සංගමයේ නිලතල දැරූ රංජිත් මුහන්දිරම්ගේ ලෝනා පෙරේරා සහ මාලා මුහන්දිරම්ගේ මෙම 25 වසරක සේවා කාලය සම්පූර්ණ කළ තිදෙනාය. කෝට්ටේ දිසාවේ විසෙන්ති පාවුලා සංගමයට මොව්හු හැම විටම පූර්ණ දායකත්වයක් ලබා දෙති.

සේවා රජත ජයන්තිය සමරන ජ්‍යෙෂ්ඨ විසෙන්ති පාවුලා සාමාජික සාමාජිකාවන් තිදෙනා මීසම් සේවක ගරු ටිරෝන් පෙරේරා සහ සහයක ගරු තුසිත සෝලංග ආරච්චි පියවරුන් සමග ඡායාරූපයේ වෙති.

**ක්‍රිස්ටෝපර් රණසිංහ**



වෙන්නප්පුව දෙවන ජුවාම් පාවුළු අධ්‍යාපන ආයතනයේ (ප්‍රාථමික) සංගීත අංශය පසුගියදා හලාවත රදගුරු අති උතුම් දෙවිශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් අතින් විවෘත විය. දෙවන ජුවාම් පාවුළු අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ගරු නෙවිල් කූඤ්ඤ පියතුමා ද සංගීත භාණ්ඩ ප්‍රදානය කළ ග්වේන් හේරත් මහත්මිය ද මීට එක්වූහත

**සේයා - ගොඩ්ප්‍රි අබේසේකර ; සටහන - ප්‍රියන්ත පීටර්ස්**

## වින්සෙන්තියාන චතාරික වැඩමුළුවක්

කළුතර ශු. වින්සෙන්තිද පාවුලා දිසා සභාවට අයත් සියලුම කොන්ෆරන්සිවල සහභාගිත්වය ඇතිව සංවිධානය කරන ලද චතාරික වැඩමුළුවක් පසුගියදා බණ්ඩාරගම 'ප්‍රොවිඩන්ස්' සෙත්සරණ මධ්‍යස්ථානයේ දී පැවැත්විණ.

දවස පුරා පැවති මෙම වැඩමුළුව දිසා ආත්මික අධ්‍යක්ෂ ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමන් විසින් මෙහෙයවන ලද අතර කළුතර දිසා සභා නායකත්වය විසින් සංවිධානය කර තිබුණි.

**රංජිත් නෝනිස්**

## බදුල්ල මීසමේ සදසරණ නුවානය ඇරැඹේ

බදුල්ල ශා. මරියා ආසන දෙව්මැඳුරේ හිටපු මීසම් සේවක ගරු ප්‍රියලාල් කුරේ පියතුමා දෙව්මව්ට ජනතාව සමීප කිරීමට කටයුතු කරමින් සදාසරණ මාතා භක්තිය ගැන ජනතාව දැනුම්වත් කළේය. වර්තමාන මීසම් සේවක ගරු ජූඩ් නිශාන්ත සිල්වා පියතුමා සිංහල භාෂාවෙන් මේ නුවානය ආරම්භ කිරිමට කටයුතු කිරීම ගැන කතෝලිකයෝ ඉමහත් සතුටට පත්වූහ.

සදාසරණ මාතා සේයාරුව ඉදිරිපිට ආරම්භක නුවානය අතිග රු මාර්ෂල් රාජනායගම් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර සැම මාසයක අවසන් බදාදා දින දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවද පුරා පැයක් පැවැත්වේ.

සැම මාසයක සෙනසුරාදා දිනවල මළවුන් වෙනුවෙන් දේව මෙහෙයන් බදුල්ල පොදු සුසාන භූමියේ පැවැත්වීමට කටයුතු කරගෙන යන අතර වැඩිහිටි ධර්මෝපදේශය පහදා දීමට විශේෂ වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**

## 'බරබ්බාස්' මග්ගොනදී වේදිකා ගතවේ

මග්ගොන මීසමේ කිතුනු කැළ සංවිධානය මගින් ඉදිරිපත් කරන 'බරබ්බාස්' පාස්කු නාට්‍ය මාර්තු 28, 29 යන දෙදින පස්වරු 6 ට මග්ගොන ගරු මර්සලින් ජයකොඩි පිය සමරු ශාලාවේදී වේදිකා ගතවේ.

නාට්‍ය ශිල්පි ජෝසප් ඒ ඩයස් මහතාගේ රචනයෙන් හා නිෂ්පාදනයෙන්ද, සී. අමිත මහතාගේ සංගීතයෙන්ද ඔප් නැංවෙන මෙම පාස්කු නාට්‍යය මීසම් සේවක ගරු ඉෂාන් ප්‍රමීන පියතුමන්ගේ අනුශාසකත්වයෙන් සංවිධාන වූවකි.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



හලාවත පදවියට අයත් දුම්මලකොටුව මීසමේ ඇටියාවල ජයලත් දේවමාතා දෙව් මැඳුරේ අභිනවයෙන් ඉදි කළ මණ්ඩපය පසුගියදා මීසම් පාලනාධිපති ගරු ජූලියන් හයිසින්ත් ප්‍රනාන්දු පියතුමාගේ සුරතින් ආශිර්වාදකර දේව ගෞරවය සඳහා දේව ජනතාව වෙත පිරිනමන ලදි. ප්‍රදේශයේ වෙසෙන කිතුනු බොදුනු ජනතාවගේ පූර්ණ අනුග්‍රහය යටතේ මෙම අලංකාර මණ්ඩපය ඉදිවුණි. එදින මංගල ගායනා පූජාව ගරු ක්‍රිෂාන්ත පියතුමා හා ගරු ජූලියන් හයිසින්ත් ප්‍රනාන්දු පියතුමා විසින් අභිනවයෙන් ඉදි කළ මණ්ඩපය මත ඔප්පුකරන ලදි.

**නිසංසලා පෙරේරා**

# චතාරිකය තුළින් නව ජීවිතයකට

"දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය; පසුතැවී සිත් හරවා ගන්න; සුබ අස්න අදහා ගන්න" (ශු. මාක් 1:15)



ජනවන්දනා වසර තුළ මේ ආරම්භ වූයේ චතාරික සමයයි. චතාරික සමය යනු දේව ජනතාව සුභාරංචියේ හදවත ලෙස හැඳින්වෙන "ක්‍රිස්තුස් වහන්සේගේ පාස්කු අභිරහස" එනම් උන්වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය සිහිපත් කරනු ලබන සමයයි. එහෙත් දෙවිඳුන් අපෙන් බලාපොරොත්තු වනුයේ හුදෙක් එය සිහිපත් කිරීම පමණක් නොව ක්‍රියාවට නැංවීමයි.

"වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න" (ජොවෙල් 2:13)

ශුද්ධ ලියැවිල්ල තුළින් ජොවෙල් දිවැස්ප්‍රසාදිවරයා අපට එසේ ප්‍රකාශ කරයි.අප අලංකාර ඇඳුමෙන් පැළඳුමෙන් සැරසී දේව මන්දිරය වෙත පිය නැගුවද, සමිඳාණන් වහන්සේට වැදගත් වනුයේ ඇඳුම, පැළඳුම නොව අපගේ සිතය. මේ චතාරික සමයේ දින හතලිහ තුළ සැබෑ මනස්ථාපනයක් තුළින් උන්වහන්සේ වෙත හැරී ඒම අපගේ වගකීමයි.

බොහෝ විට අප ආගම අදහනුයේ මතු පිටින් නොවේ ද? සියලු වත් පිළිවෙත් ඉටු කළ ද අපගේ දුබල මනුෂ්‍ය සිත් තුළ පැළ පදියම් වී ඇති පාපී සිතිවිලි සිඳ බිඳ දමා යහපත් සිත් මාරුවකට අවතීරණ වීම චතාරිකයේ ඉතා වැදගත් ය. මේ සඳහා සැබෑ මනස්ථාපනයක් (මනස ස්ථාපනය) අවශ්‍යය. එදා ගොල් ගොතා කඳු මුදුනේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපගේ පාප වෙනුවෙන් පරිත්‍යාගි වූ සේ අපට ද අන් අය වෙනුවෙන් පරිත්‍යාගී වීමට උන්වහන්සේ ආරාධනා කරයි.

එනම් ශු. පාවුළු තුමා පැවසූ පරිදි ලුණු මෙන් අන් අය වෙනුවෙන් වැය වීමට පහනක් මෙන් ලෝකයට ආලෝකය විහිදුවීමට අපගේ ජීවිත තුළින් ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරීමට අප සූදානම් විය යුතුය. අපගේ ජීවිත කුරුසිය දරාගෙන බාධක, දුක් කම්කටොළු යන කඳු තරණය කරමින් විශ්වාසයේ කඳු මුදුන වෙත ළඟා විය යුතුය.

මේ චතාරික සමයේ ආත්මික හා ශාරීරික පුණ්‍ය ක්‍රියා සිදු කරමින් ද, යාච්ඤාවෙන් ද, අපගේ ආධ්‍යාත්මය ශක්තිමත් කර ගත යුතුය.

බොහෝ විට අප යහපත් දේ කරන්නේ නරකාදියට යතැයි බියෙනි. එය දුබල මිනිස් ස්වභාවය තුළ සාධාරණය. එහෙත් අපි පුණ්‍ය ක්‍රියා කළ යුත්තේ එවැනි බියකින් නොව සැබෑ දේව ප්‍රේමය අත් දකිමින් යහපත් හෘද සාක්ෂියේ හඬ ශබ්දයට අනුවය.

දේවස්ථානයේ වැඩ කටයුතු කළ යුත්තේ නම්බු නාම, නිලතල, තනතුරු අපේක්ෂාවෙන් හෝ අන් අයගේ ස්තුති ප්‍රශංසා ලබමින් කැපී පෙනීමට නොව අවංක හදවතකින් දෙවි පියාණන් වහන්සේව මහිමයට පැමිණවීම පිණිසය. අප තුළ නොදැනුවත්වම හෝ මිනිස් මට්ටමින් එවැනි දුබල සිතිවිලි ඇත්නම් මේ චතාරිකයේ සැබෑ සිත් මාරුවක් අත්දකිමු.

චතාරිකයේ අරමුණ සිත් හැරීමයි. එ නිසා අප තුළ ගොඩනැගී ඇති පාපි බැමි වලින් මිදී මේ චතාරිකයේදී නව ජීවිතයකට එතෙර වෙමු.

✍ ලූෂන් එඩ්වඩ් පෙරේරා
ගෝනවල

## කුරුසයෙන් ලද ගැලවීම

දෙදහස් වසරකට පෙර දෙවි සමිඳු එදා
කල්වාරි කඳු මුදුනෙ දිවි දුනි දුක පහදා
විඳි වේදනාවෙන් තනිකම හදෙහි රඳා
ඔබ ගිය මඟෙනි අප ගැලවුම ලැබුවෙ එදා

දුකට පත් අයට පිළිසරණය වෙන්න
වත නැති අය වෙතට නෙත් සිත් හරවන්න
අනුන් හොඳ නමට නිසි ගෞරව දෙන්න
සමිඳුන් දෙසූ එවදන් සිහියට ගන්න

දුහුවිල්ලෙන් සෑදුන නුඹ යළි පස් වෙනවා
දුක් වේදනාවන් දවසක සුව වෙනවා
ඇති වුන සියල්ලම දවසක නැති වෙනවා
කුරුසිය තුළින් ගැලවුම සැම වෙත එනවා

වත ඉරාගෙන නොව සිත ඉරා ගෙන
ම වෙත එන්න කමා ලැබෙතැයි අදහා ගෙන
නැති බැරි අය සමඟ ඇති දෙය බෙදා ගෙන
සිටිනට දිරිය අයදිමු දින උදා වෙන

සැමට එක ලෙසින් කරුණා සිත පාමින්
සමිඳුන් පෙන් වූ මග අනුගමනය කරමින්
දහමට නතුව දැහැමිව මතු දිවි ගෙවමින්
කුරුසිය කරට ගෙන සමිඳුන් යදිමු බැතින්

✍ ඇම්. ඕ. මේරි මාග්‍රට්
බණ්ඩිරිප්පුව

## චතාරිකය ප්‍රසාදජනක හා වරප්‍රසාදයේ කාලයක් කරගන්නට...!

චතාරිකය වරප්‍රසාදයේ කාල වකවානුවක් ලෙස හැඳින්වෙයි. අපේ ජීවිතය දෙස හැරී බලා, ආත්ම සෝදිසියක යෙදී, ජීවිතයේ අඳුරු තැන් දුරු කර ගැනීමෙන් එකී වරප්‍රසාද අපට අත් කර ගත හැකිය.

සැම වසරකම අප වෙත පැමිණෙන චතාරිකය "ආශිර්වාදය"ක් බවට හරවා ගැනීමට අප උත්සාහ කළ යුතුය. අපේ පාපී ජීවිතය දෙස හැරී බැලීමට අප කරා එන චතාරිකය, අපේ ජීවිත පැවැත්මේ වැරදි තැන් නිවැරදි කර ගැනීමට මර්ධන ක්‍රියාවල නියැලීමට ඉතාම සුදුසු කාල පරිච්ඡේදයකි. මිනිසා වරදට පෙළඹෙන සුළු බව අප දෙවි පියාණෝ දන්නා සේක. එහෙයින් වරද තේරුම් ගෙන ආපසු හැරී එන පව්කරුවා වැළඳ ගැනීමට නිතරම සූදානම් බව ශු. ලියවිලි මඟින් අපට මනාව පැහැදිලි කර දෙයි. "කරුණාවන්ත පියාණන්" නොහොත් "අකීකරු පුත්‍රයා පිළිබඳ උපමා කතාව ඊට මා හැඟි උපමා කතාවකි.

චතාරිකය සමාව දීමේත්, සමාව ගැනීමේත් කාලයක් කරගැනීමට අප උත්සුක විය යුතුය. අප අතින් අන්‍යයන්ට වැරදි සිදුවන බව සත්‍යයකි. අන්‍යයන්ගෙන් අපට වැරදි සිදුවන බව ද සත්‍යයකි. මේ චතාරිකයේ දී අපට වැරදි කරන අයගේ වැරදි අමතක කර අපි ඔවුන්ට සමාව දෙමු. එසේ ම අප අතින් ද අන්‍යයන්ට වන වැරදි වලට සමාව යදිමු. ප්‍රේමයේ පවතින්නට අපෙන් ඉල්ලන ස්වාමින් වහන්සේ සාමය, සංහිඳියාව ඇතිව ජීවත් වන්නට අපට සහය වන සේක. චතාරිකයේ මෙවන් අරමුණු සාක්ෂාත් කර ගන්නට අපි ප්‍රයත්න දරමු.

වරප්‍රසාදයේ හා ප්‍රසාද ජනක කාලයක් ලෙස චතාරිකය ගත කිරීමට අපට හැකි වන්නේ එවිටය. අපේ ජීවිත ලස්සන කර ගැනීමට අප චතාරිකයේ උත්සාහ කරන තරමට අපට බහුලව වරප්‍රසාද ලැබෙනු නොඅනුමානයි. පවුල නමැති සමාජයේ කුඩාම ඒකකයේ සාමාජික - සාමාජිකාවන් වන අපි, යම් හෙයකින් පවුලේ යාච්ඤාවේ ජීවිතය අඩාල වී ඇත්නම් එය සරු ගන්වා ගැනීමට වෙර දරමු. රූපවාහිනිය ඊට බාධාවක් වී ඇත්නම් අඩ පැයක් එයින් මිදී යාච්ඤාවට කාලය යොදා ගැනීම ඉතා අනගි මර්ධන ක්‍රියාවකි.

"පවුල් හා පැවිදි වර්ෂයේ" එළඹී ඇති මෙම චතාරිකය වඩාත් සරු ගන්වා ගැනීමට මනස්ථාපනයෙන් යුතුව ගත කරමු. මේ කාලය ඇතුළත අපෙන් නිතර සිදුවන කිසියම් වරදකින් මිදීමට අවශ්‍ය ශක්තිය පතා දෙවිඳු යදිමු. වෙර දරමු. මේ සැම තුළින් චතාරිකය වරප්‍රසාදයේ හා ප්‍රසාදජනක කාලයක් බවට පත් කර ගනිමු. ජේසු සමිඳාණෝ ඊට අපට සහය වන සේක.

✍ සී. ආර්. ඩික්සන් ඇන්ටනි
පේරලන්ද

## දේව වචනයෙන් හික්මීම්

### ධර්ම සංග්‍රහය

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 15 ඉරිදා

## සමිඳුනි....



අඳුර බිඳ
ආලෝකය ලබා දුන්
කුරුසිය කරට ගත් සමිඳුනී...

ගොල්ගොතා වැටි වැටී
ලේ ධාරා මුහුව
ජයග්‍රහණය කරා පියනැගුව
සමිඳුනි...

සතුරාට ප්‍රේම කළ
අවසන් ලේ බිඳුව
අප නිසා හෙලූ
ඔබ සිහිකරන
චතාරික සමයයි මේ...

✍ ටයිටස් සපරමාදු
බෝපිටිය

# නපුරු බලය බිඳ දමනා ආයුධය "උපවාසය"යි

කඩු අමෝරාගෙන තම හමුදාවට විරුද්ධව යුද්ධයකට පැමිණෙන සතුරු හමුදාවකට මුහුණ දීමට සෙබළකු තමන් සතු තියුණු කඩුව පසෙකලා ගෙදර පාන් කපන පිහිය රැගෙන යාවිද? එසේ වුවහොත් අපි එම සෙබලාව මෝඩයකු ලෙස හෝ නිවටයකු ලෙස හඳුන්වමු.

ඔබ මම අප ජීවිතය තුළ මෙවැනිම අවස්ථාවන්ට ඉහත සඳහන් කළ සෙබලා සේ මුහුණ දෙනවා නොවේ ද? අප ආත්මික ජීවිතය විනාශ කිරීමට පැමිණෙන සාතන් ප්‍රමුඛ යක්ෂ සේනාවට මුහුණ දීමට ඉතාමත් බලගතු අවි ආයුධ වන යාච්ඤාව, උපවාසය, මර්දන ක්‍රියා හා දේව වචනය නොමැතිව උත්සහ කරනවා නොවේ ද? එහෙයින් බලන කල අපත් ආත්මික මෝඩයන් නොවේ ද2 මෙම වරප්‍රසාදීය කාලය තුළ ඉහත සඳහන් කළ අධිබලැති ආත්මික ආයුධ අතරින් "උපවාසය" නැමති මිසයිලය පිළිබඳව ඔබත් සමඟ අදහස් බෙදා ගැනීමට මම කැමැත්තෙමි.

ශු. බයිබලය පුරාවටම උපවාසයේ වැදගත්කම දැක්වෙන දේව වාක්‍ය පාඨයන් අඩංගුය. පුරාණ ගිවිසුම තුළ ඊශ්‍රායෙල් ජනතාව ජාතියක් වශයෙන් මෙන්ම පුද්ගලිකවත් උපවාසයේ යෙදී දේව වරප්‍රසාද ළඟා කරගත් ආකාරය අවස්ථා කිහිපයකදීම අපට දැකිය හැකිය. දෙවියන් වහන්සේම ඊශ්‍රායෙල් ජනතාවට උපවාසයේ යෙදීමට නියෝග කරන අයුරු ලෙවී ව්‍යවස්ථාවේ (6:29) පෙන්නුම් කරයි. "පහත දැක්වෙන නියෝගය නුඹලා කෙරෙහි සදහටම වලංගු වේ. එනම් හත්වන මාසයේ දසවන දින ඊශ්‍රායෙල් ජනයා වන නුඹලා ද නුඹලා අතර වසන විදේශීන් ද උපවාසයෙහි යෙදෙමින් බර වැඩ කිරීමෙන් වැළකිය යුතුය." මෝසෙස් තුමා දස පනත ලබා ගැනීමට සීනයි කන්දට නැග දින 40 බැගින් දෙවතාවක්ම උපවාසයේ යෙදුනේ ය. (ද්විතිය 9:9-18) එම නිසා දෙවිඳාණන් සමඟ මුහුණට මුහුණලා කතා කිරීමේ වරම ඔහුට ලැබිණි. එලෙසම දාවිත් රජතුමා ද තම ජීවිතයේ විශේෂ අවස්ථා හතරක දී පමණ නිරාහාරශීලයේ යෙදුනු අයුරු ශු. බයිබලයේ සඳහන් වේ. නෙහෙමියා ජෙරුසලම් නගරයේ පවුර ගොඩනැගීමට විදෙස් රජතුමකුගේ වරප්‍රසාදය ලබා ගැනීමට උපවාසයේ යෙදුනු අයුරුත්, පවුර ඉදිකිරීම අතර මඟදී සන්බලම්ගේ විරෝධය හා අනෙකුත් බාධා කිරීම් වලට උපවාසය තුළින් පිළිතුරු දුන් අයුරුත් ශු. බයිබලයේ නෙහෙමියා නමැති පොතේ විස්තර කර දෙයි. ජෝෂුවා, එස්තර්, එලියා, එස්රා හා දානියෙල් තම උපවාසය මඟින් දේව කරුණාව ලබා ගත් අයුරු ශු. බයිබලයේ මනාව පෙන්නුම් කරයි.

නව ගිවිසුම තුළ ජේසුස් වහන්සේ ද නිවැරදි උපවාසය පිළිබඳ ඉගැන් වූ අයුරු පැහැදිලිව පෙන්වා දෙයි. "එහෙත් ඔබ උපවාස කරන කල හිස තෙල් ගල්වා මුහුණ සෝදා ගන්න...." (මතෙව් 6:16-18).

ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනයෙහි උපවාසය, දන්දීම හා යාච්ඤාව පිළිබඳව සඳහන් කරන සේක. උන්වහන්සේගේ ඉහත ඉගැන්වීම තුළ ඔබ උපවාස "කරනවා නම්" යැයි නොකියා "කරන කල" යැයි සඳහන් කිරීම තුළ තම ගෝලයන් උපවාස කරනු ඇතැයි බලාපොරොත්තු වූ බව පැහැදිලි වේ. පරිසිවරුන් උපවාසය පිළිබඳ ඇසූ පැනයට ලබා දුන් උත්තරය තුළින් එය මනාව පැහැදිලි වෙයි. "එහෙත් මනාලයා ඔවුන් කෙරෙන් වෙන් කරනු ලබන දවස එයි. ඒ දවසේ දී ඔවුන් උපවාස කරනු ඇතැයි වදාළ සේක." (ලූක් 5:35).

මුල් කිතුනු සභාව යාච්ඤාවෙන් සහ උපවාසයෙන් ශුද්ධාත්මා ගමනය එන තුරු සිටි අයුරු අප හොඳාකාරවම දන්නා කරුණකි. ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ පසුත් ඔවුන් උපවාසයේ යෙදෙමින් දේව රාජ්‍යය පතල කළ ආකාරය (ක්‍රියා 13:2-3) පෙන්නුම් කරයි. විශේෂ අවස්ථාවන්හිදී ශුද්ධාත්ම මඟ පෙන්වීම අයදිමින් උපවාසයෙන් හා යාච්ඤාව තුළින් සංඝයක් ලෙස ශුද්ධාත්මයාණන්ට ආයාචනා කරනු ලැබීම මුල් කිතුනු සභාවන්හි මූලික ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය. (ක්‍රියා 14:23)

පසුකාලීනව ශු. සභා මාතාව විසින් ප්‍රකාශයට පත් කරන ලද බොහෝ ශුද්ධවන්තයන්ගේ ජීවිත තුළ දක්නට ලැබුනු ධර්මගුණයක් ලෙස උපවාසය හඳුන්වා දිය හැකිය. අප දේශයේ සේවය කළ ශු. ජුසේ වාස් පියතුමන් ද සැම දිනකම පාහේ උපවාසයේ යෙදුනු බව එතුමාගේ ජීවන චරිතයෙහි සඳහන් වේ.

වර්තමානයේ අප ශු. සභාව ඇතුළු මුළු මිනිස් සමාජයම මුහුණ දෙන විවිධ අර්බුද හා ගැටලු නිසි ලෙස නිරාකරණය කර ගැනීම සඳහා නිරාහාරශීලය හා යාච්ඤාව යොදාගත හැකිය. එවිට දෙවි පියාණන්ගේ කැමැත්ත කුමක්දැයි අප හට වටහා ගත හැකිය. මෙම බලවත් ආයුධය භාවිත කිරීම තුළින් ශු. සභාව සිටින තැනින් සිටිය යුතු තැනට රැගෙන යාමට සුදුතුම් වරම් පැතීම අප සතු වගකීමකි.

☛ ලබන සතියට

✍ ගරු සජිත් ශිහාන් ප්‍රනාන්දු සහෝදරතුමා
ජාතික දෙව්සත්හල

**දෙවියන් හා බැතිබර සංවාද**

## ජන වන්දනාව

ක්‍රිස්තු වර්ෂ 2015
මාර්තු 15 ඉරිදා

# දෙව්පියාණන්ගේ නීතිය ප්‍රේමයේ නීතියයි

චතාරික සමයේ සතරවන ඉරුදින - 2015. 03. 15

**ඉරුදින මෙනෙහි කිරීම**

චතාරිකය පහසුවෙන්ම දෙවිඳුන්ගේ ආදරයේ මුල අමතක කරනා අපට, නැවත මුල මතක් කර දීමේ කාලයයි. මෙම සත්කාර්යයට මෙදින සුවිශේෂය දායක වන්නේ දෙවිඳුන්ගේ පුත්‍රයා මෙලොවට ඒමට හේතු වූ කාරණාව ඉදිරිපත් කිරීම මඟිනි.

තම පුතුව මෙලොවට එවීමේදී අපව විනිශ්චය කිරීමේ අදහසක් දේව තාත්තාට තුන් හිතකවත් තිබුණේ නැත. දේව තාත්තාගේ එකම අරමුණ වූයේ අප පාපය තුළ වල් වැදීමෙන් විනාශ නොවී ගැලවීම ලැබීමය.



එසේ ම, දේව තාත්තා අපට දුන් ගැලවීම එසේ මෙසේ එකක් නොව; තම එකම පුතාගේ ලේ පොළවේ හෙළීමට සලස්වා අපට දුන් පූජනීය ගැලවීමකි. දෙවිඳුන් ගැලවීමේ ආලෝකය මහත් ලෙන්ගතුකමකින් අපට පිරිනමන විට පාපයේ අන්ධකාරයේ ම විසීමට අපි සිතින් පොර අල්ලන්නෙමු. පාපයේ ඇති අසම්මත රසයට ගිජු වී, පුරාණ ගිවිසුමේ ආදි මව්පියන් හා නව ගිවිසුමේ ජුදාස් වැනි බොහෝ දෙනා වරද්දා ගත්තේ මෙන්න මෙතන ය. අප ගැලවීමේ ආලෝකය තෝරා ගතහොත් අප හුරු වී සිටින අන්ධකාරයේ ක්‍රියා අතහැරීමට අපට සිදුවේ. මෙය වේදනාකාරී විය හැකි මුත් දෙවිඳුන් තුළ සියල්ල කළ හැකි බව අපි මතක තබා ගත යුතු වෙමු. අපගේ තේරීම පාපයේ අන්ධකාරය නම් අප ආස කරන පාප ක්‍රියා කිරීමට අපට අවස්ථාව ලැබුනද එහි අවසානය විනාශය බව අපි අවධාරණය කර ගත යුතු වෙමු.

වෙනස් වීම කාටත් කවදත් එතරම් පහසු වූයෙත් වෙන්නේත් නැත. "පුතේ, මිනිස් ගැලවීම උදෙසා මියැදෙන්න" යැයි කීමට තරම් දේව තාත්තා පරිත්‍යාගශීලි වුන නිසා අපි අන්ධකාරයෙන් ආලෝකය කරා වෙනස් වීමේ අපහසුව ලොකුවට මායිම් නොකරමු. එය තුටින් දරා ගැනීමට පරිත්‍යාගශීලි වෙමු. ස්වර්ගීය ප්‍රීතිය, පව්කම් තුළ අප ලබනා සතුට වැනි දෙය සමඟ සැසඳීමට පවා නොහැකි තරමට අති මහත් ය.

එ නිසා අන්ධකාරයේ ක්‍රියාවන් දෙවන තාවකාලික සතුටට ලොල් වී "ගැලවීම එපා විනිශ්චය හොඳයි" යැයි කීමට තරම් අපි අනුවණ නොවෙමු. අප එසේ කළහොත් සුවිශේෂයේ සඳහන් පරිදි පාළුකරයේ දී මෝසෙස් සර්පයා එස වූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාණන් ද අප සදාතන ජීවනය ලබන පිණිස ඔසවනු නොඅනුමානය.

**ගරු ඉසුරු ලක්ප්‍රිය සහෝදරතුමා**
ගොන්සාල්වෙස් සිංහල ආයතනය
ජාතික දෙව්සත්හල

## චතාරිකය



අළු බදාදා සමඟ
තවත් චතාරිකයක්
මෙනෙහි කරමින් සොවින
ජේසුගේ දුක් ගාවිනා
ගයා ගී ලසෝ ගිනි
ගැනෙන
පසන් ගී ගයනා
දරා දුක් පීඩා
උපවාස සහිත වූ
ගෙවන දින හතළිහ
කෝප ද්වේශ මෝහ
නොමැති වූ පව් සිතුවිලි
ජීවිතේ හැමදාම
ගත කරන්නට බැරිද
එහෙම උනොතින් හොඳයි
ජේසු යළි මැරෙන් නැහැ

වෙන්නප්පුවේ
**ලලිත් කිත්සිරි**

## චතාරික භාවනා

හතරවන සතිය
**"උන්වහන්සේ අදහා ගන්නා විනිශ්චය කරනු නොලැබේ"**
**(ජුවාම් 3:18)**

සමිඳුනි, අඳුරක් ඇති තැනක තිබෙන
පාළුගතිය හඳුනාගෙන
ආලෝකය පැළඳ ගන්න ඔබ ගිය මඟ
ගමන් යන්න
අදහාගෙන ඔබේ වචන එන්නට ආසයි
හැම දින
කියන්න ජේසුනි අප හට
පාර කොයිද සගයට යන

නපුරු ක්‍රියා අත් හරින්න හැම දින
හිතුවත් අප හට
සත්‍යය වෙත නැඹුරු වන්න ඇයි බැරි
නිතරම අප හට
කියා ගන්න බැරි තරමට සිත අන්ධව
ඇත බොරුවට
ඔබගේ ආදරය අපට ඇති බව
දැනෙනවා සිතට

යන එන මඟ අතරමංව ජීවිතයම
නතර වෙනවා
කළ කී දේ සිතට හොරා සෑම විටම
මුළා වෙනව
ඔබව සොයා යන ගමනට අඩුම කුඩුම
හිඟ වෙන කොට
පාළු හිස්ව තනිකම තුළ
නතර වෙනව මිනිස්කමට

සමිඳුනි.... දැන්වත් අප හට කියන්න
ඔබ සමඟින් ගමන් ගන්න
ඔබේ දහම රජ කරන්න
විශ්වාසය අපට දෙන්න

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා**

# චතාරිකය වරප්‍රසාදිත කාලයක්



ඉරිදා දිනක ආරම්භ නොවන එකම ජනවන්දනා සමය චතාරිකයයි. එය ආරම්භ වන්නේ බදාදා දිනකය. අළු බදාදා ලෙසින් නම් කෙරෙන මෙම උතුම් දිනයේ "අළු" යනු පසුතැවිල්ලේ සලකුණකි. පවිටු බව පිළිගැනීමේ ලකුණකි. ශු. බයිබලයේ සඳහන් වන පරිදි පුරාණයේ මනස්ථාපනයේ දිනයන්හි අළු තවරාගෙන බිම දිගාවීම දෙවියන් වහන්සේගේ සමාව අයැදීමේ සහ පවුකාර බව පිළිගැනීමේ ලකුණක් ලෙස සැලකූහ. එය සිහිකිරීමක් ලෙස අද ද නළලේ අළු වලින් කුරුසයක් සලකුණු කරනු ලබයි. අළු බදාදා සිට පාස්කු ඉරිදා දක්වා වූ දින 40 ක කාල සීමාව තුළ අපට ඇත්තේ චතාරිකය සඳහා සූදානම් වීමේ කාලයයි. මෙම කෙටි සූදානම පූර්ණ චතාරිකයට පිවිසීමේ අවස්ථාව අපට උදා කරයි.

චතාරිකය යනු දෙවිපියාණන්ගේ සමාව දීමේ ප්‍රේමය අත්විඳිමින් එතුමන් වෙත හැරී ඒම සඳහා අප ලබා ඇති වරප්‍රසාදීය කාලයයි. මේ කාලය පුරා දින 40 ක් තිස්සේ අප මෙනෙහි කරනු ලබන්නේ මුළු මිනිස් සංහතියටම ගැළවීම උදා කර දුන් අප සමිඳාණන්ගේ ජීවිත පරිත්‍යාගයයි. උන්වහන්සේගේ දුක්විඳීම - මරණය - උත්ථානය පිළිබඳ ගැඹුරින් මෙනෙහි කරන මෙම වරප්‍රසාදීය කාලය තුළ අප එදිනෙදා මුහුණ දෙන ජීවිත යථාර්ථයන් හමුවේ දෙවිඳුන් අත්දකින්නට උන්වහන්සේ තුළ දිවි ගෙවන්නට අපට ආරාධනා කරයි.

බොහෝ විට අපගේ ඇතුළාන්තයෙන් එන බලපෑම් නිසා හෝ බාහිරින් එන බලපෑම් නිසා හෝ අපි නිතර වැරදි දේ කරන්නෙමු. "මා කැමති වන යහපත නොකර මා අකමැතිවන අයහපත මම කරමි." (රෝම 7:19) ඒ ගැන අවදි වී පියාණන් වහන්සේගෙන් සමාව යදිමින් ගැළවීම අත්කර ගැනීමට උන්වහන්සේ අප කැඳවන සේක. ඒ සමගම අපට තව වරක් නැවතී අප ආ ගමන දෙස ආපසු හැරී බලන්නට ඇරියුම් කරන සේක. එසේම මෙම කාලය තුළ දී අප විසින් සිදුකරන සෑම භක්ති අභ්‍යාසයක් තුළින් හා සෑම දිව්‍ය පූජාවක් තුළින් ද දේව වචනය ඔස්සේ අපගේ ජීවිත දෙස හැරී බලන්නට ඇරියුම් කරයි. එහි ප්‍රතිඵල ලැබීම හෝ නොලැබීම අපගේ ප්‍රතිචාර මත රඳා පවතියි. අපි කුමක් කරමුද?

මෙවර පාස්කුවත් සමඟ අපගේ ජීවිත අලුත් කර ගැනීම සඳහා පියවර ගනිමු. ඒ සඳහා මෙවර චතාරිකය උදව් කර ගනිමු. ශු. පාවුළු තුමා අපට මෙසේ පවසයි. දේව සේවයේ පංගුකාරයන් වශයෙන් ඔබ ලබා ඇති දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය අපතේ නොහරින ලෙස අපි ඉල්ලා සිටිමු. මන්ද.. මේ ප්‍රසාදජනක කාලයයි. මේ ගැළවීමේ දවසයි. එබැවින් අපේ සිත් ඉරාගෙන දෙවිඳුන් වෙත හැරෙමු. (2 කොරින්ති 6:2)

කුලියාපිටියේ
**රීටා සේනානායක**

# පවුල් සහ පැවිදි වසරේ කැඳවුම්කරු



ශුද්ධවූ සභාව මෙම වසර පවුල් සහ පැවිදි වසර වශයෙන් නම් කර දෙන අතර, ඔබත් මමත් එහි හවුල්කරුවන් ය. පවුල තුළ අපට හමුවන අභියෝග ජයගන්නේ කෙසේද යන්න ගැන මෙහිදී අප සැලකිලිමත් විය යුතුය. තවද අපට පැවරෙන යුතුකම් හා වගකීම් ගැන ද අපගේ අවධානය යොමු කළ යුතුය.

ගෙවී ගිය මරිය වසර තුළ මෙම භූමිකාවේ කැඳවුම්කරු වූයේ ධර්මදූතික මරිය හමුදාවයි. එම වසර තුළ ඔවුන් පෙර ගමන්කරු වශයෙන් කටයුතු කරමින් මරියාවන්ට උපරිම ගෞරවය සහ මරිය බැතිය නැංවූ බව රහසක් නොවේ. නමුත් මෙම වසරේ කාර්යය පවුල් සහ පැවිදි නිකායන් වලට පමණක් පැවරීම නොකළ යුතුය. අප සැම කිතුනුවෙක් ම උපතින්ම ධර්ම ප්‍රචාරකයන් ය. විශ්වාසයේ සාක්ෂිකරුවන්ය. නමුත් එම බැරෑරුම් වගකීම පූජකතුමන්ට සහ පැවිදි සොයුරියන් වෙත පමණක් පැවරීම සාධාරණ ද? කිතුනුවන්වන අප කිතුනු පවුල් රැක ගැනීමටත්, ඒවා ආරක්ෂා කර ගැනීමටත් බැඳී ඇත. නමුත් නමට පමනක් කිතුනුවන් වී ඉරුදිනට පමණක් කිතුනුවන් වීම ලැජ්ජා වීමට කරුණකි. එදා අතීතයේ ශුද්ධවූ පවුලට ප්‍රශ්න වලට මුහුණ දීමට සිදු වී ඇති බව අප දන්නා කරුණකි. අද ද අප පවුල් මුහුණ දෙන ප්‍රශ්න සහ ඒවා අතර වැඩි වෙනසක් නොමැත. අපගේ පවුල් ප්‍රශ්න විසඳා ගැනීමට ශුද්ධවූ පවුල ආදර්ශයට ගැනීම ද, සමිඳු මඟ යාම ද, සමිඳුන් එදා මුහුණ දුන් දුක් ගැහැට මෙනෙහි කිරීම ද කළ හැක. එදා ශු. පවුල ද ප්‍රශ්න වලට මුහුණ දී ඇත. එහිදී දේව දූතයන්ට ඒවා විසඳා ගැනීමට ශුද්ධවූ ජුසේ තුමා පිහිට වී ඇත. අද ද අප පවුල් ප්‍රශ්න විසඳා ගැනීමට ධර්මදූතයන් සිටින බවද අප අමතක නොකළ යුතුය. ඔවුන් සතිපතා රැස්වී තම දූතකාර්යය කරන අතර ඔබට සරණය පතා ඕනෑම මොහොතක ඔවුන්ගේ පිහිට පැතිය හැකිය.

තවද කිතුනුවන් තුළ නිසි විශ්වාසයක් නැති අය සිය පවුල් බැමි කඩා දමමින්, සමිඳාණන් තුළ ජීවත් වන අයට යහපත් පවුල් ජීවිතයක් ගත කිරීමටත් හැකියාව ඇත. පවු බරින් ලොව මුදවා ගත් සමිඳාණන් විශ්වාසය මත පදනම වූ බැම්මකින් අප පවුල් ආශිර්වාද කර ඇත. දුක සැප සතුට හමුවේ නොසැලී සිටීමටත් අපට මග පාදා ඇත. නමුත් අප ජීවිත ගමනේ අපට නොයෙක් බාධක අවහිරකම් වලට මුහුණ දීමට සිදුවේ. තවද ප්‍රශ්න නොමැති පවුල් සොයා ගැනීම ද ඉතා දුෂ්කර දෙයකි. ප්‍රශ්න බාධක මැදින් සමිඳාණන් තම ජයග්‍රහණයේ මාවත අපට පෙන්වා දුන්නේය. එලෙස යමින් අපද ප්‍රශ්න ජයගෙන උන්වහන්සේගේ ජයග්‍රාහි මාවතේ ගමන් කළ යුතුය. අප සැමගේ ප්‍රශ්න වලට විසඳුම් ඇත්තේ ස්වාමින් වහන්සේ තුළය. උන්වහන්සේගේ ශුද්ධවූ මැවිල්ල තුළ පවුලට හිමිවන්නේ අති විශේෂ ස්ථානයකි. මිනිස් ජීවිතවල ප්‍රගතියත් පිරිහීමත් සහ නැවත ශක්තිමත් වීමත් උන්වහන්සේගේ අනුදැනුම මත සිදුවේ.

**ඇන්ජලෝ සිල්වා** - මොරටුව

# වත මසිතට පොරෝනාවක් බඳු වී ඇති නිසා එය කෙසේ ඉරා දමන්නද?

ක්‍රිස්තුන් වහන්සේව අනුගමනය කරන උන්වහන්සේව තම ජීවිතයේ ස්වාමියාණන් හැටියට පිළිගන්න සෑම කිතුනුවකුගේම ජීවිතයේ වැදගත් කාලපරිච්ඡේදයක් හැටියට අළු බදාදා දවසින් ඇරඹෙන, චතාරික කාලය හැඳින්විය හැකිය.

"වත ඉරාගෙන නොව සිත ඉරාගෙන, නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න." ජෝවෙල් දිවැසිවරයාගේ ඇරියුම අප වෙතටයි. අද දූවිල්ලෙන් සෑදුන මිනිසා, යළි දූවිල්ලට හැරෙන බව සිහිපත් කරන තවත්, එක් අළු බදාදාවක් පමණක් නොවේ. එතැනින් එහා පියවරකට අප කැඳවන සමිඳාණන් සැබෑ ජීවිත වෙනසකට අප කැඳවයි. මේ වසරේත් අළු බදාදා දිව්‍ය පූජාවට සහභාගි වූ අප ඒ බව පසක් කර ගත්තෙමු. එම අදහස ගැන තවත් දුරට දැනුම්වත්වූ අපට පසක් වූයේ සිත් තුළ ඇති වංචනික ගති රැවටිල්ල, බොල් වූ කරුණාවන්තකම, කැපී පෙනෙන්නට කරන පරිත්‍යාග බාහිරව පෙන්වන සිල්වත් බව, මේ ආදි දේවලින් පිරුණු පොරෝනාවක් බඳු වූ සිත ඉරා දැමීම අමාරුවූවත් කළ යුතු කාලය පැමිණ ඇති බව අපටම අවබෝධ විය.

චතාරිකය ඒ ජීවිත වෙනස කරා සමිඳුන් අපව කැටුව යන කාලයයි. අප ආත්මාර්ථය වටකොටගත් මම - මාගේ - මට යනාදි මමත්වයේ තාප්පය ටිකෙන් ටික බිඳලන්නට සමිඳුන් අප තුළින් ක්‍රියාත්මක කරන කාලයයි.

මේ කාලයේ අප රට තුළ අපා දුක් විඳින මා පිය දූ පුතුන් වෙත හදවතින් යාමටත්, නොයෙකුත් ආපදා නිසා දැත් දෙපා නැති සොහොයුරන්, නිමක් නැති කරදරවල හිරවූ තරුණයන් තුළ කිතු සමිඳුන් තනි වී ඇති අයුරු අපි දකිමු. "සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත එන්න." මෙය ශුද්ධවූ වචනයකි. එයට බලයක් ඇත. එහි ඇති ආලෝක ධාරාව තුළින්, තමා තුළ ඇති ව්‍යාජ මිනිසා නසා දමා සැබෑ ජීවිත තත්ත්වය හඳුනාගත හැකි බවත්, එය දෙවි සමිඳුන්ට ප්‍රිය මනාප බවත් සැබෑ සිත් වෙනසකට මීට වඩා සුන්දර කාලයක් නොමැති බවත් අපට අවබෝධ වූ කරුණකි.

**පී. ජේ. ඇම්. මියුරියල් ප්‍රනාන්දු**
බක්මීගොල්ල මීසම

# මේකත් මට බරක්ද?



**කතුතුමනි,**

අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන් සිය ලංකා සංචාරය නිමකොට, තම අත් බෑගයද රැගෙන අහස්යානයේ පියගැටපෙල නගින ආකාරය ඡායාරූපයක්ද සහිතව ලංකාවේ සුප්‍රසිද්ධ පුවත්පතක පළවූ සිරස්තලයකි මේ!

උන්වහන්සේ වතිකාන රාජ්‍යයේ රාජ්‍ය නායකයාණෝය. එමෙන්ම ලෝකවාසී සියලු කතෝලික ජනතාවගේ අධ්‍යාත්මික නායකයාණෝය. මෙනයින් බලනකල උන්වහන්සේ ද්විත්ව රජකෙනෙකි. මෙවැනි උතුම්වූ පුද්ගලයාණන් කෙනෙකු මේ අයුරින් තමන්ගේ අත් බෑගය තමන් විසින්ම රැගෙන යාම අප සියල්ලන්ටම විස්මිත දසුනක් වූවා පමණක් නොව අද ලෝකයේ බලවත් යැයි කියාගනු ලබන සියලු රාජ්‍ය පාලකයන්ගේද ඇස් ඇරවන්නක් වූ බව නිසැකය. මෙය ඔවුන්ට නිහතමානීව දුන් අතුල් පහරකි. එය එහෙම පිටින්ම නිවැරදිය.

ලෝක රාජ්‍ය නායකයන් විසින් කරනු ලබන විවිධ රාජ්‍ය චාරිකාවන් රූපවාහිනී නාලිකාවන් තුළින් අපි දැක ඇත්තෙමු. මෙවැනි අවස්ථාවන් වලදී ඔවුන්ම රැගෙන යන භාණ්ඩයක් වෙතොත්, ඒ ඔවුන්ගේ කබායේ රුවාගෙන යන පෑන පමණය. කරුණු මෙසේ වන කල අප සසුනිසුරාණන් මුලු ලොවට ප්‍රදර්ශනය කළ මේ ආදර්ශය මොන තරම් ශ්‍රේෂ්ඨ වූවක්ද?

රාජ්‍ය නායකයන් වනාහි එලොවින් පහළවූ පිරිසක් නොව ජනතාව අතරින්ම බිහිවූ පිරිසක් බව කතාවෙන් පමණක් නොව ක්‍රියාවෙන් මුලු ලොවටම පෙන්වූ අප සුදුතුම් පියාණන්ට ලක්වාසී කිතුනු ජනතාවගේ ප්‍රණාමය!

**ආර්. ඒ. ඩී. රිගොබර්ට්**
වැලිකන්න

පාඨකයින්ගේ ප්‍රතිචාරය

**ජනතා හඬ**

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 15 ඉරිදා

# 10 ශ්‍රේණිය පෙළපොත සම්පාදනය ප්‍රශංසනීයයි

**කතුතුමනි,**

2015 වර්ෂයට වෙනස් වූ 10 ශ්‍රේණිය කතෝලික ධර්මය පෙළපොත සැකසීම නවතාවයකින් යුතුව සකස්වීම ඉතාමත් අගය කළයුතුය. සිරිලකට වැඩමකර ඉතා දුෂ්කර කටුක පූජක සේවාවක් ඉටුකළ පූජ්‍ය පඬි ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමන්ගේ සේවාව ශුද්ධ වූ ජුසේවාස් මුනිඳුන්ගේ කිතුනුවන් රැස්කිරීමේ වන්දනීය මෙහෙවර පිළිබඳව සිරිලක් කිතුනු ඉතිහාසය සිසු දරුවනට ඉගෙනීමට පෙළඹවීමක් කර තිබීමත් දිළිඳුන්ගේ සසුන් පියා, දයාවේ දූතිකාව, සාන්තුවර චරිත ඉගෙනීමට වඩාත් රුසියක් දක්වන අයුරින් සකසා ඇත.

කතෝලික ධර්මය පෙළපොත සැකසීම තුළ සිසු දරුවන්ගේ මනසට චිත්‍රනය කරගත හැකි මෙරට තම ජීවිත ආදර්ශයට ගත හැකි සාන්තුවර චරිත, පුද්ගල චරිත ද එකවිට වැදගත්වේ. නිර්මාණශිලි ලේඛක මඩුල්ලේ සුවිශේෂි කාර්යය භාරය එය වන්නේය. ඉගෙනුම ඉගැන්වීම් කාර්යය තුළදි වඩාත් අර්ථවත් ලෙස ඉගෙනුම් උපකරන භාවිතයෙන් නිර්මාණශීලි අයුරින් දරුවන්ට දැනුමින් ආකල්ප තුළින් පෝෂනය කිරීම ගුරුවරයාගේ දක්ෂතාවයි. ඒ අයුරින් මිස පොත පිරෙන්න හතිදමමින් සටහන් ලිවීමට දීම නොවේ. ක්‍රියාකාරකම්, අභ්‍යාස, රූප මාධ්‍ය, සහ තොරතුරු ගවේෂනය කිරීම, අදාල සටහන් භාවිතය කතෝලික ධර්මය පාඩම් තුළින් කිතුනු ආකල්ප ගොඩනැගීමටත්, පිළිතුරු ලිවීමටත් ප්‍රශ්නකරණයටත් උචිත ලෙසින් 10 ශ්‍රේණිය කතෝලික ධර්මය නව පෙළපොත කදිම නිදසුනකි.

විශේෂයෙන්ම පූජ්‍ය පඬි ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාගේ සිංහල සාහිත්‍ය සේවය හා පූජක සේවාව පීඩනවලට මුහුණ දීම උන්වහන්සේ මිහිදන් කළ ස්ථානය වත් නොදන්නා අප කිතුනු දරුවන් හා දහම් ගුරුවරුන්ද සිටින මෙවන් යුගයක මෙලෙස හෝ කතෝලික පෙළපොත් සකස්විය යුතුමය.

**ටෙස්මා රෝස් ශ්‍රියාණි පෙරේරා**
ආචාරිනි මිග/ලොයෙලා විද්‍යාලය

# පාඨක සිත් බැඳි 'ප්‍රදීපයේ' නව හැඩරුව

**කතුතුමනි,**

මෙරට පුවත්පත් ඉතිහාසයේ වසර එකසිය පනහකට ආසන්න කාලයකටම උරුම කියන ඥානාර්ථ ප්‍රදීපය පුවත් පත සිරිලක කිතුනුවන් වෙනුවෙන් වෙන්වුනු එකම ජාතික පුවත් පත බව අමුතුවෙන් කිව යුතු නැත. මෙරට කතෝලික ජනතා හඬ රටපුරා ගෙනයන ප්‍රදීපයට මෙරට කිසිඳු තරගකාරි අභියෝගයක් නැත. එහෙත් සිය ජාතික මෙහෙවර අභියෝගයක් සේ සලකා නිවැරදි දැක්මකින් නිදහස් චින්තනයකින් කටයුතු කරන ප්‍රදීපය පසු ගිය ඉතිහාසය පුරාම තම පාඨක කැළ දැනුමින් දහමින් සුපෝෂිත කරන්නට ඇපකැප වු බව නම් අවිවාදයෙන් පිළිගත යුතු සත්‍යයකි.

කෙසේ වුවද සතිපතා අප දෝතට එන ප්‍රදීපය මෑතක සිට විශේෂයෙන් සුදුතුම් පියතුමන්ගේ ලංකාගමන පිළිබඳ වූ අතිරේකයන් සමග කිසියම් වෙනසකට නැවුම් මුහුණුවරකට භාජනය වී ඇති බව මා හට දැනුනි. පුවත්පතේ පිටු සැකැස්ම (Layout) ඉතාමත් විශිෂ්ට ආකාරයෙන් පාඨකයින් සිත් සතන් ආකර්ෂණය වන අයුරින් සකස් වීම මෙහිදි විශේෂයෙන් සැලකිය යුතුය. පසුගිය කලාපයේ (මාර්තු 01) මුල්පිටුවේ සැකැස්ම මෙහිදි නිදසුනකට ගත හැක. ඒ අතරම ආධුනික ලේඛක ලේඛිකාවන්ගේ ලිපි නිර්මාණ වලට ප්‍රදීපයේ ලැබෙන ඉඩද වැඩි වී ඇත. මෙය අනාගත ප්‍රතිභාපූර්ණ කතෝලික ලේඛක ලේඛිකාවන් බිහිකිරීමේ ජාතික මෙහෙවරකට උරදීමේ උදාර කර්තව්‍යයක් බව මට සිතේ. අවසාන වශයෙන් පෙරහරට පෙර කසකරුවන් එන්නාක් මෙන් ප්‍රදීපයේ මේ නැවුම් මුහුණුවරේ කූඨ ප්‍රාප්තිය වසර එකසිය පනහ සපිරෙන දිනය වන විට දැක ගත හැකි වනු ඇතැයි මට සිතේ.


නූතන යුගයේ චරිත වර්ධනය විවිධ අංශ ඔස්සේ විහිදී පවතිනවා
"පෝර්ට් සිටි" ඉදිකිරීමට එරෙහිව දසතින් මහජන විරෝධතා
ඥානාර්ථ ප්‍රදීපය
"ජුසේ වාස් වසරක්" නම් කිරීමට ශ්‍රී ලාංකේය කතෝලික සභාව සැරසෙයි

**ප්‍රියන්ත පීටර්ස්**
වෙන්නප්පුව

# චතාරික වන්දනා ගමන විනෝද චාරිකාවක් කර නොගන්න

**කතුතුමනි,**

අළු බදාදායින් ආරම්භ කළ චතාරික සමය අපට ආශිර්වාදාත්මක උතුම්වූ කාලයකි. චතාරික සමයේ දින 40 තුළදී අප කුරුසියේ පාදනමස්කාරය, උපවාසය, එක්වරු ශීලය, පශ්චත්තාපික ධර්මවිවේක, යාච්ඤා, මර්ධන ක්‍රියා ආදි නොයෙකුත් භක්ති අභ්‍යාසයන්හි යෙදෙමින් අපගේ ජීවිතයේ සැබෑ වෙනසක් ඇතිකර ගැනීමට අපි උත්සාහ කරමු. මේ අතරින් ප්‍රධාන තැනක් ගන්නේ චතාරික වන්දනා ගමනය. කිතුනු ජනතාවද පවුල් වශයෙන්, මීසම් වශයෙන්, සමිති සමාගම් වශයෙන් එකතුවී කල්වාරි පාදනමස්කාරය සඳහා පුදබිමක් කරා යති.

අද ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල කල්වාරි පුදබිම් ගොඩනගා ඇත. මේවාද එක්තරා තරගයක ස්වභාවයෙන් ඒ ඒ තැන්වලට පැමිණෙන ලෙස කිතුනු ජනතාවට ඇරියුම් කරති. මේ දිනවල අප පුවත්පතේම සඳහන් කර ඇති ලෙසම දර්ශනීය, මනරම් පරිසරය නිසාම බැතිමතුන් ඒ ඒ ප්‍රදේශවල සිරි නරඹමින් පාදනමස්කාරයට සහභාගි වීමට යති.

ගමේ පල්ලියේ සිදුකරන පාදනමස්කාරයට (ඉරිදාටවත්) දිව්‍ය පූජාවටවත් නොයන බැතිමතුන්, ඒ සඳහා පැයක් ගතකිරීමට අකමැති බැතිමතුන්, බොහෝ ඈත පෙදෙසක මුළු දවසම ගෙවා දමමින් පාදනමස්කාරයකට යන්නේ ජේසු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තිය සිහිකිරීමටද නැතහොත් විනෝදය සඳහාද, තම ගමේ සිට කිලෝ මීටර් 100 ගණනක් දුර පිහිටි කල්වාරි පුදබිමට පැය 4, 5 ක කාලයක් ගෙවා යන බැතිමතුන් වාහනවලින් යාමේදී ගීතිකා, යාච්ඤා කියමින් වන්දනා චාරිකාවක් ලෙස යන නමුත් නැවත එන ගමනේදී ඔවුන්ට මේ චතාරික කාලය කියාද මතක නැති තරම්ය. ඇතැමෙක් සංගීත භාණ්ඩ වාදනය කරමින් සින්දු කියති. ඇතැමෙක් (පිරිමි) මත්පන් බොති. ගඟක් වැවක් ලඟ නැවතී ස්නානය කරති. ගමන යනවිට ඔවුන් තුළ තිබූ ශ්‍රද්ධාව නැත. මෙවැනි දේවලට අකමැති අය ඔවුන් අතර සිටියත් මොනව කරන්නද?

මෙවැනි වන්දනා ගමන් යන පිරිස් මේ චතාරික කාලයේ දීවත් තම ආශාවන් මර්ධනය කර ගෙන සැබෑ භක්තියෙන් කල්වාරි පාදනමස්කාරයට සහභාගිවී ජේසු සමිඳුන්ගේ තැළුණු පොඩුවුනු තුවාලවුනු හදවතට ලංවීමට සිතට ගතයුතු බව කිව යුතුය.

**ඩොරින් පෙරේරා**
මොරටුව

# නවීකරණයද... සංරක්ෂණයද?

**කතුතුමනි,**

ජුබිලි මහෝත්සවය අරබයා දෙව්මැඳුරු නවීකරණය බොහෝ විට සිදුවේ. නවීකරණය වෙනසකි. වෙනස නරක නැත. එහෙත්, වෙනස් වෙනවා නම් වෙනස් විය යුත්තේ හොඳ අතටමය. එබැවින් නවීකරණය සීරුමාරුවට කළ යුත්තකි.

හුදු නවීකරණයට හසුවීමෙන් ඉපැරණි කලාකෘති විකෘති වේ. නැත්නම් නැත්තටම නැති වේ. දෙව්මැඳුරු ගරා වැටෙන්නේ හරි හමන් නඩත්තුවක් නොමැතිකමිනි. ඔහේ ගරා වැටෙන්නට ඉඩ හැර ජුබිලියක් ආ සැණින් පැරණි වූ පලියට ඉවත් කිරීම සුදුසුද?

යටගිය දවස, නවීකරණයට හසු වි පැරණි දෙව්මැඳුරු තුළ රෝමනෙස්ක් හා ගොතික් ශෛලිය මුසුකොට තැනූ වාස්තුවිද්‍යා වටිනාකමකින් යුත් අල්තාර සහ මල්කම්න්, ලියකමින් හැඩ වූ අගනා දැවයෙන් නිම කළ ගරාදි වැටවල් ඉවත් කෙරිණි. අවුරුදු සියයකට වඩා පැරණි වාස්තු විද්‍යා වටිනා කමකින් යුත් රජයේ ගොඩනැගිලි වුවද සංරක්ෂණය කරවනා හැර කඩා නොදමයි.

නවීකරණය, දේව මන්දිරයක ගාම්භීර සාන්ත සුන්දර පෙනුමට සමබර විය යුතුය. හුදු අත්තනෝමතික නවීකරණය නිසා දේව මන්දීරයක තිබිය යුතු සරල චාම්බව ගිලිහී ගොස් කෘතිම බවක් ආරෝපනය වේ. එසේම වර්තමානයේ ගොඩනැගිලි ද්‍රව්‍ය සීමිතය. මිල අහස උසටය. ඉතින් කාගේ මුදල් වුවත්, නාස්තිය දෙවිඳුන් පවා නුරුස්සයි. එබැවින් දෙව්මැඳුරු නවීකරණයට පෙර විද්වත් මණ්ඩලයක නිරීක්ෂණ ලබා ගැනීම සුදුසුය.

පැරණි දේ රැක ගන්නට වර්තමාන පරම්පරාව මැලි කමක් දක්වයි. අතීතයක් නැත්තාට වර්තමානයක් හෝ පෙනෙන තෙක් මානයක අනාගතයක්වත් නැත. එහෙයින්ද අතීතයට නිගා නොදී නවීකරණය කළ යුතු තැන් නවීකරනය කරමු. සංරක්ෂණය කළ යුතු දේවල් සංරක්ෂණය කරමු.

මේ දේවල් එකිනෙක පටලවා නොගෙන අපේ පැරණි ශ්‍රී විභූතිය මතු පරපුර උදෙසා රැක ගැනීම වර්තමානයේ ජීවත්වන අයගේ යුතුකමකි.

**ඩෙනිස් ප්‍රනාන්දු**
කුඩාමඩුවැල්ල



# ලාරම්භය වූ ාසික පාස්කු දර්ශනය

බවට පත් විය. වර්තමානය වන විට ජා-ඇල සියලු සැප පහසුකම් වලින් සපිරි විසල් නග රයකි. එදා ජා-ඇලට දුම්රිය ස්ථානය ස්ථාපිත නොකර ගන්නට සමහර විට ශ්‍රී ලංකාවේ මැතිවරණ සිතියමේ හා පරිපාලන සිතියමේ "ජා-ඇල" යන නමින් මැතිවරණ කොට්ඨාශයක් හෝ පරිපාලන ලේකම් කොට්ඨාශයක් හෝ නගර සභාවක් බිහි



නොවන්නට ඉඩ තිබුණි. ශ්‍රී ලංකාවේ නොදියුණු කුඩා ගමක් දියුණු නගරයක් බවට පත් වීමේ අඩිතාලමකට පාස්කු දර්ශනයක් හේතු වුණු ප්‍රථම අවස්ථාව මෙය විය හැකිය.

1950 මුල් භාගයේ දී පමණ ජා-ඇල මෙම ඓතිහාසික සත් දින පාස්කු දර්ශනය වෙනුවට ඒ. ප්‍රැන්සිස් ප්‍රනාන්දු මුහුප්පු මහතාගේ යෝජනාවක් අනුව මහා සිකුරාදා දින හා පාස්කු ඉරුදිනට පමණක් සීමා වන ලෙස පාද නමස්කාර ස්ථාන 14 මුල් කරගනිමින් මෙම පාස්කු දර්ශනය රඟ දැක්වීම ආරම්භ කරන ලදි. ඒ අනුව මහා සිකුරාදා දින උදේ 8.30 ට ජා-ඇල වික්ෂෝපමාතා දේවස්ථාන භූමිය ඉදිරිපිට ජේසු ස්වාමිදරුවන්ගේ මරණයට තීන්දුව ලැබ උන්වහන්සේගේ ශ්‍රී කරපිට කුරුසිය තැබීම නිරූපණය කිරීමෙන් අනතුරුව කපාල කන්ද දක්වා යන උන්වහන්සේගේ අති දුෂ්කර ශෝක බර ගමනේ කුරුසේ බරින් පළමුවරට බිම වැටීම, දේව මෑණියන් සම්මුඛ වීම, සීමොන් සිරිනේවුස් කුරුසේ රැගෙන යෑමට උදව් වීම, වෙරෝනිකා ස්ත්‍රිය ජේසුස් වහන්සේගේ ශ්‍රී මුහුණ පිස දැමීම, ජේසුස් වහන්සේ දෙවන වර බිම ඇද වැටීම, ජෙරුසලම් ස්ත්‍රීන් හමුවීම, කුරුසේ බරින් උන්වහන්සේ තුන්වැනි වර බිම ඇද වැටීම, රඟ දක්වමින් ජා-ඇල නගරය හරහා ගමන් කොට කපාල කඳු මුදුනට සම්ප්‍රාප්ත වේ. ඉන්පසු සවස 1.30 ට කපාල කඳු මුදුනේ ජේසුස් වහන්සේගේ වස්ත්‍ර කඩා දැමීම, ජේසු ස්වාමිදරුවන් කුරුසියේ ඇණ ගසා සිටුවීම රඟ දැක්වීමෙන් අනතුරුව උන්වහන්සේගේ අවසන් වාක් සත දේශනා කිරීමෙන් පසු ස්වාමිදරුවන් කුරුසිය මත උකුත් වීම නිරූපණය කැරේ.

අනතුරුව සිදුකරන සුළු මෙහෙයෙන් පසු බැතිමතුන්ට කඳු මුදුනට ගොස් කුරුසිය සිපාචාර කිරීමට අවස්ථාව ලබා දේ. පසුව ජේසු සමිඳුන්ගේ ශ්‍රී දේහය කුරුසියෙන් බා දේව මෑණියන්ගේ උකුලෙහි පුනවනු ලැබීමෙන් අනතුරුව උන්වහන්සේගේ ශ්‍රී දේහය ගල්ලෙනෙහි තැම්පත් කිරීම නිරූපණය කිරීමෙන් පසු ශ්‍රී දේහය පෙරහරින් දේවස්ථානය කරා වැඩම කිරීමෙන් පසු මහා සිකුරාදා දින පාස්කු වැඩසටහන නිමාවට පත් වේ. පාස්කු ඉරුදින දිව්‍ය පූජාවෙන් පසු ජේසුස් ස්වාමිදරුවන්ගේ මහිමාන්විත නැවත නැගිටීම නිරූපණය කිරීමෙන් පසු තූර්යවාදක නාද පෙරටුකොට ගෙන බැතිමතුන්ගේ හරසර මැද විජයග්‍රාහී ජේසු ප්‍රතිමාව රැගෙන පෙරහරින් ජා-ඇල නගරය මැදින් වීදි සංචාරය කොට නැවත දේවස්ථානය කරා පැමිණ ජය සැමරීමෙන් පසු මෙම ඓතිහාසික පාස්කු දර්ශනය නිමාවේ.

වසර 300 කට වැඩි දීර්ඝ ඉතිහාසයක් ඇති මෙම පාස්කු නාට්‍ය කලා සම්ප්‍රදාය එකල දූව, පිටිපන, බොරලැස්ස, හලාවත, පයාගල, වෙන්නප්පුව, බෝලවත්ත, මන්නාරම, හා යාපනය ඇතුළු බොහෝ ගම් නගරවල ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන්ගේ ඉමහත් භක්ත්‍යාදරයට පාත්‍ර විය. මෙම පාස්කු නාට්‍ය දර්ශන යම් යම් හේතූන් මත දැන් ඇණ හිට ඇත.

ඉපැරණි පාස්කු කලා සම්ප්‍රදාය අනුව දැනට ශ්‍රී ලංකාවේ රඟ දක්වන එකම පාස්කු දර්ශනය ජා-ඇල වික්ෂෝප මාතා දේවස්ථානය මඟින් ජා-ඇල කපාල කන්දේ රඟ දක්වන මෙම ඓතිහාසික පාස්කු දර්ශනය වේ.

එබැවින් 2015 අප්‍රේල් මස 03 වැනි මහා සිකුරාදා දින පැවැත්වෙන මෙම ඓතිහාසික පාස්කු දර්ශනයට සහභාගි වීම සඳහා බැතිමත් කතෝලික ජනතාවට ජා-ඇල වික්ෂෝප මාතා දේවස්ථානයේ මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත පියතුමා සහ දහම් සේවා සභාව ඉතා ගෞරවයෙන් ආරාධනා කර සිටිති.

**ඒ. ජෝශප් ලක්සිරි ප්‍රනාන්දු**
ජා-ඇල

# 150 කොයිබට ද? 01

රේ ජුනි මස 7
නෙන් නිකුත්
ඥානාර්ථ ප්‍රදීපය"
කාශකයා මෙන්ම
මාලු කන්දේ
බව සඳහන් වේ.
විසින් මුල්
කරගෙන
ක් එළිදැක්වූද ඒ
බෞද්ධ,
ාද බහුල සමයක්
ණි. එම නිසාම ඒ
වුණ වාර ප්‍රකාශන
මෙවන් වාදයක්
දක්වන්නට විය.
පුළුල් අරමුණක්
ට "නැණ රුත්
0 ක දීර්ඝ ග
සිටී. එදා මෙදා
ය" සිය ශත
අවස්ථාවේ දී
විද්‍යාලයේ
මණ්ඩලයේ

සභාපති ශාස්ත්‍ර විශාරද පුවක් පිටියේ මෙත්තානන්ද ගරු ස්වාමින් වහන්සේ පැවසූ වදනක් මෙහිදී සිහිකිරීම වටී. "අපි විරුද්ධ වන්නේ වැරදි වලටයි. පාපයටයි. අපේ සටන වැරදි නැති කර ගැනීමේ සටනයි. පටු ආගම් වාදයක් කර පින්නා ගැනීම අප කිසි කෙනෙකුගේ අරමුණ නොවිය යුතුය.

අවුරුදු සීයක් පසු කරන විට එවන් පුළුල් අරමුණකින් ආගමික සහජීවනයක් ජනතාව තුළ ඇති කරලීමට මෙම පුවත්පත යම් දායකත්වයක් සමාජයට ලබා දී ඇති බව මෙත්තානන්ද සංඝ පීතෘන් වහන්සේගේ කියමනෙන් සනාථ වේ. එලෙසම එවකට එනම් 1966 වසරේ මෙම පුවත්පතේ කර්තෘ ධුරය දැරූ අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් විශ්‍රාමික රදගුරු හිමි ශත සංවත්සර අතිරේකයෙන් එළිදැක් වූ අදහස මෙහිදී සිහිපත් කිරීම වටී.

ජාතික හා ආගමික සමගිය අපි සැම විටම උසස් කොට සලකමු. පහත් රුචිය අවුස්සා පත්‍ර අලෙවි කර ගැනීමේ අපේක්ෂාවක් අප තුළ නොමැත. අප ගරු කරන සදාචාරයටත් අප උසස් කොට සලකන හෙළ හැදියාවටත් පටහැනි වූ කිසිවකට කුමන හේතුවක් නිසා හෝ අනුබල දෙන්නට අපි නොපෙළඹෙන්නෙමු."

වත්මන් කතුවර පියතුමාගේ ලිපිය අවසන් වන්නේ මෙසේ ය, "ශ්‍රී ලංකාවේ ජන දිවියට ආගම් දිවියට දේශපාලන දිවියට මෙන්ම සමාජීය දිවියටත් විශ්වාසයේ පදනම තුළ සුවිශේෂී ගුණාංග වපුරාලන තෝතැන්නක්ම වෙන්නට ඥානාර්ථ ප්‍රදීපයට හැකියාව ලැබේවා යන්න අවසන මෙසේ ප්‍රාර්ථනය කරමු."

**තවත් කොටසක් ලබන සතියේ**

**ජෝ. සංගපාලආරච්චි**
පමුණුගම

# පෘතුගීසි පාලනයේ වගතුග

**මෙ රට කිතු සමය බොහෝ දෙනෙකුගේ සිත් තුළ රැඳී ඇත්තේ පෘතුගීසි සමයේ නිර්මාණයක් ලෙස යි. මේ නිසා පෘතුගීසි සමයෙන් අප ලද යහපත අයහපත ගැන දත්ත ස්වල්පයක් මෙහි සඳහන් කිරීම වැදගත් වනු ඇතැයි සිතමි.**

අපක්ෂපාත, සාධාරණ ඉතිහාසඥ පිරිස මෙ රට තුළ පෘතුගීසි පාලන සමයක් ඇත්තෙන් ම තිබුණේ දැයි ප්‍රශ්න කරත්. පෙර පළ කරන ලද ලිපියක අප පෙන්වා දුන් පරිදි පූර්ණ බල සහිතව පෘතුගීසි රජයක් මෙ රට පැවතියේ ක්‍රි.ව. 1597 සිට 1658 දක්වා පමණි. එය ද මුහුදුබඩ පළාත් රැසකට සීමා විය. මේ අනුව කෝට්ටේ රාජධානිය මත ඔවුන් ගේ පාලන කාලය (60) හැට වසරකට පමණ සීමා වූ අතර උතුරේ යාපනය මත ඔවුන් රජ කැර ඇත්තේ අවු. තිස් හතක කාලයක් පමණි. ඔවුන් කෝට්ටේ රජ කළ මේ කාලය තුළ වැඩියක් යෙදී සිටියේ නුවර යුද ගැටුම්වල හා ඕලන්දයින් සමඟ යුද ගැටුම්වල ය. මේ නිසා ඔවුන්ගෙන් අප රට ජාතිය වෙනුවෙන් බාහිර විශේෂ සේවාවක් ඉටු වී යැයි කිව නොහැකිය.

තවද 1505 සිට 1597 දක්වා ද කෝට්ටේ රාජධානිය කෙරෙහි ඔවුන් ගේ වැඩි බලපෑමක් නො වීය. ප්‍රථමයෙන් ම 1509 සිට 1518 දක්වා කෝට්ටේ දකුණු පෙදෙස රජ කළ



**යටගිය දවස**

විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**198**

විජයබාහු ඔවුනට විරුද්ධව සිටියේ ය. 1518 න් පසු කෝට්ටේ දකුණු කොටස වූ සීතාවක රජ කළ මායාදුන්නේ සහ පළමු රාජසිංහ ද ඔවුනට දැඩි ලෙස වෛර කළෝ ය. එසේ ම නුවර කඳුකරයේ සිට නැගෙනහිර මුහුදුකරය දක්වා දිවගිය නුවර රාජධානිය කෙරෙහි ද ඔවුන් ගේ බලපෑම් ඉතා ස්වල්ප විය.

අවසානයේ දී ඔවුන් රාජ්‍ය පාලනය පූර්ණ ලෙස පවරාගත් සීමිත කෝට්ටේ රාජධානිය තුළ ද පෘතුගීසි බලපෑම් ඇති කොට ඔවුන්ගේ භාෂාව හෝ සංස්කෘතිය හෝ පතළ කරන්නට නොහැකි වූයේ මල්වානේ දී අප ජනතාව එයට විරුද්ධ වූ හෙයිනි. මල්වානේ සම්මේලනය ඉතිහාසයේ අපට ඉතා වැදගත් වන්නේ ය. ක්‍රි.ව. 1597 ධර්මපාල රජු ගේ මරණයෙන් පසු මෙරට රජ කිරුල පැවැරුනේ පෘතුගාල රජු වෙත යි. එවකට මෙහි සිටි පෘතුගීසි නායක ජෙරෝනිමෝ ද අසවේදෝ පාලනය බාර ගැනීම සඳහා සම්මේලනයක් කැඳවීය. මේ සඳහා කැඳවන ලද සිංහල නායකයන් අතර බහුතරය වූයේ කතෝලික පිරිස යි.

අසවේදෝ මෙහිදී ඉදිරිපත් කළ යෝජනා මාලාවක් විය. සැකෙවින් ඒ මෙසේ ය. මෙතැන් සිට කෝට්ටේ රාජධානිය පෘතුගාලේ රජු වෙත පැවැරෙන්නේ ය. ඒ අනුව පෘතුගීසි භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් රට පුරා පතුරවා යැවිය යුතුය. තවද පෘතුගීසි සංස්කෘතිය මෙහි හඳුන්වා දෙනු ලබන්නේ ය. රට වැසි සියල්ලෝ කතෝලික දහම පිළිගත යුත්තාහ.

බහුතරය වූ කතෝලික පිරිස මේ සියල්ලට දැක් වූ ප්‍රතිචාරය මෙසේ විය. නිත්‍යානුකූලව පෘතුගීසි රජතුමන් ගේ පත්වීම අපි පිළිගනිමු. එහෙත් පෘතුගීසි භාෂාව මෙන් ම සංස්කෘතිය ද පිළිගැනීමට අපි සූදානම් නැත. අපට ඉතා වැදගත්, වටිනා භාෂාවක් මෙන් ම සංස්කෘතියක් ද ඇත. ඒවා අපි රැක ගනිමු. තවද කතෝලික දහම වැළඳ ගැනීම සඳහා කිසිවකුට බල කළ යුතු නැත. ඒ ගැන අපි විරුද්ධ වෙමු. අප දහම පිළිගත්තේ නිදහස් කැමැත්තෙන් මිස බලකිරීමකට යට වී නොවේ. ඒ නිදහස සියලු දෙනාට ම තිබිය යුතුයි. අවසානයේ දී අසවේදෝ සෙන්පති පෘතුගීසි රජු වෙනුවෙන් පාලනය බාර ගත්තේ මෙම කොන්දේසිවලට යටත්වය.

මෙලෙස මේ රට තුළ පෘතුගීසි භාෂාව මෙන් ම සංස්කෘතිය ද පැතිර ගියේ නැත. ඉතා සීමිත ධනවත් පවුල් ස්වල්පයක් අතර පමණක් ඇතැම් සිරිත් විරිත් පැතිරිණි. මෙය වැඩියක්ම ඇඳුම් පැළඳුම් සම්බන්ධයෙන් වූ බව කිව යුතුයි. කෙසේ වෙතත් පෘතුගීසි වචන ස්වල්පයක් නම් හෙළ බසට ගැබ් වී තිබේ. ජනේල, මේස, අල්මාරිය යන ගෘහ භාණ්ඩවල නම් මෙන් ම පළඳනාවන්හි කමිස, ලේන්සු, සපත්තු, මේස්, කලිසම්, බොත්තම්, අල්පෙනෙත්ති වැනි වදන් ඔවුන්ගෙන් ලැබී ඇති ඒවාය

පෘතුගීසින් පාලනය කළ සිංහල මෙන් ම දෙමළ පළාත්වල ද දේශීය බස සිරිත් විරිත් මෙන් ම ආදියේ සිට පැවැති රාජ්‍ය පාලන ක්‍රම ද පැවැත්විණි. එහෙත් ඔවුන් ඉතා වටිනා තෝම්බු ක්‍රමයක් මේ සැම තැන හඳුන්වා දී ඇත. මේවා ද අපි පැරැණි ලේකම් මිටි අනුව සකස් විනැයි කිව හැකිය. පෘතුගීසිහු වෙනත් යටත් විජිතවාදීන් මෙන් අප ජනතාව පහත්කොට සැලැකුවේ නැත. බොහෝ විට ඔහු අප රට වැසියන් විවාහ කැර ගත්හ.

අප යුද හමුදාවන් සඳහා නම් ඔවුන් ගෙන් ලද්දේ විශාල දායාදයකි. එනම් මෙතෙක් ඔවුන් නො දැන සිටි තුවක්කු භාවිතය යි. පෘතුගීසි හමුදාවෝ කාල තුවක්කු මෙන්ම අත් තුවක්කු හසුරුව හොඳින් දැන සිටියහ. අප භට පිරිස් සඳහා මෙය බලවත් පිහිටක් විය. පෘතුගීසින්ගේ බලවත් අපේක්ෂාව වූයේ වෙළෙඳාම දියුණු කිරීම යි. මෙය මුල් කැරගෙන වෙළෙඳ වටිනාකම ඇති කුරුඳු, පුවක්, කරදමුංගු වැනි වගාවන් දියුණු කළෝ ය. මේ අතර කලක සිට දිවයින කෙරෙහි ව්‍යාප්ත වෙමින් පැවැති දකුණු ඉන්දියානු බලපෑම් පෘතුගීසින්ගේ පැමිණීමත් සමඟ දුර්වල විය. පසළොස් වැනි සත වසර වන විට ගම්පොළ වැනි පළාත් දක්වා මදුර, ටන්පෝර් බලවේග ව්‍යාප්ත වී තිබිණි. මේවා සියල්ල ඔවුන් ගේ පැමිණීම හේතුවෙන් අහෝසි විය.

මීට අමතරව දිවයින වහල් කැරගත් මැද පෙරදිගින් ඉන්දියාව හරහා පැමිණ තිබූ තවත් භයානක තර්ජනයකි. ඒ අරාබි වෙළෙඳ ඒකාධිකාරිය යි. මේ පිරිස බේරුවල සහ කොළඹ වෙළෙඳ ක්ෂේත්‍රය සහමුලින්ම නතු කැර ගෙන අප විදේශීය මෙන් ම දේශීය වෙළෙඳාම් ද පාලනය කළෝ ය. බේරුවල ඔවුන් ම පාලනය කළ ප්‍රදේශයක් විය. ක්‍රි.ව. 1348 - 1349 අතර පාප් වහන්සේ විසින් චීනය සහ දිවයිනට එවන ලද තම නියෝජිත ගරු ගියොවන්නි ඩි. මරිඤ්ඤොල්ලි තුමන් බේරුවල සිටි කිතුනු පිරිස බැලීම සඳහා ගිය අවස්ථාවේ එතුමන් සිරගතකොට චීන රජු එතුමනට තෑගි කළ භාණ්ඩ සියල්ල පැහැර ගත් බව වාර්තා වන්නේ ය.

පෘතුගීසින් ගේ පැමිණීම හේතුවෙන් එම අරාබි හෙවත් මරක්කල වෙළෙඳ ආධිපත්‍යය බිඳ වැටුනේය. එසේ නොවන්නට ඉන්දුනීසියාව, මැලේසියාව වැනි රටවල් මෙන් ලංකාවද අරාබි ආධිපත්‍යය පිහිට වූ රටක් වන්නට ඉඩ තිබිණි.

පෘතුගීසි යුගය තුළ කතෝලික ධර්මදූත සේවාව සැලැසුම් සහිතව සංවිධාන කෙරුනු බව පිළිගත යුතුයි. එහෙත් වෙසෙසින් ඇතැම් පෘතුගීසීන් ගේ මෙන්ම බොහෝ සොල්දාදුවන් ගේ හැසිරීම අප දහමට කැළලක් ඇති කළ බවද කිව යුතුය.

# ගොන්සාල්වෙස් සිංහල ආයතන තරගාවලිය 'වචනයාණෝ මනුසත් බව ගත් සේක'

අම්පිටිය ජාතික දෙව්සත්හලේ ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ නාට්‍ය හා සංගීත පර්ෂදයන් මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන නත්තල් කෙටි නාට්‍ය හා කැරොල් ගායනා තරගය මෙවරද 'වචනයාණෝ මනුසත් බව ගත් සේක.......' යන්න තේමා කොටගෙන වර්ෂ 2014 උඳුවප් මස 07 දින ජාතික දෙව්සත්හලේ 'සැකට්' ශ්‍රවණාගාරයේදී ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි.



අප ගරු සහෝදර තුමන් විසින් තම නිර්මාණ කුසලතාවයන් හා සහජ හැකියාවන් ඔප් නංවමින් නත්තල හා බැඳි නූතන තේමාවන් උපයෝගි කර ගනිමින් නිර්මානය කළ කෙටි නාට්‍යයන් මෙන්ම විවිධ තනු නිර්මාණයන්ට සරිලන ලෙස පබැඳි කැරොල් ගායනයන්ද එකිනෙක අභිබවා නොයන ලෙස උසස් අන්දමේ තරගකාරීත්වයක් ප්‍රදර්ශනය කරන්නට එදින සමත් විය.

කඩවත මීසම් සේවක ගරු එඩ්මන්ඩ් තිලකරත්න පියතුමන්ද, දයාන් විතාරණ සංගීත වේදියාණන්ද, ගිරාගම සෞන්දර්ය ගුරු අභ්‍යාස විදුහලේ සංගීත කථිකාචාර්ය අමිත බණ්ඩාර ගුරු මහතාණන් විසින් කැරොල් ගායනා තරග විනිශ්චය කළ අතර පෙරියමුල්ල මීසම් සේවක ගරු රංජිත් ටෙරී පියතුමන්ද, ප්‍රවීන රංගන ශිල්පී ජගත් චමිල කලාවේදියාණන්ද, ගිරාගම සෞන්දර්ය ගුරු අභ්‍යාස විදුහලේ විදුහල්පතිතුමිය වන කුසුමා වික්‍රමසූරිය මහත්මියද විසින් නාට්‍ය තරගයන්හි විනිශ්චය ලබා දෙන ලදී.

කලාහිතකාමී ප්‍රේක්ෂක ජනතාවගෙන් පිරී ඉතිරී ගිය ශ්‍රවණාගාරයේ ඔල්වරසන් මධ්‍යයේ කෙටි නාට්‍ය තරගයේ ජයග්‍රහණය පළමුවන වසර දේවධර්මය හදාරන සහෝදරතුමන්ලා හිමිකරගත් අතර කැරොල් ගායන තරගයේ ජයග්‍රහණය තහවුරු කර ගැනීමට ද ඔවුහු සමත් වූහ.

එදින සියලුම වැඩකටයුතු ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ අනුශාසක තැම්පත් ගරු ඇලෙක්ස් නිලන්ත පියතුමාණන්ගේ ප්‍රධාන අනුශාසකත්වයෙන්ද , අදියුරු තැම්පත් ගරු එල්මෝ ඩයස් පියතුමාණන් ඇතුලු උප අදියුරු ගරු විලියම් ඉවාන්ස් පියතුමා සහ අනෙකුත් පූජක සංඝයේ මඟපෙන්වීම හා එම ආයතනයේ නිලධාරී සහෝදර තුමන්ලාගේ මූලිකත්වයෙන් සංවිධානය කෙරිනි.

**ගරු රජිත ද සොයිසා සහෝදරතුමා**
උප ලේකම් ගොන්සාල්වෙස් සිංහල ආයතනය ජාතික දෙව්සත්හල, අම්පිටිය

## කතෝලික ඞී. වී. ඞි පට දෙකක්!




අසීසියේ ශු. ප්‍රැන්සිස් මුනිඳුන්ගේ ජීවිත කතාව ඉදිරිපත්කරමින් නව ඉසව්වක ගමන් අරඹමින් සාර්ථක පියවරක් තැබූ කොළඹ අගරදගුරු මැඳුරේ පොත් හලේ දිලන්ත ගුණරත්න මහතා තවත් පියවර කිහිපයක් ඉදිරියට තබමින් නවතම ඞී. වී. ඞී චිත්‍රපට දෙකක් එළිදක්වා ඇත. මෙම චිත්‍රපට දෙකම සිංහලෙන් හඬකවා ඇත. ඒ 'ආදම් සහ ඒව' හා 'මරියෝත්තමාවෝ' (ශු. පවුලේ කතාව) යන චිත්‍රපටයන්ය. මෙම ඞී. වී. ඞී. පටයේ එකක මිල රු. 400 කි. මැවීමේ කතා පුවත අන්තර්ගත කරමින් 'ආදම් සහ ඒව' ළමුන් වෙනුවෙන්ම නිර්මාණය කළ කාටුන් චිත්‍රපටයකි. 'මරියෝත්තමාවෝ' (MARY OF NAZARETH) ඉංග්‍රීසි චිත්‍රපටයේ පරිවර්තනයකි. මෙම චිත්‍රපට ද්විත්වයේ හඬ කැවීම් අධ්‍යක්‍ෂණය දිලන්තගෙන් වන අතර පරිවර්තනය සී. ඞී. ජයකොඩි මහතාගෙනි. හරවත් දේ කිතුනුවන්ට ලබාදෙමින් ඉදිරියට යන දිලන්ත හට තවත් නිර්මාණයන් දායාද කිරිමට කලා ප්‍රදීපය සුබ පැතුම්!

– කුමර

## විකසිත කුසුම්

**කර්තෘ – සුනීතා මාලනී විජේසිංහ**
**මිළ – රු. 120/=**

ප්‍රදීප ලේඛිකාවක, කිවිඳියක, සුහද සේවා වාර්තාකාරිනියකවූ මතුගම සුනීතා මාලනී විජේසිංහගේ විකසිත කුසුම් කෙටිකතා සංග්‍රහය දැන් නිකුත් වී තිබේ.

අප සමාජයේ වෙසෙන දිළිඳුන්, පීඩිතයන් ගැන වෙසෙස් අවධානයක් යොමුකරන කතුවරයා ඒ සියලු තත්ත්වයන් මැද ඔවුන් නොසැලෙන දිරියෙන් හා වීර්යයෙන් යුතුව ජීවිතයට මුහුණ දෙන අන්දම කියාපාන අයුරු අගනේය. වැටි වැටි නැගිටින ඔවුන් ඒ ඔස්සේ ජීවිතය ජයගන්නා ආකාරය නූතන සමාජයේ බොහෝ දෙනකුට ආදර්ශයට ගත හැකි තරම් වටනේය. බොහෝ විට අපේ ලේඛක ලේඛිකාවන් පරාජිත චරිත මඩේ දමමින් සෝදන්නට සූරවීර වී ඇති යුගයක ජීවිතය පරාජිත බවේ කරුමයක් නොව ධෛර්යයේ වීර්යයේ හා නොපසුබස්නා




උත්සාහයේ කඩඉමක් බව පසක් කරන්නට කතුවරිය ගෙන ඇති වෑයම සාර්ථක වී ඇත. කතුවරියට ප්‍රදීප සුපැතුම්!

## භාවනාත්මක ශ්‍රී කුරුසියේ පාදනමස්කාරය

**සම්පාදක – ඩබ්ලිව් එම්. ප්‍රනාන්දු**
**මිළ – රු. 50/=**

ශ්‍රී කුරුසියේ පාදනමස්කාරය කතෝලිකයන් අතර ඉතා ජනප්‍රිය චතාරික භක්ති අභ්‍යාසයකි. චතාරික සමයේ දින 40 ක සූදානම් කාලයේදී කතෝලිකයෝ පාදනමස්කාර පිළිවෙත මහත් බැතියෙන් සිදුකරති.

මේ ග්‍රන්ථය තුළින් කතුවරයා මේ පිළිවෙතේ නියැලෙන්නට සැරසෙන බැතිමතුනට වඩාත් ගැඹුරු ආත්ම සෝදිසියක යෙදෙමින් ඉතා අර්ථාන්විතව පාදනමස්කාර භක්ති අභ්‍යාසයෙහි නියැලීමට අතදීමට දැරූ වෑයම සාර්ථක වී තිබේ. කතුවරයාට ප්‍රදීප සුපැතුම්!




## කිතුනු විශ්වාසය සහ උත්තම මිනිසකුගේ කතාවක්

**කර්තෘ – පැට්‍රික් මාකස්**
**මිළ – රු. 200/=**

පුවත්පත් වාර්තාකරණයේ ඉතා දීර්ඝ කාලයක අත්දැකීම් අති පැට්‍රික් මාකස් වාර්තාකරණය තුළ පමණක් සිරවී කොටුවී නතරවන්නට සිතුවේ නැත. එය ඉතා වැදගත්ය.

කතෝලික බැතිමතකු වශයෙන් සිය උපන් හැකියාවන් කුළුගන්වමින් නවතම ග්‍රන්ථය ඔස්සේ කිතුනු සමාජයට හිතන්නට යමක් තිළිණ කර ඇති බව පෙනේ. මානව වටිනාකම් කුළු ගන්වමින් ඔහුගේ පන්හිඳෙන් ලියැවුණු මේ ග්‍රන්ථය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මංඩලයේ ප්‍රකාශන වැඩපිළිවෙළ ඔස්සේ 2014 වසරේ තෝරාගත් එකම කතෝලික කෘතිය වීමද සුවිශේෂි අගයකි.

බයිබලීය ඉගැන්වීම් හා විමර්ශනයන් පාදක කර ගනිමින් සම්ප්‍රදාය හා විශ්වාසය එකට කලතමින් මානව වටිනාකම් හුවා දක්වන්නට කතුවරයා වෙහෙසගෙන ඇත. මෙහි ඇති 'අපේ කාලයෙ ප්‍රාණ පරිත්‍යාගිවර' පරිච්ඡේදය එහිලා කදිම අත්වැලක් ලෙස හඳුන්වා දිය හැකිය. කතුවරයාට ප්‍රදීප ආචාරය!

**මෛත්‍රී**




## ෆිලීෂන් අබයකෝන්ගේ සුබස 292

### සුමිහිරි දඬු ඇණෙනි!

ඉස්සර මහ සිකුරාදා, කුරුස සිපාචාර කරන වේලාවේ CRUX FIDELIS විශ්වාසී කුරුසිය යන ගීතිකාව ගැයිණ. එහි කොටස් දෙකකි. ස්වර්ගස්ථ ගරු සෙබස්තියන් ප්‍රනාන්දු නි.ම.නි පියතුමන්ගේ පරිවර්තනය මෙසේය.

සැදැති කුරුසේ වන - රුකෙනි අතිගරු වන
තගෙ මල් පලතුමෙන - නැතිය රුක්වල අප වන
සුමිහිරි දඬු ඇණෙනි
තොප බර විය අමා වැනි

මේ කොටස් දෙක PANGE LINGUA නම් සිරිකුරුස ගීතිකාවේ පදයක් පදයක් පාසා මාරුවෙන් මාරුවට ගායනා විණ. නව වත්පිළිවෙත්වල කුරුස ගසෙනි අමිල කඳෙනි යයි ගීතිකාවකි. මුල් ලතින් ගීතිකාවේ සඳහන් ඇණ තුනත්, කුරුස ලී කඳේ එල්ලුනු බර ගැනත් නව ගීයේ නැත. සෙබස්තියන් පියතුමන් දඬු ඇණෙනි කීවේ කුරුස දැව කඳටත් ඇණවලටත්ය. DULCIS සුමිහිරි හා අමා වැනි ලෙස පෙරළිණ.

මහ බ්‍රහස්පතින්දා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මණ්ඩපයට වැඩමවන පෙරහැරේදී PANGE LINGUA සත්ප්‍රසාද ගීය ගැයේ. මහ සිකුරාදා කුරුස වන්දනාවේ දී PANCE LINGUA සිරි කුරුස ගීය ගැයේ. මේ ගීතිකා දෙකම මුල් ලතින් අරුත් නොනසා හෙළ බසට පෙරළා සෙබස්තියන් පියතුමෝ සිය සමත් කිවියාව මොනවට දක්වති.

දිවෙනි මගෙ ගායන
ජයගොස සාදු නදයෙන
කරව තුති බුහුමන
විජය ලත් කුරුසෙන

ගසෙන් වූ මරණය
ගසකින්ම පහකරනුය
ලොව ඇති සියල් දෙය
මැවු තුමා හට සිත් විය

අහෝ උස් රුකයෙනි
තගෙ අතු නම මිනි
තගෙ හදය හරිමිනි
දරුව තා බර අදරිනි

## චතාරික සිතුවිලි




**කර්තෘ – ගරු ගයාන් ප්‍රසන්ත පියතුමා**
**මිළ – රු. 200/=**

ලේඛන කලාවට පෙම්බැඳි අයෙකුට තම නිර්මාණයන් ග්‍රන්ථයක් ලෙසින් එළි දැක්වීමට අවස්ථාව ලැබෙන්නේ නම් එය සතුටට පත්වීමට කාරණයකි. එසේම තමන්ගේ පළමු නිර්මාණ එකතුව අමතක නොවන සොඳුරු අත්දැකීමකි. 'චතාරික සිතුවිලි' (චතාරික සමයේ දින 40 සහ ශු. සතියේ මෙනෙහි කිරීම) ග්‍රන්ථය මා හට කියවීමට ලැබුණි. නිරන්තරයෙන් ලේඛන කලාවේ නොයෙදුනද ඉඳහිට ලියමින් සාර්ථකව තම ලිපිය පාඨකයින්ට ඉදිරිපත් කිරිමට හැකියාව ඇති අයෙකු ලෙසින් මෙම ග්‍රන්ථයේ කර්තෘ මම හඳුනාගෙන සිටිමි. සහයක පියතුමකු ලෙසින් සමිඳු මිදි උයනේ සේවාවේ යෙදෙන ගරු ගයාන් ප්‍රසන්ත පියතුමාය ඒ. එතුමාගේ මෙම ග්‍රන්ථය ඉතා අගෙයි.

මෙහි චතාරික සමයේ පළමු ඉරුදින සිට පස්වන ඉරුදින දක්වා දිනපතාම පළමු කියවීම, දෙවන කියවීම හා සුවිශේෂය වාක්‍යයන් ඇසුරෙන් (සුවිශේෂ පාඨයද සමඟින්) චතාරික සමය නම්වූ වරප්‍රසාද ජනක සමයේ කිතුනුවන්ගේ හදවතට අමතමින් බුද්ධිය පෝෂණය කරමින් මෙනෙහි කිරීමට අප යොමුකරවයි. මෙහි ශු. සතියද මේ අයුරින් ඇතුළත් කොට ඇත. හදිසි අනතුරකට භාජනය වූ පියතුමා මෙම ග්‍රන්ථය රචනා කිරීමට යොමු වූ අයුරු පෙර වදනෙහි මෙසේ සඳහන් කොට ඇත. (මෙය අපටද ආදර්ශයක් යැයි සිතමි)

පාදයේ ආබාධය නිසා එම දින හතලිහ පුරාම යාච්ඤාවට හා භාවනාවට වැඩි වැඩියෙන් කාලය මිඩංගු කිරිමට හැකියාව ලැබුණු නිසා ජනතාව සමග දේව වචනය ගැඹුරින් මෙනෙහි කළෙමි. පසුව සැදැහැවතුන් කිහිපදෙනෙකුගේ අදහස වූයේ එම මෙනෙහි කිරීම් රචනා කර තැබීම වැදගත් බවයි. ඒ සඳහා ඔවුන් එම මෙනෙහි කිරීම සටහන් කර නැවත මා වෙත ඉදිරිපත් කළේය. එම සටහන් සියල්ලක්ම එකතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 'චතාරික සිතුවිලි' යන මේ පුංචි ග්‍රන්ථය එළිදකින්නේය. **ගරු පියතුමාට ප්‍රදීපය සුබ පැතුම්!**

**කුමර**

# අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පිය ජනප්‍රියත්වය 90% දක්වා ඉහළට

අතිඋත්තම ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා සසුන් පිය පදවියට පත්වී වසර දෙකක් ඉක්ම ගොස් ඇතත් එතුමන්ගේ ජනප්‍රියතාව දිනෙන් දින ඉහළ යමින් පවතින බව වාර්තාවේ.

මේ වනවිට ඇමරිකා එක්සත් ජනපදය තුළ එතුමන්ගේ ජනප්‍රියතාවය 90% බැව් සිදුකළ නවතම සමීක්ෂණවලින් පෙන්නුම් කරයි. මෙය අතිඋතුම් සොළොස්වන බෙනඩික් සසුන් පිය ජනප්‍රියත්වය ඉක්මවා යෑමක් වන අතර සාන්ත දෙවන ජුවාම් පාවුළු මුනි ජනප්‍රියත්වය කරා ශීඝ්‍රයෙන් සමීපවීමක් ලෙස දැක්විය හැකිය.

2013 මාර්තු 13 වැනිදා අතිඋතුම් ප්‍රැන්සිස් හිමිපාණන් සසුන් පිය පදවියට පත්වෙද්දී එතුමන් කෙරේ කැමැත්ත ප්‍රකාශ වුයේ 58% ක් පමණි. එහෙත් මේ වනවිට එය 32% කින් ඉහළ ගොස් ඇතැයි පැවසේ. මේ අතර විශ්‍රාමික අතිඋතුම් සොලොස්වන බෙනඩික් සසුන් පියාණන්ගේ ඉහළම ජනප්‍රියත්වය 2008 අප්‍රේල් මසදී 83% ලෙස වාර්තා වූයේ එතුමා ඇමෙරිකා එක්සත් ජනපදයේ චාරිකා කළ විටදීය. මේ අතර සාන්ත දෙවන ජුවාම් පාවුළු මුනිඳුන් 1990 මැයි හා 1996 ජූනි මාසවලදී 93% ක කැමැත්තක් ලබාගත් අතර 1987 මැයි මාසයේ එය පැවතියේ 91% ලෙසිනි.

මේ අතර නිරන්තරයෙන් දිව්‍ය පූජාවට සහභාගි වන කතෝලිකයන් අතර අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියාගේ ජනප්‍රියත්වය 95% දක්වා ඉහළ අගයක් පෙන්නුම් කරයි. ඉකුත් පෙබරවාරි 18-22 දක්වා කාල සීමාවේදී නියැදි සමීක්ෂණයක් ලෙස මෙය සිදුකැර තිබේ.



විශ්ව සභාව

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 15 ඉරිදා

## කතෝලික රදගුරු වසම

# හොංකොං කතෝලික රදගුරු වසම

බ්‍රිතානය කොලනියක්වූ හොංකොං හි විසූ බ්‍රිතාන්‍ය ජාතිකයන් හා සොල්දාදුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා වර්ෂ 1841 අප්‍රේල් 22 දා අතිඋතුම් සොළොස්වන ග්‍රෙගරි රදගුරු හිමිපාණන් විසින් හොංකොං ඇතුලු කලාප 6 ක් මසාවු පදවියෙන් ඉවත්කර ස්වාධීන අපෝස්තලික කලාපයක් බවට පත් කළේය.

ස්විස්ටර්ලන්තයේ පදවි පූජක තුමකු වු අතිගරු තියඩෝර් ජෝසෙට් හිමිපාණන් එහි ප්‍රථම අපෝස්තලික පරිපාලක විය.




වර්ෂ 1946 අප්‍රේල් 11 දා අතිඋතුම් දොලොස්වන පියුස් සසුන් පියා චීනයේ සසුන් පාලන කලාපය පිහිටුවමින් හොංකොං ඇතුළු සියලු අපෝස්තලික කලාපයන් රදගුරු වසම් බවට පත්කළේය. චීනයේ කොමියුනිස්ට් පීඩා මැද කිතුනුවන් හොංකොං බලා පළා ඒම නිසා සරණාගත අය සඳහා විශේෂ වැඩසටහන් ඇරැඹිණි.

වර්ග කිලෝමීටර් 1,104 භූමි ප්‍රමාණයකින් යුතු හොංකොං හි මුළු ජනහගනය 7,071,600 වන අතර කතෝලිකයෝ 547,000 (7.7%) වෙති. පියතුමන් 301, තේවාචාරීන් 27. පැවිදි සොයුරන් 69. පැවිදි සොයුරියන් 491 දෙනෙක් එරට සේවය කරති. මීසම් 51 පවතින අතර දෙව්මැදුරු 41, යැදුම් ගෘහ 32, ශාලා 25 ක් ඇත. එරට කතෝලික පාසල් 317 ඇති අතර එහි සිසු සිසුවියෝ 202,000 ක් අධ්‍යාපනය ලබති. හොංකොං හි ආසන දෙව්මැඳුර දේවමාතාවන්ගේ නිර්මල පිළිසිඳීම වෙනුවෙන් කැපකැර ඇති අතර අතිඋතුම් ජෝන් කාදිනල් ටොන්ග් හොන් හිමි අගරදගුරු ලෙස සේවය කරයි. අතිඋතුම් මයිකල් යෙන්ග් මින් චෙඅන්ග්. ස්ටීවන් ලී බුන් සැන්ග් හා ජෝශප් හා චි ෂින් හිමිපාණන් තෙනම හොංකොං රදගුරු වසමේ සහයක රදගුරුවරු වෙති.

## කතෝලික නොමැකෙන උරුමය

# කොලොන් ආසන දෙව්මැඳුර



ජර්මනියේ කොලොන් හි සාන්ත පීතර සහ දේව මාතාවන්ට කැපකළ ආසන දෙව්මැඳුර - කොලොන් අගරදගුරු වසමේ අගරදගුරු හිමිපාණන්ගේ නිල දෙව්මැඳුර වන අතර ලෝක උරුම ලැයිස්තුවේ ඉහළින්ම පිහිටා ඇත. ජර්මනියේ වැඩිම පිරිසක් බැහැදකින ස්ථානය ලෙස ප්‍රකට මේ ස්ථානයට දිනකට 20,000 කට අධික පිරිසක් පැමිණෙති.

වර්ෂ 1248 අගෝස්තු 15 මුල්ගල තබා ඉදිකිරීම් ඇරැඹී 1473 දී එය නතරවූ අතර 19 වන සියවසේ යළි ඇරැඹී 1880 දී සමාප්තියට පත්විය. දිගින් අඩි 474, පළලින් අඩි 283 වන එහි කුළුණු අඩි 515 උසින් යුතුය. ඉපැරැණි ගොතික් ගෘහ නිර්මාණ ශිල්පයේ අපූර්ව නිමැවුමක් වන අතර උතුරු දිග යුරෝපයේ විශාලතම ගොතික් දෙව්මැඳුර වන අතර ලොව උසින් දෙවන තැන ගත් කුළුනු වලින් යුතුවේ. මෙහි ඇති විශාල කුළුණු දෙක ලොව විශාලතම ඒවාවේ.

රජතුන් කට්ටුව සිහිපත් කැරෙන ධාතු අඩංගු දර්ශනීය මංජුසාව තැන්පත් කර ඇත්තේද මෙහිය. ආසන දෙව්මැඳුර සතුව සීනු එකොළහක් ඇති අතර ඉන් 4 ක් මධ්‍යකාලීන යුගයට අයත්වේ. ටොන් 3.8 බරැති මුල්ම සීනුව රජ තුන් කට්ටුවේ සීනුව නමින් හැඳින්වෙන අතර 1418 තනා 1437 දී සවිකළ අතර 1880 දී එය යළි ගලවා සවි කළේය. දෙවැන්න ටොන් 10.5 බරින් යුතුවූ අතර ඒ කාලයේ බටහිර පැවැති විශාලතම සීනුව එයවිය. තෙවැන්න ටොන් 5.6 බරැති අතර 1448 දී සවිකළ එය අද දක්වා එතැනම පවතී. සන්ධ්‍යා මෙහෙය සීනුව, අභිෂේක සීනුව, තිරින්දාදි සීනුව නමින් තවත් සීනු තුනක් ඇත.

වර්ෂ 1995 දී යුනෙස්කෝ සංවිධානය මගින් ලෝක උරුමයක් ලෙස නම්කළ අතර 2004 දී අනතුරට මුහුණ පා ඇති ලෝක උරුම ලැයිස්තුවට එක්වූයේ ආසන දෙව්මැඳුර අසල ඊට උස වෙනත් ගොඩනැගිල්ලක් ඉදිකරන්නට යෑම නිසාවෙනි. 2006 දී බලධාරීන් විසින් ආසන දෙව්මැඳුර ළඟ හා අවට ගොඩනැගිලි ඉදිකිරීම තහනම් කරනු ලැබීමත් සමග අනතුරට මුහුණ පා ඇති ලැයිස්තුවෙන් ඉවත් කැරිණ.

# ඊජිප්තු ප්‍රාණපරිත්‍යාගී ජීවිත පූජාවේ උණුහුම මැද කොප්ටික් නව දෙව්මැඳුරක් සීනායිහි ආසිරි ගැන්වේ



ඊජිප්තුවේ කතෝලික ප්‍රාණපරිත්‍යාගීන්ගේ ජීවිත පූජාවේ උණුහුම මැකී යන්නටත් පෙර කොප්ටික් කතෝලිකයෝ සීනායි හිදී සිය ප්‍රථම දෙව්මැඳුර ආසිරි ගන්වා අබිසෙස් ගැන්වූහ.

ඊජිප්තුවේ කතෝලික සභාව ලිබියාවේ දී ජීවිත පූජා කළ කම්කරුවන් 21 දෙනාගේ ජීවිත සාක්ෂියෙන් වඩ වඩාත් ශක්තිමත් වෙමින් පවතින්නේ යැයි කොප්ටික් කතෝලික රදගුරු අතිඋතුම් යුසුෆ් අබ්ල් කීර් හිමිපාණෝ අවධාරණය කළහ.

සාමයේ අප ස්වාමිදු නමින් කැපකළ මේ දෙව්මැඳුර සඳහා ඒ නව තෝරා ගැනීමට ඊජිප්තුවේ හිටපු ජනාධිපති හොස්නි මුබාරක්ගේ බිරිය සුසෑන් මුබාරක් මහත්මිය දායක වුවාය. කතෝලික පැවිදි සොයුරියන් යටතේ ඇය අධ්‍යාපනය ලබා ඇත. සීනායි හි මේ දෙව්මැඳුර ගොඩනැංවීමට වසර ගණනාවක් ප්‍රමාද වූයේ ප්‍රාදේශීය දේශපාලන නායකයන්ගේ විරෝධතාවයන් හේතුවෙනි.

සීනායි ප්‍රදේශය ඊජිපත්වේ සංචාරක ආකර්ෂණය දිනාගත් බහුල ලෙස සංචාරකයන් පැමිණෙන පෙදෙසකි. එහි යැදුම් කුටි හා නිවෙස්වල යැදුම් කාමර පැවැති නමුත් දේවස්ථානයක් තිබුණේ නැත. නව දෙව්මැඳුර නිසා එහි පැමිණෙන සංචාරකයන්ටත්, එහි සේවය කරන ශ්‍රම සංක්‍රමිකයන්ටත් සිය ආගමික කටයුතු පහසුවෙන් සිදුකර ගන්නට අවකාශ සැලසේ. විශේෂයෙන් ප්‍රදේශයේ හෝටල්වල සේවය කරන පිලිපීන ජාතිකයන්ගෙන් බහුතරය කතෝලිකයන් වන නිසා ඉරිදා දේව මෙහෙය කොප්ටික් පිළිවෙතින් බැහැරව ලතින් පිළිවෙතට සිදුකිරීමටත්, ඉංග්‍රීසි හා ඉතාලි භාෂා යොදා ගැනීමටත් දේවස්ථානයේ පේත්‍රියක්වර ගරු ඉබ්‍රාහිම් සිද්රාක් හිමි කටයුතු යොදා ඇත.

## සතියේ සසුන් චාරිකාව

# ලාඕසයේ පිබිදෙන කතෝලික සභාව

ලාඕසයේ ගොඩනැගෙමින් පවතින කුඩා කතෝලික සභාවට 2015 වසර වරප්‍රසාදයීය වසරක් වනුයේ ඊට නව පියතුමන් තෙනමක් එක්වන නිසාවෙනි.

ගරු පාඹලෝ ලැට්ටානා සන්තොන්, ගරු අගොස්ටිනෝ සායිනා සී බ්‍රන්ටි හා ගරු මයිකල් කාන්තාක් ලුන්ග් ඩි යන පියතුමන් තෙනම ලාඕසයේ කිතුනු සංසයට සේවය කිරීමට මේ වසරේ දෙසැම්බර් මාසයේදී පූජකවරම් ලබනු ඇත.



ලාඕසයේ හැට ලක්ෂයක් පමණ වන සමස්ත ජනගහනයෙන් බහුතරයක් දෙනා බෞද්ධයන් වන අතර 1% ක්වු කිතුනුවන් අතර 45,000 ක්වූ කතෝලික ජනතාවක්ද වෙති. දැනට ලාඕසය තුළ ප්‍රසිද්ධියේ දහම හැදෑරීම විටෙක දඬුවම් ලබන්නට පවා හේතුවක් වී ඇත. ලාඕසයේ කතෝලික රදගුරු වසමක් තවම ස්ථාපිත වී නැති අතර අපෝස්තලික අනුනායක හිමිපාණන් සිවුදෙනකු යටතේ කලාප 4 ක් ඔස්සේ කටයුතු පාලනය වේ. ලුවාන්ග් ප්‍රභාන්ග්, වියෙන්තියානි, ස්වන්නාක්හෙට් හා පාක්සි යන අපෝස්තලික කලාප ලාඕසය තුළ ස්ථාපිත කර තිබේ.

මේ අතර ලාඕසයේ පාක්සි අපෝස්තලික කලාපයේ දෙව්සත්හල් සිසුන් 8 ක්, සවන්නාක්හෙට් හි සිසුන් 5 ක් හා ලුවාන්ග් ප්‍රභාන්ග් හි සිසුන් තුන් දෙනෙක් පූජකවරයට පුහුණුව ලබමින් සිටිති. තායිලන්තයේ බැංකොක් නුවර අපෝස්තලික තානාපති හිමිපාණන්ට අපෝස්තලික අනුනායක හිමිපාණන් සිවුනම පූජකවර අබිසෙස් උලෙළට ඇරියුම් කරනු ලැබ තිබේ. ලාඕසයේ කොමියුනිස්ට් රාජ්‍යය පාලනයක් පවතින නමුත් සභාව සහ රජය අතර බරපතල ගැටුම් මතුවී නැති නිසා රජය පැත්තෙන් ගැටලු පැන නැගී නැත.

මේ අතර ලාඕසය තුළ විවිධ ක්‍රිස්තියානි මූලධර්මවාදී කණ්ඩායම් ක්‍රියාත්මක වීම නිසා කතෝලිකයන් වෙත සැක සහිත ආකල්ප මතුවෙමින් පවතී. වර්ෂ 1963 මාර්තු 01 වැනිදා ලාඕසයේ කතෝලික සභාව නිලවශයෙන් ස්ථාපිත කළ අතර කොමියුනිස්ට් පක්ෂය බලයට පත්වූ 1975 පසු එක දෙව්මැඳුරක් විනාශ කර දැමූ අතර තවත් දෙව්මැඳුරක් පොලිස් ස්ථානයක් බවට පරිවර්තනය කර තවත් දෙව්මැඳුරක් මිනිස් වාසය සඳහා යොදා ගැනිණ. 1975 සිට තිස්වසරක් පැවැති කොමියුනිස්ට් පීඩනය තුරන් කරමින් 2005 දී ප්‍රථම දෙව්මැඳුර ඉදිකිරීමට අවසර ලැබිණ. ඒ සඳහා 2003 දී ඉඩමක් මිලදී ගත් අතර එහි අපෝස්තලික පරිපාලන නිලමැඳුර ඉදිකිරීමටද අවසර ලැබී ඇත.

ලාඕසයේ උතුරු ප්‍රදේශයේ ලුවාන්ග් ප්‍රභාන්ග් අපෝස්තලික කලාපය වර්ග කිලෝමීටර් 83,700 ක් පුරා විහිද ඇති අතර මීසම් 6 ඇති අතර කතෝලිකයන් 2,410 ක් සිටිති. වර්ෂ 1967 දී ස්ථාපිත කළ පාක්සි කලාපය වර්ග කි. මී. 59,210 ක් පුරා විහිද පවතින අතර කතෝලිකයෝ 16,332 ක් සිටින අතර ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයට කැපකළ ආසන දෙව්මැඳුරද පිහිටා ඇත. මීසම් 26 කින් සමන්විත මේ අපෝස්තලික කලාපයේ පියතුමන් තෙනමක් හා පැවිදි සොයුරියන් 19 ක් සේවයට එක්ව සිටී. සවන්නාක්හෙට් කලාපය වර්ග කි. මී. 48,100 ක් පුරා පැතිර ඇති අතර කතෝලිකයෝ 13,565 ක් වෙසෙති. මීසම් 54 ඇති අතර පූජකවරුන් සයනමක් සේවය කරති. වියෙන්තිය. කලාපය වර්ග කි. මී. 98,000 ක් පුරා පැතිර ඇති අතර කතෝලිකයෝ 11,120 එහි වෙසෙති. ලාඕසයේ විශාලතම දෙව්මැඳුර මෙහි පිහිටා ඇත.

ශිරාන් මෛත්‍රී

# කොඩිගසේ පුරාණය



අපේ මුතුන් මිත්තන්ගෙන් අපට උරුම වූ සංස්කෘතික දායාදයකි කොඩිගස. ශු. ජුසේ වාස් මුනිතුමා සිරිලක් බිමට හොර රහසේ පැමිණ මහත් පරිශ්‍රමයක් දරමින් නැති වූ බැටලුවන් සොයා ගොස් නැත්තටම නැති වූ කිතු සසුන යළි පණ ගැන් වීය. ඉන් පසුව මෙහි පැමිණි ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමෝ එදා මෙරට පැවති බෞද්ධ දර්ශනය ගැන විශේෂ අවධානයක් යොමු කළහ.

සිංහල භාෂාව ගැන හදාරා පොත පතද ලිවීය. ඒ අනුව එතුමාගේ වෑයම වූයේ එයට ගැලපෙන විදියට කිතුනු ජනතාව දහම තුළ ජීවත් කරවීමයි. ගැමි පරිසරයට ඇතුළු වී ඔවුන්ගේ ආගමික වත් පිළිවෙත් ගැන මනා අවබෝධයක් ලබා ගත්තේය. ආගම් භේදයකින් තොරව සැම දෙනා එක්ව මෙම වත් පිළිවෙත්වල යෙදුන බව මේ නිරීක්ෂණ වලදී අවබෝධ විය.

වසරේ මුල් මාස 4, 6 බෝවෙන රෝග පැතිර යාමේ කාල සීමාව බව ජනතාව තම අත්දැකීම් වලින් ලබා ගෙන තිබුණි. එමෙන්ම සතා සිව්පාවාද වැඩි වර්ධනය වී රෝග පීඩාවලින් ආරක්ෂා කර, නිසි කලට වැසි ලැබ ගහ කොළ පල දරා කෙත් බිම් සරුසාර වී අස්වැන්න ලැබෙන ලෙස ගම්භාර දෙවියන්ට කන්නලව් කර පූජා උත්සව පැවැත්වීම සිරිතක්ව පැවතුනි. ආරම්භක උත්සවය "කප් ගස" සිටුවීමයි. ගමේ පන්සලේ හාමුදුරුවන් හා ගමේ නායකයා මුල් තැන ගනියි.

කොඩි ඇමුණූ ලණු පොටවල් තෝරා ගත් ගසක මුදුනේ ගැට ගසා පොළවේ වලක් හාරා සිටුවා සෙත් පිරිත් ගායනා මැද වටේ ඇති කුඤ්ඤ වල සවි කරයි. අලුත් සහලින් එතැනම කිරිබත උයා සෙත් පිරිත් ගායනා කර බුද්ධ පූජා පවත්වා ගැමි නැටුම් වලින් පසු බෙදා ගනී. පුද පූජා පැවැත්වීම දින 7 ත් 9 ත් අතර කාලයක දී අනිවාර්යයෙන් සිදුවේ. ගම්වැසි හැම අයෙක්ම සහභාගි වේ. ළමා ලපටීන්ට මෙය කිරිබත් මංගල්‍යයකි. සංස්කෘතික මංගල්‍යයකි ගමට.

මේ කප් සිටුවීමේ සිරිත කතෝලික ධර්මය ව්‍යාප්ත කිරීමේ උපාය මාර්ගයක් බව වටහාගෙන එය කොඩිගස බවට පරිවර්තනය කළේ ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා ය.

පෘතුගීසින්ගෙන් උරුම වූ මංගල්‍ය ක්‍රමය මේ අවධියේදී නැවත ඉස්මතු වී තිබිනි. වසරේ මුල් මාසයේ සිට මුනිවරුන්ගේ හා දේව මාතාවන්ගේ මංගල්‍ය ආරම්භ වන නිසා කොඩිගස් සම්ප්‍රදාය බිහි විය. යකඩ බම්බුවල හෝ විශාල ලී කඳන් වල කොඩිවැල් ගැට ගසා ක්‍රමානුකූලව දෙව්මැඳුර ඉදිරිපිට එය සිටුවා මංගල්‍ය සතිය ආරම්භ කරයි. එදා මූහුප්පු රාල, අන්නවිරාල හා ගමේ නායකයන්ගේ මූලිකත්වයෙන් ආරම්භ කර ගරු පූජකතුමාගේ ආශිර්වාද මැද සිදුවිය. කිරිබත් ගෙනාවේ කද බැඳගෙනය. ආසිරි පැන් ඉසීමෙන් පසු ගීතිකා ගයා කිරිබත් බෙදා ගනී. කල්යාමේදී මේ කොඩිගසට විවිධ උපාංග එකතු විය. විදුලි බුබුළු සවිකර අවට දිදුලවයි. ගමේ හැම හන්දියකම කොඩිගසක් එසැවේ.

පූජකවරුන්ගේ හිඟය නිසා ආරම්භයේ පියතුමා පැමිණියේ මංගල්‍ය කාල සීමාවට පමණය. මීසම් සේවක පියවරුන් ස්ථිර වශයෙන් පදිංචි වීමෙන් පසු අන්නාවිවරුන්ගේ හා නායකයන්ගේ ප්‍රධානත්වයෙන් ඉතා ගම්භීර ලෙස වෙඩි හඬ මැද නමදින සන්ධ්‍යා මෙහෙය පැවැත්විණි.

එදා ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාගේ ගීත හා ප්‍රාර්ථනා ගායනා කළත් අද ගායනා කරන්නේ ගීතාවලියේ ගීතිකාය. මේ හැම දිනකම කොඩිගසට කොඩි ඇමිනීම ද සිදුවේ. එදා "වෙස්පරස්" නමින් හැඳින් වූ මහා සන්ධ්‍යා මෙහෙය අද "වෙස්පර්ස්" හෙවත් මහා මංගල්‍යය සන්ධ්‍යා මෙහෙය, අවට පූජකවරුන්ගේ සහභාගිත්වයෙන් ගරු ගාම්භීරව සිදුවේ. හැම මෙහෙයකින් පසු සුරුවමෙන් ජනතාව ආසිරි ගන්වයි. දහවන දින මංගල්‍යය පූජාවෙන් පසු හවස් වරුවේ ගම වටා පෙරහර යයි. ඉන්පසු ආධ්‍යාත්මික වැඩසටහන අවසන් වේ. සති දෙකකින් පසු කොඩිගස බානු ලැබේ.

ඉතින් මේ වටිනා කොඩිගස සංස්කෘතිය මඟින් ගම් වැසියන් ප්‍රබෝධවත් කළ, අපට දානය කළ ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාට ද එම කාර්යය නොකඩවා පවත්වාගෙන ආ අපේ මුතුන් මිත්තන්ටද අප සදා ණය ගැති වෙමු.

ඉදිරි පරම්පරාව දක්වා මේ සංස්කෘතික දායාදය ආරක්ෂා කරමින් රැකගනිමු.

**කොන්සි දල්පතාදු**
බෝලවලාන

## ඉහළට එසැවුනු කොඩිගස

පොළෝ තලෙන් අහස් කුසට
නැඟුණු කොඩි ගසේ
බලව් සතර දිසා දෙවිඳු බැතිමතුන් වෙතේ
නුඹේ ලෙලෙන කොඩි පරදන
දුහුල් වතින් විලි සඟවන
සුදත් දනකි මේ...

පල්ලි වත්තෙ දොරකඩ ළඟ
කිරි නැති තන එල්ලී අඬන
ඉරුණු වතින් ගත සැරසුන
පැටියකු ද පෙනේ....

සැදැහැවතුන් කිරිබත් කා
කුස පුරවා අහවර වී
දංකුඩ ටික එකතු කරන
මවක් එහි ඇතේ...

දේව බැතින් සිත් පිරිලා
අත් වැඳලා නෙත් වහලා
සුදත් දනන් කිසිවෙක් හට
ඈ දුක නොපෙනේ
කොඩි ගස නුඹ මුනිවර හට
පවසා ඔහු මැදිහත් කර
ඇයත් පුතුත් ගෙවන පාප
කමා කළ මැනේ...

**එස්. ඩී. උදාර**
සීදුව

# ගෙවී යන්නේ දින 100 ද? දින 40 ද?

චතාරික සමයේ දී කතෝලික අපට මෙන්ම අනෙකුත් ලංකාවාසි සැමටම තෝරා බේරා ගැනීමට කදිම පාඨයක් ඉදිරිපත්ව ඇත. කතෝලික අපට නම් මේ දින 40 වාර්ෂිකව තම තමාගේ මනස්ථාපනය සඳහා උපයෝගී වන්නකි. නමුත් මේ දෙවැනිව කල එළි බැස ඇති දින 100 වෙනම ඉලක්කයක් කරා හඹා යන්නකි.

දින 100 මෙහෙයවන්නෝ එය ඉටු කරගැනීමෙන් තමන්ගේ ඉදිරි අනාගත ස්ථිරතාවයක් සැලසුම් කරගැනීමේ පරම චේතනාවෙන් පෙළෙති. එය යහපාලනයක් සඳහා උපයෝගී වන බව සැබෑය. නමුත් ක්‍රියාන්විත සෙබළෝ මන්දගාමී ස්වරූපයක් දක්වති. ඉන් වන්නේ වගකිව යුත්තන්ගේ සියලුම සැලසුම් බොඳ වී ගොස් "හිටපු යකා හොඳ"යි යනුවෙන් ජනතාව සිතන්නට පෙළඹීමයි. එය අති භයානකය. වන්දිත් සමඟ ජනතාව දරුණු පීඩනයකට ලක්වීම නොවැලැක්විය හැකිය. කතාවට වංචා ක්‍රියාවට මුල් තැන දෙන්නෝ විරලය. හොරුන්, දූෂිතයන්, වාචාල දොඩන්නන් වල පල්ලට ඇද දමා යුක්තිය, ධර්මය, යහපාලනය මුදුන් පමුණුවා රට සාමයෙන්, සමගියෙන් බැබළවීමට හැකි වන්නේ ක්‍රියාශීලිත්වය මත පමණක්මය.

දින 100 වාගේම කතෝලික අපේ දින 40 සම්පූර්ණ කිරීම මෙයට වඩා හාත්පසින්ම වෙනස්ය. එහි ක්‍රමවේදය වෙනස්ය. කැපකිරීම් බොහෝ ය. යාච්ඤාව, උපවාසය හා දාන ධර්ම දීම මූලිකවම සිදු කෙරේ. එක්වරු ශීලය රැකීමේදී තමා වැලකෙන කෑම වේල වෙනත් දිළින්දෙකුට දානය කිරීම වඩාත් ප්‍රතිඵලදායකය. එමගින් තමා කළ සත්ක්‍රියාව දෙවියන් වහන්සේට උසස් ලෙස ප්‍රසන්න වනු ඇත.

මේ අනුව අද දේශපාලකයන් හඹා යන දින 100 ත් එවන් කැපකිරීම්, යාච්ඤා හා දාන ධර්ම දීම් ආදියෙන් පරිපූර්ණ ද? කැපකිරීම් නම් තරමක් දුරට කෙරෙනු පෙනේ. යාච්ඤා ජීවිතයක් නම් ජේනතෙක් මානයක නැත. දාන ධර්ම දීම් කෙරෙතත් ඒවා ස්වශක්තියෙන් උපයා ගත් දේ නොව අනුන්ගෙන් අරගෙන අනුන්ටම දීමය. ඉන් ලැබෙන ආනිශංස අල්ප වුවද නැති බැරි අයකුට යමක් හෝ





ලැබීමත් මහත් දෙයකි. කුඩු කාරයන්ගෙන් හා අධර්මයෙන් ලබා ගත් දේවලින් දෙන දාන ධර්ම තමා තමන්වම රවටා ගැනීමකි. මේවා සැවොම දැනගන්නා සුප්‍රසිද්ධ වංචාවන්ය. එයින් වන්නේ තමන් නියෝජනය කරන රජය අපකීර්තියට පත් වීමයි. ඒවා තමන් ඊළඟට මුහුණ පාන මැතිවරණයක දී තීරණාත්මක සාදක වනු ඇත. ජනතාව දැන් හැමදේකදීම ඥානාන්විතය. තමන් වපුරාගත් ආකාරයට අස්වැන්න නෙලා ගැනේ.

චතාරිකයේ දී අපේ දින 40 ඉතාමත් භාවනාශීලිව, ජනවන්දනා නියමයන් අකුරටම රකිමින් සියල්ලෝම එකාවන්ව තම හෘදයාංගම භක්තිය දෙවිඳු වෙත ඔසවා තබයි. චතාරික වන්දනා ගමන්, ඥානකාන්ති, මර්දන ක්‍රියා, පාද නමස්කාර මෙහෙයන්, දුක් ප්‍රාප්ති සංදර්ශන ආදිය මේ දින 40 තුළ දී ක්‍රියාත්මකව පවතී. මේ සියල්ලෙන් කතෝලික ජනතාව වඩ වඩාත් දෙවිඳුනට ලං වී තම තමාගේ ජීවිතවල මනස්ථාපනයක් ලබා විමුක්තිය උදා කර ගැනීමේ ක්‍රියාදාමයක නියැලී සිටියි. ඒ යමෙකුගේ බලකිරීමකට නොව තම හෘද අභ්‍යන්තරයෙන්ම නැගෙන්නා වූ පිබිදීමකිනි. එය ඇත්තටම කතෝලික ජනතාවගේ වැදගත් ප්‍රවණතාවයකි. එය මේ චතාරිකයට පමණක්ම නොව ඉදිරි කාලය තුළ දී ද ක්‍රියාත්මක වන්නේ නම් අගේ ය.

දින 100 වගේම දින 40 තුළ දී ද නොයෙකුත් අපචාර ක්‍රියාවන්හි නිරත වන ඇටුවන් බැස්ස දූෂිතයන් ද එමටය. ඒ ඇත්තන්ව දින 100, දින 40 නොව අවුරුදු ගණනාවක් ගියත් යහපැවැත්මකට ළඟා කරගත නොහැකි නිදන්ගත දූෂිත භාවයට පත් වූවන්ය. සියලුම ආගමික නායකයන් ඒකරාශී වී ධර්ම සංග්‍රාමයක් කිරීමේ අත්‍යවශ්‍යතාවය මතුව ඇත.

කතෝලික අප අදහන ආකාරයට මේ සැවොමගේ අධර්මය ධාර්මික කිරීමට නම් ඒ අය වෙනුවෙන් මැදහත්වීමේ යාච්ඤා නොකඩවා පැවැත්වීමේ ඕනෑකම පවතී. අප කුඩා පිරිස් මෙන්ම පෞද්ගලිකවද මේ යාච්ඤා තුළ පවතින්නේ නම් අප දෙවිඳුන් වෙනුවෙන් යම්කිසි ඇඟට දැනෙන යමක් කළා වන්නේය. අප මුලු මහත් දේශය වෙනුවෙන්ම චතාරික සමය තුළ දී මෙන්ම ඉන් ඔබ්බටත් දීර්ඝ කාලීනව මැදහත්ව යාච්ඤා ඔප්පු කරමු.

**කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි** - මීගමුව

## කැමිලස් සහෘදයාණෙනි!



යුග පුරුෂයෙකි ඔබ
අඩ සිය වසක් පන් හිඳ සුරත රැඳී
ලියන්නට කියන්නට නොහැකි දේ
ලතාවට කලාවට
සිතුවමක් කොට කාටුනයෙන්
වැරදි තැන් සොය සොයා
තියුණු ඊ පහර විද
විසකුරු දෙබර මුල් බිම හෙලන්නට
යුක්තිය සාධාරණත්වය මතු කොට
සැබෑ මිනිසකු සේ නොනැගිටින්නට නොව නැවත නැගිටින්නට
ජීවන කරලියේ වෙස් මුහුණු හැරපියා මාවත හෙළි කර දුන් ඔබ
සදා අමරණීයයි,
පසු කළත් හැත්තෑ පස් වැනි වියේ තවත් දිගු සැනපුමක්....

**ඇන්තනි ජයලත්**
රාගම

# ජලසම්පත විනාශ කරන නවීන ගොවිතැන් ක්‍රම

ජලය සත්වයාගේ පැවැත්ම මෙන්ම විනාශයට ද හේතු වේ. සුනාමි, වැසි කුණාටු, නායයාම්. ජල ගැලීම් ආදිය ජලය ආශ්‍රිත විනාශකාරී බලවේගයන්ය. ඒ සියල්ල ස්වභාවික සිදුවීම් ගණයට වැටේ. ලෝකයේ විශාලතම විනාශය නෝවාගේ ජලගැල්මයි. මෑත යුගයේ ජීවිත හා දේපල විනාශ කළ මහ පරිමාන විනාශය 2004 වසරේ සුනාමියයි. සුමාත්‍රා දූපත්වල සිට සිදුවූ විනාශය ලොවම කම්පාවට පත් කළේය. වරින්වර පිටාර ගලමින් ගේදොර වතුපිටි විනාශ කළ කැළණි ගඟ 1947 දී මහා ගංවතුරකින් බරපතල විනාශයක් කළේය. 1957 දී මහා ගංවතුරකින් රජරට හා නැගෙනහිර ගම්බිම් විනාශ විය. කෝට්ටේ ජයවර්ධනපුර පාර්ලිමේන්තුව යට කළ ගංවතුරක් ගැන 1992 වසරේදී අසන්නට ලැබිණ.

සා. ජුසේවාස් මුනිතුමා ලංකාවේ ධර්මදානය කරන වකවානුවේ දැඩි නියගයක් ඇති වී තිබිණ. (එවක රජකළ විමලධර්මසූරිය රජතුමාගේ ඉල්ලීම අනුව) උන්වහන්සේ දේවමාතා ප්‍රතිමාව වැඩමවා යාච්ඤා කිරීමෙන් ක්ෂණිකව වැසි ලැබුණු බව ප්‍රචලිතය. යහපත අයහපත දෙකම කෙරෙහි බලපාන ජලයට සමානාර්ථ පද රාශියකි. අම්බු. අඹ, ආප, උදක, උළු, වතුර, දල, දිය, නී, නීර, පානු, වාරි, සිලිල, සිලිල්, අම, බොහෝවිට ජලයෙන් හානි සිදුවන්නේ පරිසර හානිවල ප්‍රතික්‍රියාවක් වශයෙනි. මුහුදේ හිරිගල් කැඩීම, වෙරළේ වැලි හැරීම නිසා මුහුද ගොඩගැලීමේ දී හානිය බරපතල වීම, ගංගාවල අසීමිත ලෙස වැලි ගොඩදැමීම නිසා ඉවුරු කැඩී ගම්බිම් විනාශවීම. ගස් කැපීමෙන් වන වන විනාශය නිසා නායයාම් ආදි විනාශයන් බරපතල වන්නේ බොහෝකොට මිනිසාගේ වරදිනි. මෙම පරිසරය විනාශ කිරීමේ දුර්ගුණය නිසා ජල සම්පත දූෂණයවීම දක්වා අද මිනිස් ක්‍රියාකාරකම් සැහැසි වී ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජලය අපිරිසිදු වී විෂවීම නිසා වකුගඩු රෝගය පැතිරයාමේ රාවය මැකී යාමට පෙර කල්පිටිය අර්ධද්වීපය ප්‍රමුඛ විවිධ ප්‍රදේශවල ජලය සම්බන්ධයෙන් අසුබ තොරතුරු වාර්තා වන්නට විය. ඓතිහාසික ගොවි බිමක් වන කල්පිටිය අර්ධද්වීපයේ දෛනිකව ජලසම්පාදනක්‍රම යොදා ගොවිතැන් කෙරෙන බැවින් එහි ඉතිහාසය සොයා බැලීමට ඔබට ආරාධනා කිරීම මෙම ලිපිය මගින් කෙරේ. වර්තමානයේ වැරදි නිවැරදි කිරීමට ඉතිහාසයේ පාඩම් අවදි කිරීම මෙහි අරමුණයි. පානීය ජලය පරිභෝජනයට අහිතකරවීමේ කාලසීමාව වසරක් දෙකක් වැනි කාලයකට සීමාවීම කල්පිටිය ගැන පළ කරන මත අතර දක්නට ඇත. වසර දශක ගණනාවක් පුරා සිදුවන පරිසර හානි සමග ගොවිතැන සඳහා රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය ජලය අපිරිසිදුවීමට ප්‍රධාන හේතුකාරක බව සොයා ගෙන ඇත.

වර්ග කිලෝ මීටර 154.2 ක් වන වපසරියකින් යුත් කල්පිටිය අර්ධද්වීපයේ ජනගහනය (2012 මාර්තු 20 දිනට) 85966 ක් ලෙස සංඛ්‍යා ලේඛන තොරතුරු අනුව පෙනේ. අතීතයේ සිට මෙහි ප්‍රධාන ජීවනෝපායන මාර්ග දෙකකි. එනම් ධීවර කර්මාන්තය හා කෘෂිකර්මයයි. මෙහි ඇල, දොල ගංගා නොමැත. වියලි කලාපයට අයත් බැවින් අවම වර්ෂාපතනයක් පවතී. එබැවින් ගොවිතැන පෝෂණය කිරීම ඇතුළු සෑම කටයුත්තකටම භූගත ජලය යොදා ගැනීමට සිදුවේ. ශ්‍රී ලංකාවේ බටහිර දෙසින් පිහිටි කල්පිටිය අර්ධද්වීපය වයඹ පළාතට අයත් වේ. පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි මෙම අර්ධද්වීපය ග්‍රාම නිලධාරි වසම් 31 කින් සමන්විතව කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුරා විහිදී ඇත. ලංකා සිතියමේ අත්තක් සේ දක්නට ඇති කල්පිටිය අර්ධද්වීපය පාලාවියේ දී පාලමකින් සම්බන්ධ නොවේ නම් කල්පිටිය දූපත යන නමින් හැඳින්වීමට සුදුසුකම් ලැබෙනු ඇත. ලංකාවේ බටහිර දෙසින් කොළඹ දක්වා දිවෙන හැමිල්ටන් ඇල පුත්තලම් කලපුවට එකතුවන මාර්ගය හරහා පාලවිය පාලම තනා ඇති නිසා කල්පිටිය පෙදෙස ශ්‍රී ලංකා භූමියේ කොටසක් බවට පත්ව ඇත.

මෙම අඩ දිවයින ධීවර කර්මාන්තයට සාපේක්ෂව කෘෂිකාර්මික ප්‍රදේශයක් බවට පත්ව ඇත්තේ එහි පොළොවේ සාරවත් බව නිසාය. වැලි මිශ්‍ර පස සහිත කුරිඥ්ඥම්පිටිය හා කන්දකුලිය සිට සේතාපොල දක්වා ග්‍රාම නිලධරි වසම් 23 කින් ආවරණය වන සාරවත් ගොවි බිමක් කල්පිටිය අර්ධද්වීපයේ පිහිටා ඇත.

මෙහි කෘෂිකාර්මික ඉතිහාසය ඈතට දිවේ. එම අතීත කෘෂිකාර්මික තොරතුරු වැදගත් වන්නේ පරිසරයේ සුන්දරත්වය නො නැසු බෝග වගා ක්‍රම නිසා ගහකොළ වැඩී සොබාදහමේ ආශ්වාදජනක සුහදතාවය සතා සිව්පාවාට පවා වින්දනීය වූ ද සුරක්ෂිත වූ ද බැවිනි. දියුණු තාක්ෂණයක් නොතිබූ එම අතීතයේ කෘෂිකාර්මික ශිල්ප ක්‍රම වැඩිපුර මිනිස් ශ්‍රමය දායක කරගත් ක්‍රමවේදයන් අනුව ක්‍රියාත්මක විය. එදා පැවති තාක්ෂණය පරිසරය මෙන්ම සෞඛ්‍යයද ඉහළම තත්ත්වයෙන් හිතකර විය. මිනිස් ශ්‍රමයට වටිනාකමක් ලැබුණු අතර ගුණාත්මකභාවය අනුව ඉහළ ප්‍රමිතියෙන් යුත් එළවළු හා පලතුරු පාරිභෝගිකයාට ලබාගත හැකිවිය.

මීට වසර දශක පහකට පමණ පෙර කාලවකවානුවේ ගොවිපොලක් ගත් කල එය කුඩා කඳවුරකි. සමහරවිට එහි ගොවීහු (සේවකයෝ) 15 සිට 20 දක්වා ආදි වශයෙන් වෘත්තියෙහි යෙදී සිටියහ. පොල් අතු ලී යොදා තැනූ ගොඩනැගිල්ල මඩුව ලෙස හැඳින්වීය. බොහෝවිට දුම්කොළ වියළීමේ (වේලීමේ) කටයුතු සඳහා යොදා ගන්නා බැවින් මීට 'දුම්මඩුව' ලෙස ව්‍යවහාර විය. එහි පළල සාමාන්‍යයෙන් අඩි 20 ක් පමණ වේ. දිග ප්‍රමාණය විවිධ ය. සමහරවිට දිග අඩි 100 ක් හෝ ඊට වැඩි වේ. දුම්මඩුවට නුදුරින් සුදුසු තැනක කුස්සිය හෙවත් මුළුතැන්ගෙය පිහිටා ඇත. දුම්මඩුවට යාව හොඳින් හිරු එළිය වැටෙන සමතලා බිමකි. එය පිට්ටනිය නම් වේ. දුම්කොළ වියළීම කෙරෙනුයේ එම පිටියේය. ගොවිතැන් කටයුතුවල නියැලි සියලු දෙන නේවාසිකාගාරය ලෙස පාවිච්චි කෙරෙනුයේ පෙර කී මඩුවයි. මඩුව ඇතුළත ලී කරු සිටුවා පොල්පිති තට්ටුවක් කරු මත සවිකර සකස් කළ 'මැස්ස' ඇඳක් ලෙස භාවිත කෙරේ. අවශ්‍යතාවය ද ඉඩකඩ ද අනුව එවැනි ඇඳන් කිහිපයක් ගොවීන් විසින් සවිකරනු ලැබේ. මඩුව ඇතුළත බිම පොඩි පොල් අතු එලා සකස් කර ඇත්තේ වැල්ල නිසා සිදුවන අපහසුතාවය මගහරවා ගැනීමටය. සමහරු එබිම නිදාගැනීම කරති. ඒ කාලයේ දළුව, නාවක්කාඩුව, මාම්පුරිය ප්‍රදේශයේ මහා පරිමාණයෙන්ද එත්තාලෙ, තලවිල, කුරිඥ්ඥම්පිටිය ප්‍රදේශයේ සුළු පරිමාණයෙන්ද දුම්කොළ වගාව ව්‍යාප්ත විය.

සෑම දිනකම පාන්දර උදේ කෑමට ලැබෙන්නේ බත් සහ සම්බෝල ය. ගලේ අඹරා පදමට දෙහි යොදා සැකසු සම්බෝලය උණු බතට කදිමට ගැලපේ. ගොවිපොලේ තුන්වේලම බත්ය. ගොවිපොලේ ජලසම්පාදන කටයුතු සඳහා වගාබිමේ පොළොව කැණ ළිං තනා ඇත. එය ගාල් ළිඳ නමින් හැඳින්වේ. පොළොව මතුපිට සීමාවට ජලය ගෙනෙනුයේ ඊට සුදුසු ලෙස තනා ඇති ළිං පඩිය නමින් හැඳින්වෙන බැවුම් මාර්ගයකිනි. ළිඳ වටා ප්‍රදේශයට ජලය සැපයීමේ අවශ්‍යතාවය අනුව එක ළිඳක ළිංපඩි කිහිපයක් විවෘත කෙරේ. ගාල් ළිඳෙන් ජලය ගෙන ඒමට විශේෂ කළයක් නිපදවා ඇත. එය සාමාන්‍ය කලගෙඩියකට වඩා සැහැල්ලු කුඩා රවුම් කටක් සහිත ගෝලාකාර මැටි බඳුනකි. එක් ගොවියෙක් එවැනි කලගෙඩි දෙකක් දැතින් එල්ලා ගෙන ළිංපඩිය තරණය කරමින් බෝගවගාවට ජලසම්පාදනය කරයි. විවිධ ධාරිතාවන්ගෙන් කල ගෙඩි නිපදවා ඇති අතර ලොකුම කලගෙඩියේ පරිමාව ගැලුම් 3.5 කි. ගමන් වාර සිය ගණනක් ළිඳේ සිට ජලය ප්‍රවාහනය කෙරෙන බැවින් ළිඳේ බෑවුම තුනී කර ළිං පඩිය මගින් ගමන් පහසුව සලසා ඇත.

දිනකට වතුර ගැලුම් දහස් ගණනක් එක ළිඳකින් ලබාගනී. මෙහි දී ළිඳට අලුත් ජලය උනා එයි. ඒ පිරිසිදු නැවුම් ජලයයි. එම ගාල් ළිඳේ ජලය දිනපතා පානය සඳහා ලබා ගනී. අද මෙන් ආරක්ෂිත ළිං, නළ ළිං, ජලසම්පාදන ක්‍රම හෝ බෝතල් වතුර වෙළඳ පොලක් නොතිබූ එදා ගාල් ළිඳේ වතුර පානය කිරීමෙන් කිසිවෙක් වකුගඩු රෝගයට ගොදුරු නොවූහ. පරිසරයේ සමතුලිතතාවය රැකගනිමින් අතීත ගොවිතැන පැවති බව ඒ අනුව පෙනේ. මේ නිසා කොණ්ඩ කුරුල්ලා, වී කුරුල්ලා, මයිනා ආදි පක්ෂීන් ගොවිපොල පරිසරය ගීතවත් කළා පමණක් නොව උන් අතින් අහිතකර කෘමි මර්ධනය ද සිදුවිය. ගොවියාගේ සතුරන්ගේ සතුරන් වූ උරගයින් සහ අනෙකුත් සතුන් ගොවිපොල තුළ ගැවසෙමින් අහිතකර කෘමීන් ආහාරයට ගත් බැවින් සතුන්ගෙන් ගොවියාට වූ සේවය අතී විශාලය. එවන් සේවාවක් ලබා ගත හැකි වූයේ වසවිස භාවිතයෙන් ගොවිපොල අපිරිසිදු නොවූ බැවිනි. ගොවියාගේ ගජ මිතුරෙකු වූ මීමැස්සා මලින් මලට සැරිසරමින් වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව විශේෂයෙන් සඳහන් විය යුතුය.

මීට වසර දශක 5 ක කාල වකවානුව ගත් කල කල්පිටිය අර්ධද්වීපය තුළ බෝග වගාව කෙරෙහි වැඩි නැඹුරුවක් තිබිණ. පසේ සාරවත්භාවය නිසා පිටපළාත්වල ජනයා ගොවිතැන සඳහා සංක්‍රමණය වූහ. පාලකුඩාව අලුත්කොලනිය එසේ ගොවිතැන සඳහා නයිනමඩම ප්‍රදේශයෙන් පැමිණි අයගෙන් සැදුම්ලත් ජනපදයකි. එදා බෝග පැලෑටියක් පෝෂණය ලැබුවේ ගොවියාගේ දැඩි සුපරීක්ෂාව යටතේය. පොහොර යෙදීම, ජලය සැපයීම, ලෙඩ රෝග ආදි කරුණු පිළිබඳ නිතර අවධානයෙන් පසුවිය. එදා ගසට පොහොර යෙදීය. අද ගොවිපොලට පොහොර යොදයි.

තලවිල රන්එළියේ පදිංචි ඇන්ටනි කැෂ්මියර් මහතා දක්ෂ ගොවියෙකි. ගොවිතැන සඳහා පැමිණ පදිංචි වූ කැෂ්මියර් මහතා 1973 සිට 2008 වන තුරු ක්‍රියාකාරී ගොවිකමේ නිරත වී, අද විශ්‍රාමික සුවයෙන් පසු වෙයි. ඒ මහතා පවසන්නේ 'එදා බෝගවලට පෝරදමා දවසක් යන කොට ගොවිබිමෙන් සුවඳක් දැනෙන බවයි. එදා නියම ගොවීන් සිටි අතර ගොවිතැන් කටයුතු නිසා ජලය හා පරිසරය විනාශ නොවූ බව තවදුරටත් පවසයි. අක්කරයක මිරිස් ගස් 3000 ක් පමණ වගා කෙරේ. ජලසම්පාදනය සඳහා ගාල් ළිං 3 කි. ගොවීන් තිදෙනෙකි. වැයවන පොහොර ප්‍රමාණය රාත්තල් 1700 ක් පමණ විය. මිරිස් වගාව වසරක් එල දරයි. සමහරවිට පරණ වූ මිරිස් කොටුවලට ගොම පුළුස්සා ගත් අළු යෙදු විට නැවත දලු ලා එල දරයි. වෙනත් භෝග ද වැඩි කලක් එල දරයි. මීට හේතුව පොහොර හා කෘමිනාශක යෙදීම ඉතාම අවම මට්ටමක පවත්වා ගැනීම බව ඒ පිළිබඳ විමසීමේදී දැනගත හැකිවිය. එළවළු ශාක කප්පාදු කිරීමෙන් ද වැඩි කලක් එල නෙලා ගත හැකි විය. වම්බටු හා බණ්ඩක්කා ඊට ඉතා සුදුසුය. ඇමෙල්ගමේටඩ් මාබෝලෙ පොහොර එදා ව්‍යාප්ත විය. මෙම පොහොර නිෂ්පාදනයේ දී සත්ව අස්ථි කොටස්, රබර් ඇට, වරාය ගබඩාවල ඉවතලන ධාන්‍ය රොඩු ප්‍රධාන වශයෙන් යොදාගත් බවත් ඊට අඩු ප්‍රතිශතයක රසායනික එකතුවක් තිබූ බවත් තම දැනීමෙන් කැෂ්මියර් මහතා පවසයි.

එදා බීජ ලබා ගත්තේ තම තමන්ගේ ගොවිපොලවලිනි. එම බීජ නැති අය සමග හුවමාරු කර ගැනීම, බීජ තවාන් පවත්වා ගෙන යන අයගෙන් බීජ පැළ ලබාගැනීම එදා පැවති ක්‍රමයයි. මෙම බීජ එළදාව කෙරෙහි විශ්වාසවන්තය. අතීතයේ කෘමිනාශක භාවිතය ඉතාම අවම විය. එක්ස්පරනෝ - 50 සහ එකලක්ස් එදා පැවති වර්ග දෙකයි. ඇන්ට්‍රකෝල් නමින් පැළ සිටුවා මාස 2 කට පසු යෙදීමට දිලීර නාශකයක් තිබිණ. මේවා පාවිච්චි කළේ අවශ්‍ය වූ විටදී පමණි. එදා වල් වර්ධනයට රසායනික යෙදීමක් සිදු නොවීය. ඒ කාලයේ වල් පැලෑටි සණත්වයක් දක්නට නොලැබිණ. අද පොළොවට ගොම යෙදීම නිසා වල් වර්ධනයක් දක්නට ඇති බව සමහරු පවසති. එදා බොහෝවිට ගොම යෙදීම සිදුවූයේ භෂ්ම වශයෙනි. එවිට වල් පැලෑටි බිහිවීම අඩුය. 1980 දශකයේ මුල යූරියා සහ ඇමෝනියා භාවිතයේ ව්‍යාප්තිය ආරම්භ වූ බව කැෂ්මියර් මහතාගේ අදහසයි. මේ නිසා පොහොර යෙදීමේ ක්‍රම වෙනස් විය. විසිරි පොහොර යෙදීමේ ක්‍රමය මේ අනුව බිහි වූ බව පෙනෙන්නට ඇත.

දිය මළන් කෑම නමින් බෝගවල කඳ කුණුවීමේ රෝගයට ප්‍රතිකාර වශයෙන් ජලසම්පාදනය අඩු කිරීමද ගස මුලට පස් එකතු කිරීම ද කෙරෙන අතර ලිප අළු කඳ මත යෙදීම මගින්ද රෝගය මර්ධනය කළේය. කඳ පණුවන් කෑමට කඳ තුවාල කර පණුවා ඉවත් කර තුවාලයට පස් තැවරීම ප්‍රතිකර්ම ලෙස යොදා ගැනිණ. එදා ගොවියා ශෂ්‍යමාරුව පිළිපදිමින් නියම කන්නයේදී වගා කළේය. ඒ අනුව කන්න දෙකක් යෙදේ. එනම් මැයි මස 15 සිට ජූනි මස 15 දක්වා ද ඔක්තෝබර් මස 15 සිට නොවැම්බර් මස 15 දක්වා ද වේ. මෙම කාලයේ බීජ රෝපණය සඳහා ඊට මාසයකට පෙර බිම සකස් කෙරේ. එදා බිම සකස් කළේ උදැල්ලෙන් පස් පෙරළීමෙනි. එම ක්‍රමයෙන් පස හොඳින් මිශ්‍ර වී බිම සකස් වන බව ගොවීන්ගේ මතයයි. පෙර දැක්වූ පරිදි 80 දශකයේ පොහොර භාවිතයේ වෙනසත් සමග බෝග වගාවේ ද පෙරළියක් ඇති විය. ඒ තුළ උඩරටට සීමා වී තිබූ සමහර බෝග වර්ග පහත රට දක්වා සංක්‍රමණයවීම දක්නට ලැබිණ. පහසු පොහොර භාවිත ක්‍රම සොයා ගැනීමත් ලෙහෙසියෙන් වගා කළ හැකි බෝග කෙරෙහි නැඹුරුවීමත් දක්නට ලැබිණ. එමෙන්ම 80 දශකය වර්තමාන රසායනික උවදුරේ ආරම්භයක් ලෙසද ගණන් ගත හැක.

කෙසේ වෙතත් එම කාලවකවානුවේදී ආගන්තුක බෝගයක් ලෙස අර්තාපල් වගාව කල්පිටියට ප්‍රවේශවිය. කල්පිටිය අර්ධද්වීපයේ පස සාරවත් බවට සාක්ෂි දරමින් පල්ලි වාසල්තුරේ, වෙල්ලංකරේ සයිමන් සිල්වා මහතාගේ අක්කර 6 ක අර්තාපල් වගාව සරු අස්වැන්නක් ලබා දුන්නේය. 1-10 අනුපාතයට අස්වැන්න ලබාගත් බව ඒ මහතාගේ පුත් සිරිපාල මහතා පැවසීය. තොරතුරු අනාවරණය අනුව පුත්තලම කෘෂිකර්ම කාර්යාලයේ (එවකට සේවය කළ) ඇන්ටන් මහතාගේ උනන්දු කිරීම මත සයිමන් සිල්වා සහ පී. එස්. සාලිබු ගොවි මහතුන් අර්තාපල් වගාව ආරම්භ කළ බව පෙනේ. කාලයාගේ ඇවෑමෙන් බීට්, රාබු, ගෝවා, බෝංචි, කැරට් ආදි බෝග කල්පිටියේ ව්‍යාප්ත විය. 90 දශකය වනවිට පැරණි කෘෂිකාර්මික ක්‍රම වෙනුවට නව පහසු ක්‍රම බිහිවීම නිසා මහා පරිමාණ වගා බිම් බිහි විය. ඒ අනුව වාණිජ ගොවිපොල ව්‍යාප්ත විය. ගොවි ව්‍යාපාරිකයින් බිහිවීමත්, ලාභය සඳහා වැඩි අස්වැන්න පතා රසායනික ක්‍රම සොයා යාමත්, වියදම් අඩු කිරීමට පරිසරයට අහිතකර ක්‍රමෝපායන් භාවිතා කිරීමත් ආදි කරුණු ජලසම්පත කෙරෙහි අවාසනාවන්ත අනාගතයක් නිර්මාණයවීමේ ආරම්භය සනිටුහන් කළේය.

කාලයක් පුරා පැවති පරිසරයේ ගුණාත්මක භාවය විකෘතිවීමට තුඩු දෙන, වර්තමාන ගොවිතැන නිසා ජලය අපිරිසිදු කිරීම පිළිබඳ වරද, නිවැරදි කිරීම වර්තමාන සමාජ වගකීම බවට පත් වන්නේය.



ප්‍රැන්සිස් ෂෙල්ටන් ප්‍රනාන්දු විසිනි

දසත ආලෝකය විහිදුවමින්

**දැල්වෙන පහන්**

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 15 ඉරිදා

# අතිගරු එම්. ජේ. ලෙගොක් පියතුමා සගසුව දිනීමේ 70 වැනි සැමරුම

වචනාර්ථයෙන් හා පද සිද්ධියෙන් 'ලෙ ගොක්' යන වචනයේ අර්ථය 'ප්‍රීතිමත් මිනිසා', 'ප්‍රමුදිතයා' යන්නය. සකලාකාරයෙන් ශ්‍රේෂ්ඨ වූ ලෙගොක් පියතුමා සත්‍යයෙන්ම ප්‍රමුදිතයෙකි. එතුමාගේ අව්‍යාජවත් චාම්කම, චිත්තාකර්ෂණ ගුණවන්තකම සියල්ලන්ගේ හදවත් දිනා ගති.

කොළඹ. මරදානේ සාන්ත ජෝසප් විදුහලේ වසර 40 ක ගුරු සේවයේද එයින් වසර 20 ක ජ්‍යෙෂ්ඨ අංශයේ හා මධ්‍යම අංශයේ විදුහල්පති ධූරයේද සිටි මට අතිගරු මොරිස් ජේම්ස් ලෙගොක් නමැති ඒකීය ප්‍රංශ ජාතික ඒ මහා ශ්‍රේෂ්ඨ විදුහල්පති පියතුමා ගැන යමක් ලිවීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි. එතුමාගේ ජීවිත කාලය ඇත්තවශයෙන්ම පුරාවෘත්තයකි. එතුමා උසස් කීර්තිධරයෙක්ද, විශිෂ්ටගණයේ විද්‍යාඥයෙක්ද, ආකාශ වස්තු ශාස්ත්‍රඥයෙක්ද, වාස්තු විද්‍යාඥයෙක්ද, ගෘහ නිර්මාණ ශිල්පියෙක්ද මෙන්ම මහා ඥාන ශක්තියෙන් පූර්ණ සුප්‍රසිද්ධ අධ්‍යාපනඥයෙක්ද විය. ඒ සියල්ලට වඩා එතුමා අභීත අචල දේව විශ්වාසයෙන් යුක්ත වූවෙකි. තම ධන සම්පත්ද, තාන්න මාන්නද, දීප්තිමත් තනතුරුද, ත්‍යාජකර දෙවියන් වහන්සේගේ හා මිනිසාගේ සේවය පිණිස තම ජීවිතය කැප කළේය.

මොරිස් ජේම්ස් ලෙගොක් පියතුමා 1881 වසරේ ප්‍රංශයේ උපත ලැබීය. කුයිම්පර් නගරයේ ක්‍රිස්තියානි සහෝදරයන්ගේ පාසලක එතුමා තම මූලික අධ්‍යාපනය ලැබීය. වයස 20 දී එතුමා දේව කැඳවීම ලැබ නිමල මරිය නිකායේ දෙව්සත්හලට ඇතුළු විය. ලන්ඩන් නුවරදී විද්‍යාශාස්ත්‍රවේදී උපාධිය හා ශාස්ත්‍රපති උපාධියද ලබා රෝමයේදී ආචාර්ය උපාධිය ලබා ගති. එහිදී එතුමා උද්භිද විද්‍යාවේ හා ආකාශ වස්තු විද්‍යාවේ අති දක්ෂයෙක් විය. වයස 26 දී එතුමා 1907 මාර්තු 30 වැනි දින පූජාත්වරය ලැබීය.

1914 දී ලෙගොක් පියතුමා ලංකාවට පැමිණියේය. සේවය පිණිස එතුමා පත්වූයේ කොළඹ සාන්ත ජෝසප් විදුහලටය. එහිදී එතුමා විදුහලේ විද්‍යා අංශයේ ප්‍රධානියා විය. වසර 4 කට පසු එනම් 1919 දී එතුමා සාන්ත ජෝසප් විදුහලේ අදියුරු බවට පත්විය. එම අදියුරු තනතුරට අමතරව එතුමා උද්භිත විද්‍යාවේ. ජීව විද්‍යාවේ, සත්ව විද්‍යාවේ හා ආකාශ වස්තු විද්‍යාවේ ආචාර්යවරයා විය. එතුමාම 'උෂ්මකලාපීය උද්භිද විද්‍යාව' යනුවෙන් පොතක් ලියා පළකළේය. එම පොත සාන්ත ජෝසප් විදුහලේ පමණක් නොව මුළු දිවයිනේ සියලු පාසල්වල භාවිත කළ යුතු පෙළ පොතක් ලෙස අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අනුමත කෙරින. මෙම පොත ඉංදියාවේ පාසල් පෙළ පොතක් ලෙස ගැනිණ. ලෙගොක් පියතුමා විදුහලේ රසායනාගාරය පරිපූර්ණ කළේය. තම පාසල්වල රසායනාගාර වර්ධනත්වය පිණිස මුළු දිවයිනම ලෙගොක් පියතුමාගේ සහය පැතීය. එතුමා එම සහය ඉතා සතුටින් ස්වෙච්ඡා මනාපයෙන් දුන්නේය.

ලෙගොක් පියතුමා ස්වභාව අධ්‍යයනයේ ප්‍රදර්ශකයෙක් විය. 'ස්වභා අධ්‍යයනයේ පරිච්ඡේද' යනුවෙන් එතුමා ලියූ පොත ලංකාවේ මෙන්ම ඉන්දියාවේද පෙළ පොතක් විය. උද්භිද විද්‍යාඥයකු ලෙස එම විෂයය ඉගැන්වීමේ පමණක් නොව එහි ක්‍රියාකාරිත්වයේද එතුමා අති දක්ෂයෙකි. එය කළේ ඉතා මනාපයෙන්ය. විවිධ වර්ගයේ දේශීය වෘක්ෂ ලතා හා පලාවර්ග වලින් විදුහලේ උද්භිත උද්‍යානය පිරී තිබින. 'ලංකා ස්වාභාවික ඉතිහාස සංගමයේ මෙතුමා ඉතා මාහැඟි සාමාජිකයෙක් විය. විශේෂයෙන් ස්වභා අධ්‍යයනයේ විස්තිර්ණ ගවේෂණ කාර්යයන්හි එතුමා නිරන්තරයෙන්ම ක්‍රියාකාරි තැනැත්තෙක් විය. ශ්‍රී ලංකාවේ මඩුගස පිළිබඳව මෙතුමා කළ අති විශිෂ්ට ගවේෂන කටයුතු නිසා ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ එතුමාට වැදගත් පිළිගැනීමක් ලැබිණ.

විද්‍යාඥයකු හා උද්භිද විශාරදයකු වශයෙන් මෙතුමා ලබා තිබූ විශේෂඥ දැනුමෙන් ප්‍රයෝජන ගැනීමට ශ්‍රී ලංකා රජය පසුබට නොවීය. අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධිය කිසිවකුත් නොදන්නා රෝගයකින් හෝ දිලීරයකින් නැසී යාමට ඔන්න මෙන්න කියා තිබියදී ශ්‍රී ලාංකේය සියලුම විද්‍යාඥයන්ට



ඊට හේතුව සොයාගත නොහැකිව අපොහොසත්ව සිටියදී ලංකා රජය ලෙගොක් පියතුමාගෙන් ඉල්ලා සිටියේ එම දිලීරයට හෝ රෝගයට හේතුව සොයා දෙන ලෙසය. එතුමා එම රෝගයට හේතුව සොයා ගත්තා පමණක් නොව එයට නිසි පිළියම කර මුළු බෞද්ධ ලෝකයේම උතුම් ආගමික ඓතිහාසික මුදුන් මල්කඩ වූ මෙම ශ්‍රී මහ බෝධිය අද දක්වා නොනැසී පැවතීමට සියලු කටයුතු සැකසීය.

ලෙගොක් පියතුමා ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයේ හා ගුරු අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්ය වරයෙකුව සිටි අතර විශ්ව විද්‍යාල සිසුන්ට ශිල්පශාස්ත්‍රද සිසුන්ට දෙසුම්ද පැවැත්විය. සියලුම අධ්‍යාපන මන්ත්‍රණ සභාවලට අනුයුක්තව සිටියේය. ස්වභාව අධ්‍යයනයේ න්‍යාමය හා ප්‍රායෝගිකතාව පිණිස ලෙගෙ ාක් පියතුමා කැලණියෙ වරාගොඩ සාන්ත ජෝසප් විද්‍යාලීය ගොවිපල ආරම්භ කළේය. වැඩිවශයෙන් ගැමි දරුවන් අත්දකින කෘෂිකාර්මික අවධානම් කාර්යයක් ගැන පර්යේෂණ පැවැත්වීමට විදුහල් සිසුන්ට මෙය සුදුසුතම තැනක් විය. එය ඇස් පෑදීමක් මෙන්ම ගොවිපලේ ස්වභාවික පාංශුව හා කාබනික පොහොර අතගා භාවිත කිරීමට ලබන ජීවිත කාල අත්දැකීමක්ද වෙයි. එසේම එය ශ්‍රමාභිමානය පිළිබඳව දැනුමක් හා අත්දැකීමක් ළමුන් විසින් ලැබීම ලෙගොක් පියතුමාගේ දර්ශනයද විය.

අපේ පාසල්වල තාරකා ශාස්ත්‍රය අධ්‍යයනයේ ඇති වැදගත්කම ලෙගොක් පියතුමා පෙන්විය. අවකාශයේ අභිරහස ගැන හැඳින්වීමක් පාඨකයාට දෙන පිණිස ලෙගොක් පියතුමා තාරකා ශාස්ත්‍රය පිළිබඳ පොතක් ලීවේය. මෙතුමා වාස්තු විද්‍යාඥයෙක් ද විය. කොළඹ මරදානේ සාන්ත ජෝසප් විදුහලේ දැවැන්ත අලංකාර ගොඩනැගිලි දෙස බලන විට වාස්තු විද්‍යාව පිළිබඳව එතුමාගේ දැනුම සම්පූර්ණයෙන්ම දිස්වෙයි. විදුහලේ ගොඩනැගිලිවල සැලැස්ම, අති විශාල ක්‍රීඩා පිට්ටනි, සිත් ගන්නා අලංකාර පරිසරය කාගෙත් මනා පැහැදුමට බඳුන්ය. රෝමයේ සාන්ත ජුවාම් ලැතරන් මහ දෙව්මැඳුරු ආකෘතියට අනුව එතුමා සැලසුම් කළ, සියලු ගොඩනැගිලිවලට මැද තැන් ගෙන ඉදිකර ඇති විදුහල් අලංකාර දෙව් මැඳුර එතුමාම වෙනුවෙන් වූ සුදුසුතම සජීවි ස්මාරකයකි. විදුහලේ පන්ති කාමර, නේවාසිකාගාර, දේශන ශාලා ආදියට පිවිසෙන දිගු ආලින්දය කෙසේ සැලසුම් කර ඉදිකර ඇත්තේද කිවහොත් එයට එක කෙළවරකින් යමකු ඇතුළුවූ විට වැස්සකදී වැහි බිංදුවකටත් අව්වේදී සුළු රශ්මියකටවත් අසු නොවී ඉතා ආරක්ෂිත ලෙස අනෙක් කෙළවරින් පිටවිය හැක.

ලෙගොක් පියතුමා සාන්ත ජෝසප් විදුහලේ අදියුරුව සිටිය දී ගුණවත් අධ්‍යාපනයේ පරමාර්ථය තම සිත තුළ තබාගෙන බම්බලපිටියේ සාන්ත පීතර විදුහල ආරම්භ කළේය. එදා එයට නම් වූයේ 'සාන්ත ජෝසප් විදුහල දකුණ' කියාය. අද එය කොළඹ පිහිටි තවත් කතෝලික මහ විදුහලකි. ඒ පමණක් නොව, ලෙගොක් පියතුමා දෙමටගොඩ සාන්ත ජෝන් විදුහලත් කැලණිය වරාගොඩ සාන්ත පාවුළු විදුහලත් ආරම්භ කළේය. මෙලෙස ලෙගොක් පියතුමා ශ්‍රී ලංකාවට ප්‍රධාන ගණයේ අධ්‍යාපන ආයතන හතරක්ම (04) දායාද කර ඇත.

ලෙගොක් පියතුමා මුලින්ම ගුරුවරයකු ලෙස සාන්ත ජෝසප් විදුහලේ වසර හතරක්ම (04) සේවය කළේය. ඒ 1914-1918 දක්වාය. පසුව වසර 21 ක්ම එහි අදියුරු ලෙස සේවය කළේය. ඒ 1919 සිට 1940 දක්වාය. මෙසේ ලෙගොක් පියතුමා වසර 25 ක්ම සාන්ත ජෝසප් විදුහලට සේවය කළේය. එතුමා 1940 දී විදුහලෙන් විශ්‍රාමගත් පසු කොළඹ අගරදගුරු පදවියේ අනුනායක ලෙස පත්වීම ලැබින. එතුමාගේ අභාවය සැමගේ සිත් තදින්ම කම්පා කරවන සුලුය, අධික ලෙසින් ඛේද ජනකය, මහත්සේ දුක්මුසුය. බොරැල්ලේ අගරදගුරු මැඳුරේ සිට සාන්ත බ්‍රිජට් කන්‍යාරාමයට දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය පිණිස දෛනිකව යන ගමනේදී වෝඩ් ප්ලේස් මං සන්ධියේදී තමා ඉදිරියෙන් ආ පාලනය කරගත නොහැකිවූ යුද හමුදා රථයක් අධික වේගයෙන් පැමිණ මෙතුමා ගමන් ගත් වාහනයේ ගැටින. එතුමාගේ හිස තදබල ලෙස පොඩිවී තිබින. ගලා ගිය රුධිර ධාරාවෙන් මහ මඟ නැවින. ප්‍රතිඵලය එතුමා එවෙලේ එතැනම මිය යෑමය. ඒ 1945 මාර්තු 17 වැනිදාය. ඒ වන විට එතුමාගේ වයස වසර 64 කි.

ශෝකභරිත මහා ජන ගංගාවක් එතුමාගේ අවමංගල්‍ය පෙරහරට එක්වූහ. සාන්ත ජෝසප් විදුහලේ සිට බොරැල්ල කනත්ත දක්වා වූ මෙම දැවැන්ත අවමංගල්‍ය පෙරහරට එක්වීමට මටද වාසනාව ලැබින. එවිට මා වසර 12 ක පාසල් සිසුවෙකි. අද අප මෙතුමාගේ 70 වැනි මරණ සංවත්සරය පවත්වන අතර එතුමාගේ 134 වැනි උපන් දින ද සමරමු. දැනට වසර 25 කට පෙර ශ්‍රී ලංකා රජයේ තැපැල් දෙපාර්තමේන්තුවට අනුබද්ධ 'මුද්දර එකතු කිරිමේ බියුරෝව' මගින් 1989 මැයි 22 දිනට යෙදුනු ජාතික වීර දිනයේදී මිලිමීටර් 30x40 ප්‍රමාණයේ සත 75 ක වටිනාකමින් යුත් වර්ණ මුද්දරයක් මෙතුමාගේ සිහිවටනයක් වශයෙන් නිකුත් කෙරින. ඒ අප මව් බිමට මෙම ශ්‍රේෂ්ඨ විදේශීය ධර්මදූතයා විසින් වසර 31 කම කෙරුනු උදාරතම අගනා සේවයට මහඟු උපහාරයක් වශයෙනි.

**ඩී. සී. ජයසිංහ**

# සමාජ සේවයෙන් සමුගත් ගුරු පියා

උපගුරුවරයකු - විදුහල්පති වරයකු හා මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි වරයකු වශයෙන් වසර හතලිහකට වැඩි කලක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සේවය කළ වික්ටර් කොළඹගේ මහතා එම ක්ෂේත්‍රය තුළ පමණක් නොව ඉන් බාහිරවද පාසල් නොයන දරුවන්ගේ අකුරු හැකියාව දියුණු කිරීම සඳහා සේවාවක් ද කර ඇත.

දළුපත පල්ලන්සේන එළිමහන් සිරකඳවුරේ තරුණ වරද කරුවන්ගේ අකුරු හැකියාව දියුණු කිරීම සඳහා පන්ති ආරම්භ කිරීම විශේෂ සිද්ධියකි.

සමාජ ක්ෂේත්‍රයට පිවිසි ඒ මහතා කට්ටුව ග්‍රාමෝදය මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් සේවය කළේය. එම ගමේ සණස සමිතියේ සභාපතිවරයා වූයේද ඔහුය.

මීගමුව විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කෙටි කලක් සේවය කළ ඒ මහතා දිගු කලක් කටාන විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ වරයෙක් වශයෙන් සේවය කළේය. ඒ අතර ගම්පහ දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයේ අධ්‍යක්ෂ වරයකු වශයෙන්ද කලක් සේවය කළේය. ඒ අතර සමුපකාර ක්ෂේත්‍රය තුළ ඒ මහතා කළ සේවාවන් ඇගයීමේ උපහාරයන්ද සිදුවිය.

සමාජ සේවයේ වැදගත්



ප්‍රවේශයක් ලබා ගත් ඒ මහතා මීගමුව සමථ මූල මණ්ඩලයේ සමථ වරයකු වශයෙන් දිගු කලක් සේවය කළේය.

වසර තිහකටත් වැඩි කාලයක සිට සමාදාන විනිශ්චයකාර වරයකු වශයෙන් අගනා සේවාවක් ආරම්භ කළ ඒ මහතා ප්‍රදේශය තුළ ජනතාව අතර වඩ වඩාත් සේවාවන් ඉටු කළේය.

අසූහයවෙනි වියේ පසු වූ ඒ මහතා දරුවන් සිව්දෙනෙකුගේ පියෙකි. පසුගිය දිනක ඒ මහතාගේ සිසු කැළ ඒ මහතාගේ නිවසට පැමිණ තම ගුරුවරයාගේ සුවදුක් විචාරා උපහාර දැක්වූහ.

එපමණක් නොව දළුපත ග්‍රාමයේ නොයෙකුත් සමිති සමාගම් වල විවිධ තානාන්තර උසුලමින් ග්‍රාමවාසීන්ට පුදකළ සමාජ සත්කාර සේවාවන් වෙනුවෙන් දළුපත ශුද්ධ වු අන්තෝනි සිද්ධස්ථානයේ වින්සෙන්තිද පාවුලා සමිතිය හා දළුපත ග්‍රාමවාසීන් එක්ව ශාන්ත අන්තෝනි මුනි සිද්ධස්ථානයේ සිදුකළ දේව මෙහෙයෙන් අනතුරුව සියල්ලෝ ඒකරාශි වී වික්ටර් කොළඹගේ ගුරු පියාට අගනා තිළින ඵලකයක් සමග උපහාර උලෙළක් පසුගියදා ඔහුගේ නිවසේදී පවත්වන ලදි.

මෙලෙස ග්‍රාමයට සමාජයට රටට විශාල සේවාවක් ඉටුකළ මේ ගුරුපියා 2014 මාර්තු 17 වන දින සියල්ලන්ගෙන් සමුගෙන දෙව්මව් තුරුලට පත්විය.

**සම්පත් විජේවර්ධන**

# ප්‍රදීපයට ප්‍රදීපයක් වූ අනුරාධපුර දිරිය මාතාවක්

ඥානාර්ථ ප්‍රදීපය පුවත්පත අනුරාධපුරයේ බෙදාහරිමින් කිතුනු ජනතාවට මෙන්ම බොදුනුවනටද ප්‍රදීපය දැක්ම පිළිබඳ දැනුම ලබාදීමට වෙහෙස ගන්නා ස්වෙච්ඡා සේවිකාවක් පිළිබඳ සටහනක් තැබීම ඇයගේ සේවයට කෘතගුණ සැලකීමක් පමණක් නොව දිවයින පුරා මෙවැනි සේවාවක නියැලෙන ස්වෙච්ඡා සේවක සේවිකාවනටද දිරියක් වේ යැයි සිතමි.

ඇය කේ. රීටා ප්‍රනාන්දු මහත්මියයි. අනුරාධපුර ශාන්ත ජෝශප් ආසන දෙව් මැඳුරේ ඥානාර්ථ ප්‍රදීපය හා ළමා ප්‍රදීපය අලෙවිකිරීම වසර 10 කට ආසන්න කාලයක් පුරා සිදු කරන්නීය. සතියෙන් සතිය ප්‍රදීපයේ අලෙවිය එකකින් හෝ වැඩි කිරීම ඇයගේ අරමුණයි. ඒ සඳහා රීටා සියුම් උපක්‍රම පාවිච්චි කරමින් ප්‍රදීපයේ ඇති වටිනාකම, හරය හා දැක්ම පිළිබඳ මීසම් ජනතාව දැනුම්වත් කරයි. ප්‍රදීපයේ කාලීන වැදගත් ලිපියක් පලවන සැමවිටම ඒ පිළිබඳව ඉරිදා දිව්‍ය පූජාවට සහභාගිවන බැතිමතුන්ව



දැනුම්වත් කිරීම ඇගේ විශේෂ ලක්ෂණයකි. කළුතර කලමුල්ලේ ඩබ්. බ්ලාසියුස් ප්‍රනාන්දු මහතා සමග 1984 ඔක්තෝබර් 1 දා යුග දිවියට එළඹි රීටා දරුවන් 4 දෙනෙකුගේ අම්මා කෙනෙකි.

රජයේ සැලසුම් ශිල්පියකු ලෙස අනුරාධපුර දිසාපති කාර්යාලයේ සංරක්ෂන මණ්ඩලයට ස්ථාන මාරුවක් තම සැමියාට ලැබීම නිසා මෙම යුවල අනුරාධපුරයේ ස්ථිර පදිංචිය ලබා ගත්තාය. රීටාගේ පවුල් දිවියෙත් ආග මික සේවාවෙත් සුවිශේෂි සන්ධිස්ථානය මෙයයි. ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය අනුරාධපුර මීසමේ ආරම්භක යුවලක් වෙමින් රීටා හා බ්ලාසියුස් යුවල එහි ලේකම්, භාණ්ඩාගාරික තනතුරු දරමින් පවුලක් තවත් පවුලකට ළඟාවෙමින් පවුල් ජීවිත පිළිබඳව මීසමෙත් අනුරාධපුර පදවිය තුළත් පවුල් සේවාවේ නියුක්ත වූවාය. රීටා ප්‍රනාන්දු මරිය හමුදාව තුළින්ද අසරණ සරණ සේවාවට අද දක්වා කැපවීමෙන් සේවය කරයි. සතියේ සැම බදාදා දිනකම අනුරාධපුර රජයේ ශික්ෂණ රෝහලේ නේවාසික රෝගීන් බැහැ දකිමින් අවශ්‍ය අධ්‍යාත්මික සුවය තම සොයුරු මරිය හමුදා සෙසු සමාජිකාවන් සමගින් රෝගීන්ට ලබාදීම අනෙක් සුවිශේෂි කරුණයි.

මෙවන් දැවැන්ත කාර්යක නියුතුවෙමින් තම පවුල හා දරුවන් ද සුරකිමින් මීසමේ දූතික සේවා කරමින්, ඥානාර්ථ ප්‍රදීපයද අලෙවි කරමින් කරන රීටාගේ සේවයට දෙවිමහෝත්ත මයාණෝ ප්‍රසන්න වන සේක. ඥානාර්ථ ප්‍රදීපයද ඇයට නිරෝගි සුවය සමග දිරිය කතක් වේවායි ප්‍රාර්ථනය කරයි.

**ජෝර්ජ් අයිවන් රෙක්සි**

# චීනයේ වුෂු තරගාවලියෙන් කඳාන ද මැසිනොද් විදුහලට ජයග්‍රහණ රැසක්



සම්ප්‍රදායික ජාත්‍යන්තර වුෂු තරගාවලිය මෙවර චීනයේ "අන්හුයි" පළාතේ "පී කෝ" නගරයේ දී පසුගියදා පැවැත් වීය. මෙයට රටවල් 65 ක් සහභාගි වූ අතර මෙම තරගය සඳහා කඳාන ද මැසනද් විදුහලින් ද හය දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් තරග කර පදක්කම් රාශියක් ද දිනා ගැනීමට සමත් විය.

ඡායාරූපයේ ඉහළ පෙළේ පදක්කම් දිනාගත් ශිෂ්‍යයන් ද, පහලින් පාලක මණ්ඩලය වන වුෂු උපදේශක කපිතාන් කැලිස්ටස් සමරතුංග, ගරු ජෝර්ජ් ද සිල්වා සහෝදරතුමා, විදුහල්පති ගරු බර්ට්‍රම් පෙරේරා සහෝදරතුමා, උප විදුහල්පති ගරු පුබුදු රාජපක්ෂ සහෝදරතුමා හා ක්‍රීඩා භාර නිලධාරි ලක්ෂ්මන් කරුණාරත්න මහතා ද සිටී. පිළිවෙලින් ශිෂ්‍යයින් ලබා ගත් පදක්කම් විස්තර පහත දැක්වේ.

තිසේන් සේමාල් (ලෝකඩ පදක්කමක්), පසිඳු මිනිවන් ( ලෝකඩ පදක්කමක්), සමන්ත ලක්පුර (රිදී පදක්කමක්), බ්‍රෙන්ඩන් බෙන්ස් (රන් පදක්කම් 02), හිරුෂ මධුසංක (ලෝකඩ පදක්කමක් හා රිදී පදක්කමක්) හේෂාන් නිම්නක (ලෝකඩ පදක්කමක්), මාර්ක් ටිපන් අයත් වේ. ශ්‍රී ලංකාවට ලද රන් පදක්කම් 3 න් දෙකක්ම මෙම විදුහලට ලැබීමත්, සම්පූර්ණ පදක්කම් 09 ක් ද ලැබීම විශේෂත්වයකි. මෙම තරගය සඳහා විදුහලේ පුහුණුකරු වන ලක්ෂ්මන් කරුණාරත්න මයා ද සහභාගි වී රිදී පදක්කමක් ද දිනා ගැනීමට සමත් විය. **(ගාමිණී රණවීර)**

**තේවත්ත ළමා දිනය.. 1 පිටුවෙන්**

"අපගේ ආධ්‍යාත්මික ශාස්තෘවර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමඟ එදා කල්වාරි හෙල මුදුනේ කුරුසිය පාමුල දක්වා ගමන් ගත්තේ මරිය මාතාවයි. කුරුස ගසේ සිට තම මෑණියන්ට සියළු දරුවන් පවරා දුන්නේත් ජේසුස් වහන්සේයි. එම නිසා ජේසු අනුගාමික අපි සැවොම එතුමියගේ දරුවන් වෙමු" යැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් එසේ පැවසුවේ ඉකුත් සෙනසුරාදා දින තේවත්ත ජාතික බැසිලිකා සිද්ධස්ථාන පරිශ්‍රයේ පැවති අගරදගුරු ළමා දිනයට පැමිණි දහස් සංඛ්‍යාත කතෝලික සිසු දරු දැරියන් අමතමිනි.

අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු දිනේෂ් ප්‍රියශාන්ත පියතුමන් සංවිධානය කළ මෙම ළමා හමුවට විශ්‍රාමික අගරදගුරු අති උතුම් නික්ලස් මාකස් හිමිපාණන් ද කොළඹ සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු, අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් ද ඇතුළු පියතුමන්, පැවිදි සොහොයුරු සොහොයුරියන් රාශියක් ද පැමිණ සිටියහ. එදින විශේෂ දේව කැඳවීම් පිළිබඳ ප්‍රදර්ශනයක් ද විවෘතව පැවතිනි.

**අතිගරු ඇන්සලම් ද ක්‍රෑස්... 1 පිටුවෙන්**

1971 දී ජාතික දෙව්සත්හලේ ආත්මික අධ්‍යක්ෂ විය. පමුණුගම සහයක ලෙසද කඳවල වැඩ බලන මීසම් සේවක ලෙසද, තුඩැල්ල, වැලිහේන මීසම් සේවක ලෙසද කටයුතු කර ඇත.

පූජක පුහුණුව උදෙසා දැඩි වෙහෙසක් ගෙන කටයුතු කළ එතුමා විශ්‍රාම ලැබීමෙන් පසු කෝට්ටේ නේවාසිකව පසුවිය. කෝට්ටේ සා. තෝමස් දෙව්මැඳුරේ එතුමන්ගේ දේහය තබා තිබූ අතර බ්‍රහස්පතින්දා අගරදගුරු මැදුරු ශ්‍රී හෘදයේ යැදුම් ගෘහයේ තබා එදින සවස බොරැල්ල කනත්තේ දී අවසන් කටයුතු සිදු කළේය.

**කෙටි කලකින්ම වර්ධුම්... 1 පිටුවෙන්**

බැතිමත් කතෝලික උරුමයක් තුළින් පෙරට ආ මිලන් මහතා, එම මහත්මිය හා දුවා දරුවන් පැය 24 ම ක්‍රියාශීලි වෙමින් ගෙන යන මෙම නාලිකාවට සැමගේ දායකත්වය දිය හැකි නම් සියළු රූපවාහිනි විකාශන ආයතන තුළින් පැහැදිලිවම නැරඹිය හැකි වනු ඇත.

## ජාතික කතෝලික ලේඛක හවුලේ ව්‍යවස්ථා සංශෝධනයට යෝජනා එවන්න

ජාතික කතෝලික ලේඛක හවුලට නවම් වූ යුගයක් උදාකරනු වස් ව්‍යවස්ථා සංශෝධන රැසක් සිදු කිරීමට තීරණය කරනු ලැබ ඇත. සාමාජික වූ ඔබගේ සුවිශේෂී වූ යෝජනා ඇත්නම් 2015 මාර්තු 25 දාට පෙර පහත ලිපිනයන් වලට යොමු කරන්න.

ලේකම්, 6 වන පාවුළු මධ්‍යස්ථානය, අංක 24, මල්වත්ත පාර, පිටකොටුව හා ලේකම් A179/21, "මධු කුමරි", මාදොල, අවිස්සාවේල්ල වෙත යොමු කරන්න. **(ප්‍රධාන ලේකම් - ජෝශප් ජයසිරි ප්‍රනාන්දු)**

## දෙමාපියන් දෙදෙනාම නැති දරුවන් පිළිබඳ තොරතුරු අප වෙත එවන්න

"මිණි උදාන" ජාතික නත්තල් කලාපයේ "රෝස කුසුමේ දිව්‍ය ජේසු" සංසදය මඟින් ශිෂ්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

කතෝලික / ක්‍රිස්තියානි, දෙමාපියන් දෙදෙනාම ජීවතුන් අතර නැති දරුවන් ඔබ මීසමේ සිටී නම් මීසම් සේවක පියතුමාගේ නිර්දේශය හා විදුහල්පති නිර්දේශය සහිත අයදුම්පතක් මීසම් ධර්ම සේවා සභාවේ ලේකම් තුමා මඟින් අප වෙත යොමු කරන්න.

සභාපති - ජෝශප් ජයසිරි ප්‍රනාන්දු මහතා, රෝස කුසුමේ දිව්‍ය ජේසු සංසදය, A179/21, මාදොල, අවිස්සාවේල්ල. දු. අංක 0779211762, 071 2173058

## "සමඳේ ඔබගේ කටහඬ අසා ඔබ පසු පස එන මා තෝරා ගත්තේ ඔබමය සමඳේ මගේ නුසුදුසු කම නොතකා"

2015 මාර්තු මස 3 වන දින මට්ටක්කුළිය සා. ජෝන් මේරි වියානි දෙව්සත්හලට විශේෂිත දිනයක් වූ බව ප්‍රකාශ කරන්නේ හද පිරි සතුටින් යුතුවයි. එනම් කොළඹ පදවියේ පූජක පුතකු වීම සඳහා මෙහි ඉගෙනුම ලබන සහෝදරතුමන් තිදෙනකු තේවාචාර්ය සහ පූජකවරය සඳහා සේවා පිවිසුමේ සංකේතයක් ලෙස නිල වස්ත්‍ර සහ බඳ පටි පැළඳවීමේ තේවාධුරය ලබා ගත්හ. එසේම සහෝදරතුමකු දේව වචනය ප්‍රකාශ කිරීමේ තේවාධුරය ලබා ගත් අතර එක් සහෝදරතුමකු පූජාසනයේ සහයක තේවාධුරය කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතින් ලබා ගත්හ.

එදින දිව්‍ය පූජා යාගය තුළ එතුමා ප්‍රකාශ කර සිටියේ දේව කැඳවීමේ ඇති අභිරහස්මය ස්වභාවය, එය දෙවියන් වහන්සේගෙන් ලැබෙන වරප්‍රසාදයක් බවත් මෙහිදී වඩා වැදගත්කම වන්නේ ලබන්නා තුළ ඇති නුසුදුසුකම හා නොහැකියාව නොව ඔහු තුළ දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය ක්‍රියා කරන ආකාරයයි. ඔවුන් වහන්සේට අප තුළ ක්‍රියා කරන්නට ඉඩ දෙන විට පුද්ගල වෙනසකට වඩා අභ්‍යන්තරික වෙනසක් සිදුවන බව පැවසූ අතරම, සා. ජුසේ වාස් මුනිඳුන්ගේ දූතික සේවය තුළින් අප දේශයට ඇති වූ පිබිදීම ගැන ද මතක් කෙරූ එතුමා, පූජකවරය යනු තාන්න මාන්න වලින් පිරුණු තත්ත්වයක් නොව අනිත් අයගේ හද ගැස්මට සංවේදී වෙමින් තම ජීවිත පරිත්‍යාග කිරීමක් බව සැල කෙරූහ.

තවද එදින දෙවියන් වහන්සේගේ සේවය සඳහා තෝරා ගැනීමේ ගැඹුර මොනවට පැහැදිලි කරමින් අප අදියුරු වික්ටර් සිල්වා පියතුමන්ගේ නව ගී පබැදුමෙන් නිර්මාණය වූ ගිතිකා ගායනය තුළින් දිව්‍ය යාගයේ අරුත දෙගුණ තෙගුණ කෙරූහ. **(ගරු සම්පත් පෙරේරා සහෝදරතුමා)**

## හලාවත පදවි කතෝලික ලේඛක හවුලේ පළමු සංවත්සරය සැමරේ

හලාවත පදවි කතෝලික ලේඛක හවුලට වසරක් පිරීම නිමිත්තෙන් හලාවත පදවි අනුනායක අතිගරු ප්‍රසාද් චමින්ද ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් 2015 මාර්තු 22 සෙනසුරාදා පෙ.ව. 9.00 ට නයිනමඩම, ගොන්සාල්වෙස් දහම් සෙවනේදී තුති පිදීමේ දේව මෙහෙයක් හා සංවත්සර උත්සව සභාව පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙදින ලේඛක හවුලට නවක සාමාජිකයින් බඳවා ගන්නා හෙයින් ඔබට ද මීට එක්විය හැකිය. **(ටෙක්ලා කල්දේරා)**

## කඳාන ද මැසිනොද් විද්‍යාලයීය වාර්තා වැඩසටහන

කඳාන ද මැසිනොද් විද්‍යාලය පිළිබඳ පුළුල් රූපවාහිනි වාර්තා වැඩසටහනක් නිර්මාණය කිරීමට පාසල් බලධාරින් සහ අදාළ ක්ෂේත්‍රයේ ආදි සිසුන් කටයුතු කරගෙන යයි. ඒ පිළිබඳ ඔබ සතුව ඇති පාසල පිළිබඳ අතීත ඡායාරූප, තොරතුරු හෝ පුවත්පත් වාර්තා එම වැඩසටහන වෙනුවෙන් මහඟු වටිනාකමකි. ඔබත් මැසිනෝදියට ආදරය කරන ආදි සිසුවෙක් හෝ දෙමාපියෙක් නම් ඔබ සතු දත්තයන් පිළිබඳව, ද මැසිනොද් විද්‍යාලයේ ඒඩ්‍රියන් අලස් මහතා අමතන්න. දු. අංක 077-8157822
**(අජිත් මෙන්ඩිස්)**

## තලවිල දී මරිය භට සම්මේලනයක්

කොළඹ පදවි මරිය හමුදාව මඟින් සංවිධානය කරන සම්මේලනයක් අප්‍රේල් මස 10, 11, 12 දිනවල තලවිල පුදබිමේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මේ සඳහා රදගුරුතුමන් කීපනමක් හා පියතුමන් දේශන පැවැත්වීමට සැලසුම් කර ඇත. අප්‍රේල් මස 10 දින ප.ව. 2.00 ට ආරම්භ කැරෙන අතර 12 දින දවල් 12.00 ට දිව්‍ය යාගයත් සමඟ මෙම සමුළුව අවසන් වන බව උසස් පාලක සභාව ප්‍රකාශ කරයි.

ආරම්භක දින සියලුම මරිය භටයින් සුදු ඇඳුමින් සැරසී සිටිය යුතු බවත් මෙම සමුළුව සාර්ථක කර ගැනීමටත් මරිය හමුදාව පිළිබඳව දැනුම වැඩිකර ගැනීමටත් අවස්ථාවක් සැලසෙන හෙයින් කොළඹ පදවියේ සියලුම මරිය භටයින්ට මේ සඳහා සහභාගි වන ලෙස ඉල්ලා සිටිති. **(බෙන්ජමින් කිරිහෙට්ටි)**

**මාර්තු මස 27 වන සිකුරාදා සවස 6.30 ට මරදාන පාතිමා දෙව්මැඳුරේදී "ක්ලෝරෝ කැලිබර්" කිතුනු තරුණ කැළ විසින් මෙහෙයවනු ලබන චතාරික ගීතිකා භාවනාව සඳහා ඔබ සැමට ආරාධනා කර සිටිමු. (ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා)**




ප්‍රදීප දසත තොරතුරු

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 15 ඉරිදා

## වෙන්නප්පුව ශු. පවුලේ බාලිකා විදුහලේ ආදි සිසුවියන්ගේ වාර්ෂික මහා සභාව

වෙන්නප්පුව ශු. පවුලේ බාලිකා මහ විදුහලේ ආදි ශිෂ්‍යාවන්ගේ වාර්ෂික මහ සභා සංවත්සරය මාර්තු 15 ඉරිදා (අද) ප.ව. 2.30 ට විද්‍යාලීය ශාලාවේදී පැවැත්වීමට නියමිතය. මෙදින නවක ආදි සිසුවියන් බඳවා ගන්නා බවද වත්මන් නිලධාරි මණ්ඩලය දන්වා සිටී. **(රෙක්ස් හැරිසන්)**

## ලෝක නාට්‍ය දිනය නිමිත්තෙන් ධාරණ - වීදි නාට්‍ය මාලාවක්

ඇන්ටන් මිහිදුකුල, කුමුදුනි මිහිදුකුල ප්‍රමුඛ ධාරණ වීදි නාට්‍ය කණ්ඩායම ලෝක නාට්‍ය දිනය නිමිත්තෙන් වීදි නාට්‍ය මාලාවක් පවත්වයි.

2015 මාර්තු 28 දින ජා-ඇල තුඩැල්ලේ දී ද මාර්තු 29 පල්ලෙවෙල දී ද මෙම සංදර්ශන රඟ දැක්වීමට නියමිතය. නළු නිළියන් 100 දෙනකුගෙන් සමන්විත වේදිකා නාට්‍ය නිර්මාණයක් සඳහා නවක නළු නිළියන් බඳවා ගැනේ. විමසීම් 072-4273226 දරණ දුරකථන අංකයෙන් හා අයදුම්පත් "නිර්මාණ අධ්‍යක්ෂ", අංක 4/2 විජය පාර, 3 කුරණ, මීගමුව යන ලිපිනයට යොමු කිරීමෙන් ද ඇතුළත් විය හැකිය.

## ගොල්ගොතාවේ යාගය මෙවරත් බඩල්ගමදී

මෙවරත් ගොල්ගොතාවේ යාගය පාස්කු නාට්‍ය මහ සිකුරාදා සවස 1.00 ට බඩල්ගම දේවස්ථාන භූමියේ දැවැන්ත වේදිකාවක රඟ දක්වන්නට කටයුතු සියල්ල සූදානම් වෙමින් පවතියි. නාට්‍ය අධ්‍යක්ෂණය නෙල්සන් කන්නන්ගර මහත්මා සිදු කරන අතර ප්‍රධාන නළුවා වන්නේ ප්‍රසිද්ධ රංගන ශිල්පියකු වන රාජසිංහ ලෝලුවාගොඩ මහත්මායි.

සභා හයේ එනම් වරාදල, මැල්ලව ගෙදර, මේස්ලන්ඩ්, බඩල්ගම, කෙහෙල් ඇල්ල, ගොඩිගමුව යන ග්‍රාමයන්හි කිතුනු බොදුනු ජනතාව 100 ට අධික පිරිසක් මෙහි රඟපානු ඇත. මේ සඳහා ප්‍රධාන මඟ පෙන්වීම මීසම් සේවක ගරු ඇන්ටන් රංජිත් පියතුමා සිදු කරන අතර සහායක ගරු අජිත් සුරංග පියතුමාගේ සහාය ද අගය කළ යුතුය. **(කේ. අබේසේකර)**

## දළුගම මීසමේ පමුණුවිල නව මීසම් ගෘහය ආසිරි ගැන්වේ



දළුගම මීසමට අයත් පමුණුවිල ශු. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ මෙතෙක් විශාල අඩුපාඩුවක්ව පැවති මීසම් ගෘහයක අවශ්‍යතාවය සපුරාලමින් දළුගම මීසම් සේවක ගරු ජූඩ් ශාමන් ප්‍රනාන්දු පියතුමන්ගේ පූර්ණ අධීක්ෂණයෙන් සහ මෙහෙයවීමෙන් කෙටි කාලයක් තුළ ඉතා අලංකාර ලෙස ඉදි කරන ලද අභිනව මීසම් ගෘහය එළඹෙන මාර්තු 22 ඉරුදින කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ සුරතින් ආසිරි ගැන්වීමට හා විවෘත කිරීමට සියලු කටයුතු සූදානම් වෙමින් පවතී. **(ජී. ඩී. සංජුල ජනිත්)**

## ළ.ක්‍රි.වී. සෞන්දර්ය උළෙල

ශ්‍රී ලංකා ළමා ක්‍රියාකාරී වීරයෝ ව්‍යාපාරයේ 2014 - 2015 වසර සෞන්දර්ය වසර ලෙස නම් කර එයට සමගාමීව කුසලතා ඇගයීම් මාලාවක් සංවිධානය කර තිබුණි. එහිදී ගායනා, වාදන, චිත්‍ර, නාට්‍ය, නර්තන හා ඡායාරූපකරණය ආදි ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ කුසලතා ඇගයීම් දිසා, පදවි මට්ටමින් පවත්වා පසුගියදා ජාතික කුසලතා ඇගයීම් මාලාව කොළඹ 10 සා. ජෝශප් විද්‍යාලයේදී ප්‍රවීන විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ පැවැත්වීය.

එහි ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ගේ ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය කිරීම හා ඔවුන්ගේ ජයග්‍රාහි අංග වේදිකා ගත කිරීම පෙබ. 07 දින මීගමුව ලොයොලා විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීය.

මෙම සෞන්දර්ය උළෙලට ළමා රංගන ශිල්පී ප්‍රමුදිත උදය කුමාර විශේෂ ආරාධිත අමුත්තා ලෙස එක් වූ අතර දිවයිනම ආවරණය කරමින් සිංහල හා දමිළ ළමුන් 750 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගි විය. මෙයට නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශාධිපති අතිගරු රොහාන් සිල්වා පියතුමා ඇතුළු සර්ව ආගමික නායකයින්ද එක් විය. **(ළ.ක්‍රි.වී. ජාතික අධ්‍යාපන කමිටු සභාපතිනි - ධනුෂ්කා සුභාෂිනි)**

### සමාජය හා සාමයික කේන්ද්‍රය මඟින්
## දිළිඳු ඔබට නොමිලේ නීති ආධාර

කොළඹ මරදාන ඩීන්ස් පාරේ නො. 281 හි පිහිටි (පාතිමා දෙව්මැඳුරු භූමිය) සමාජය හා සාමයික කේන්ද්‍රයේ නීති ආධාර ඒකකය මඟින් සතියේ සෑම සඳුදා සහ සිකුරාදා දිනකම ප.ව. 2.00 සිට 4.00 දක්වා පැවැත්වේ. 0112695425 අංකයෙන් වෙලාව වෙන්කරවා ගෙන මීසම් සේවක පියතුමාගේ, පැවිදි සොහොයුරියගේ, වෙනත් ආගමික නායකයකුගේ හෝ සිවිල් නිලධාරියකුගේ අනුමැතිය ලත් ලිපියක් සමඟින් පැමිණෙන්න.

**විමසීම් - නීතීඥ ගරු අශෝක් ස්ටීවන් නි.ම.නි. පියතුමා**



කළුතර දිසා තරුණ තරුණියන් සඳහා දින දෙකක චතාරික ඥානකාන්තිය පසුගිය දා මග්ගොන ජාතික කල්වාරි පුදබිමේ පිහිටි "නිමල මරිය දහම් පාසලේදී" පැවැත්වින.

කළුතර දිසා තරුණ කටයුතු අධ්‍යක්ෂ දියලගොඩ මීසම් සේවක ගරු. දිනේෂ් තරංග කීර්තිසිංහ පියතුමන්ගේ මූලිකත්වයෙන් මෙය සංවිධානය වූ අතර තරුණ තරුණියන් සඳහා විශේෂ දේශනයන්ද ගරු. පියවරුන් විසින් පවත්වන ලදී. මතුගම මීසම් සේවක ගරු. කලණ පීරිස් පියතුමන් විසින් ගීතයක් ගයමින් මෙහෙය ආරම්භ කළ අවස්ථාවයි මේ.

**(ඞී. ඇන්සලම් ප්‍රනාන්දු)**

## පළුගස්දමන ජපමාල දේවස්ථානයට වැඩිහිටි සමිතියක්

පොලොන්නරුව පළුගස්දමන ශුද්ධවූ ජපමාල දේවස්ථානයට මෙතෙක් අඩුපාඩුවක්ව පැවති වැඩිහිටි සමිතියක් ආරම්භ කිරීමට පළුගස්දමන මීසමේ වැඩිහිටි පිරිස් කටයුතු සලසාගෙන යයි.

ප්‍රදේශයෙහි විසිරී සිටින කතෝලික පිරිස් එක්කර දේවස්ථානයේ දියුණුව සඳහා කටයුතු කිරීමට ඔවුන් බලාපොරොත්තුවන අතර මීසම් සේවක පියතුමාගේ අනුමැතිය ඇතිව එම සමිතිය පිහිටුවා ගැනීමට බලාපොරොත්තු වන බව මීසමේ වැඩිහිටි පිරිසක් ප්‍රදීපයට පැවසූහ.

**(බී. රංජිත් මැන්ඩිස්)**



පමුණුගම මහ විදුහලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය විවෘත කිරීමට පැමිණි බෝපිටිය මීසම් පාලක ගරු එරින්ටන් සිල්වා පියතුමා පමුණුගම මහ විදුහලේ නව විදුහල්පති ජේ.එම්.ඞී.පී. රංජිත් මහතා විසින් පිළිගෙන උත්සව භූමියට මෙසේ කැඳවාගෙන අයුරු.

**(බෙන්ජමින් කිරිහෙට්ටි)**

## කලමුල්ල සා. සෙබස්තියන් මංගල උලෙළ

කලමුල්ල ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය පසුගියදා උත්සවශ්‍රීයෙන් පැවැතිණි.

මෙහිදී ශුද්ධවූ සෙබස්තියන් මුනිඳුන්ගේ ප්‍රතිමාව රැගත් බැතිමතුන් වීදි සංචාරය කළ ආකාරය ඡායාරූපයෙන් දැක්වේ. කලමුල්ල මීසම් සේවක ගරු ලෝරන්ස් රාමනායක පියතුමාගේ අනුශාසකත්වයෙන් දේවස්ථාන දායක සභාව මෙම මංගල උත්සවය සංවිධානය කර තිබුණි.

**(සුනිල් එස්. තන්ත්‍රිආරච්චි)**



මග්ගොන-දියලගොඩ සාන්ත දොන් බොස්කෝ ළමා නිවාසයේ වාර්ෂික මංගල උළෙල ඉකුත් දින මහත් හරසරින් පැවැත්විණ. මග්ගොන සාන්ත විසෙන්ති ආයතනයේ අධ්‍යක්ෂක ගරු. ඩිලාන් පෙරේරා නි:ම:නි: පියතුමා ප්‍රමුඛ ගරු. ලූෂන් පෙරේරා නි:ම:නි: , ගරු. ජෝසප් ජස්ටස් තේවාචාර්ය තුමන් (C.M.S.F) එක්ව මංගල දේව මෙහෙය සිදුකරන ලදී. දොන් බොස්කෝ ආයතනයේ ආදි සිසුවන්ගේ ධන පරිත්‍යාගයෙන් ඉදිකරන ලද නව ලූර්දු ගුහාවද, ප්‍රැන්සිස්කන් නිකායේ ප්‍රදේශාධිපති, ගරු. ජෙයරාජ් අරුලානන්දන් (C.M.S.F) සහෝදරතුමන් විසින් එදින විවෘත කරන ලදී. ළමා නිවාසයේ අධ්‍යක්ෂ ගරු. තියෝපිලස් සහෝදරතුමන්ගේ මූලිකත්වයෙන් එම ආයතනයේ සෙසු සහෝදරතුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩලය විසින් මෙම උළෙල සංවිධානය කරන ලදී.

## මහරගම සා. විසෙන්ති පාවුලා සේවාව

මහරගම මීසම් ප්‍රදේශය තුළ කාලයක් දයාවේ සේවාවක් ඉටු කරන ස්වර්ගාරෝපිත දේවමාතාවන්ගේ දෙව්මැඳුරට අයත් විසෙන්ති පාවුලා සංගමය මේ වසර තුළදී තම සේවා දැක්ම පුළුල් ආයකත්වයක් ඇතිව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. දිළිඳු පවුල් නංවාලීම පාසල් දරුවන් සඳහා සේවාව සහ මහරගම පිළිකා රෝහලේ රෝගීන් උදෙසා සේවාව මෙවර සේවා දැක්මට ඇතුළත්ය.

මහරගම මීසම් සේවක ගරු ජූඩ් නිකලස් පියතුමා මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන මෙම සේවාවේ විශේෂත්වය විසෙන්ති පාවුලා සාමාජික සාමාජිකාවන් විසින් මහරගම පිළිකා රෝහලේ රෝගීන් උදෙසා ඉටු කරනු ලබන සේවාවයි. අවශ්‍යතා අනුව රෝගීන්ට බෙහෙත් ද්‍රව්‍ය හා ආහාර පානාදිය ලබාදීම මේ යටතේ මූලික වේ. මාසයකට වතාවක් රෝහලේ රෝගීන් බැලීම සඳහා පැමිණෙන පිරිසට තේ පානය ලබා දීමක්ද ඔව්හු සිදු කරති. තම සේවා දැක්ම වෙනුවෙන් මහරගම මීසම්වාසීන් සේම බෞද්ධ ජනතාව විසින්ද ලබා දෙන මුදල් ප්‍රදානයන් අගය කරන බැව් සංගමය පවසයි.

**(ක්‍රිස්ටෝපර් රණසිංහ)**

## රත්නපුර සා. විසෙන්ති පාවුළු දයා සේවා නව නියමුවෝ

පසුගියදා රත්නපුර මීසම් දහම් සේවා මධ්‍යස්ථානයේදී රත්නපුර සාන්ත වින්සෙන්ති පාවුලු සමිතියේ නව නිලධාරීන් පහත සඳහන් අයුරු නිතරගයෙන් තේරී පත්වූහ.

සභාපති තියබෝල්ඩ් සමරතුංග, ලේකම් නීතා ප්‍රනාන්දු, භාණ්ඩාගාරික නිශාන්ත වීරවර්ධන, උප සභාපති එම්. මහේන්ද්‍රන්, උප ලේකම් බර්නඩින් යන මහත්ම මහත්මීහු.

**(ඞී.ටී.එස්. කෝරලගේ)**

## මැසිනොද් විදුහල් කැපකිරීමේ මංගල උලෙළ



අද දින සුවිශේෂී වැදගත් දිනයක්. මෙම වන්දනා ගමන දෙවියන් සොයා යෑමේ ගමනක් වෙනවාසේම කිතුනු විශ්වාසය ඇදහිල්ල වැඩි දියුණු කර ගැනීමේ ගමනක් විය යුතුයි. දෙවියන් වහන්සේට ප්‍රසන්න දරුවන් වශයෙන් ගොඩනැගීමට අවශ්‍යයි. මේ ජීවිතය ආත්මීකව ගොඩනගාගෙන යටහත් පහත් ලෙස කීකරු ලෙස ඇදහිල්ලේ ජීවිතයක් ගත කිරීමට සිතා ගත යුතු යැයි ගරු ලලිත් එක්ස්පෙඩිටස් පියතුමා පැවසීය.

කඳාන ද මැසිනොද් විදුහලේ ගරු සහෝදරතුමන්ලා, ගුරු මණ්ඩලය, සිසු දරු දැරියන්, කාර්ය මණ්ඩලය දේවමාතා වහන්සේගේ රැකවරණයට බාර කරමින් වාර්ෂිකව සංවිධානය කරන වන්දනා ගමන තේවත්ත ලංකා අප ස්වාමිදූගේ ජාතික බැසිලිකා සිද්ධස්ථානයේ දී පැවති අවස්ථාවේදී එතුමා පැවසීය.

දේවමාතාවන්ගේ ප්‍රතිමාව රැගෙන අලංකාර පෙරහරකින් සිසු දරු දැරියෝ දේවස්ථානය කරා පිය නැගූහ. මෙය 83 වෙනි වරට සංවිධාන කර තිබුණි. මේ අවස්ථාවට විදුහල්පති ගරු බර්ට්‍රම් පෙරේරා සහෝදරතුමා උප විදුහල්පති ගරු පුබුදු රාජපක්ෂ සහෝදරතුමා, නියෝජ්‍ය විදුහල්පති ගරු ටෙරන්ස් ප්‍රනාන්දු සහෝදරතුමා, ගුරු මණ්ඩලය, සිසු සිසුවියන් දෙමාපියන් විශාල පිරිසක් සහභාගි වූහ. **(ඇන්ටන් ජයසූරිය)**

## "ක්‍රීඩාවේ පරමාර්ථය ජය පරාජය නොව සහභාගිත්වයයි"



නොබෝදා සීදූව සා.තෝමස් කතෝලික ජාත්‍යන්තර පාසලේ නිවාසාන්තර මළල ක්‍රීඩා උළෙලේ ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වූ අතිගරු ඩිලාන් ප්‍රනාන්දු පියතුමා ක්‍රීඩාවේ වැදගත්කම ජය පරාජය නොව සහභාගිත්වය බවත් එමගින් ජය පරාජය විඳදරා ගැනීමේ හැකියාව ප්‍රගුණ කළ හැකි බවත් සිසුන් තුළ විනයගරුකභාවය ඔප්නැංවිය හැකි බවත් ප්‍රකාශ කළේය.

සීදූව සා. තෝමස් කතෝලික ජාත්‍යන්තර පාසල ආරම්භ කිරීමෙන් ඉක්බිති පැවති දෙවන නිවාසාන්තර ජවන හා පිටිය මළල ක්‍රීඩා උළෙලේදී ලකුණු 490 ක් ලබාගනිමින් යුනිටි නිවාසය ශූරතාව දිනාගැනීමට සමත් විය. අනුශූරතාව හිමි වූයේ ග්ලෝරි නිවාසයටයි.

උත්සවය ආරම්භ වූයේ නිවාස ධජ ඔසවනු ලැබීමෙන් හා පාසල් ගීතය ගායනා කිරීමෙනි. සම්භාවනීය අමුත්තන් උත්සව භූමියට කැඳවාගෙන එනු ලැබූයේ විචිත්‍ර සරඹ සංදර්ශනය මධ්‍යයේය. මෙසේ ඇරඹී අභිමානවත් ක්‍රීඩා උළෙල වර්ණවත් වූයේ ඔලිම්පික් පහන දැල්වීම මගිනි.

විදුහල්පති ගරු කෙනඩි පෙරේරා පියතුමා ප්‍රමුඛ ආරාධිත අමුත්තන් විසින් ත්‍යාග ප්‍රදානය සිදුකෙරුණු අතර දර්ශනීය ආචාර පෙළපාලිය පැමිණි සිටියවුන්ගේ ඉමහත් ප්‍රසාදයට හේතුපාදක විය. විනිශ්චය මණ්ඩලය මගින් හොඳම නිවාස කූඩාරම ලෙස තෝරාගන්නා ලද්දේ ග්ලෝරි නිවාසයයි. උත්සවය අවසානයේ අනුග්‍රහය දැක්වූ මව්පියන්ටත් ගුරු භවතුන්ටත් සෙසු අභිවෘද්ධිය පතන්නන්ටත් විදුහල්පති පියතුමා සිය හෘදයාංගම ප්‍රණාමය පළ කළේය. **(හෂාන් ඉහළගෙදර)**


අන්කිසිවකට සමාන නොවූ අධ්‍යාත්මික චාරිකාවන්.... ක්වෙස්ට් සමග ගොස් විශිෂ්ට වන්දනා ගමන් සොයාගන්න...

08 දින වන්දනා චාරිකාව
ඉතාලිය
ටියුරිනයේ සිරි සළුවද ඇතුළත් වේ.
රු.185,000
පිටත්වීම : මැයි 27

පවුල් හා පැවිදි වසර වෙනුවෙන් විශේෂ දීමනා

කොටස් වශයෙන් ගෙවීමට දැන් පුළුවන

විශේෂ 07 දින වන්දනා ගමන
පාතිමා
පාතිමා ලිස්බන්, සැන්ටරීම්
පිටත්වීම : අප්‍රේල් 14 සැප්. 13
මුල්ම වන්දනාකරුවන් 50 දෙනා සඳහා විශේෂ මිල රු. 153,000/-
මාර්තු 30 ට පෙර වෙන්කරගන්න.
~~රු.195,000~~

07 දින වන්දනා චාරිකාව
මෙජුගෝරි
ටියුරිනයේ සිරිසළුව, පාදුවා සහ රෝස කුසුම සඳහා අමතර දින 4 අමතර රු. 75,000/-
24/25 මංගල්‍ය දිනවලදී මෙජුගෝරිවල රැදී සිටින්න.
රු.249,000
පිටත්වීම : ජුනි 21

10 දින වන්දනා ගමන
පිටත්වීම : ඔක්. 10
පවුල් වසරේ ලූර්දු හා පාතිමා වන්දනා ගමන
මංගල්‍යයට පාතිමා හි සිටින්න.
ලිස්බන් හා සැන්ටරීම් සමගින්
රු.249,000

12 දින වන්දනා ගමන
රෝමය හා ලූර්දුව
පිටත්වීම : අගෝ. 10
රු.310,000

08/09 දින වන්දනා ගමන
ශුද්ධවූ දේශය
සෑම වැදගත් තැනක්ම බැහැදැකීම.
රු.185,000
පිටත්වීම : අප්‍රේල් 10 මැයි 11 අගෝ. 09 සැප්. 10 දෙසැ. 07

11 දින වන්දනා චාරිකාව
ටියුරිනයේ සිරි සළුව
සමගින් රෝමය, වතිකානය, ලැන්ෂියානෝ, පාදුවා, අසීසිය, ලූර්දු, නේවර්ස් සහ පැරීසිය
රු.315,000
පිටත්වීම : මැයි 28

15 දින වන්දනා ගමන
ඉතාලිය, ප්‍රංශය සහ පෘතුගාලය
පිටත්වීම : අගෝ. 10
රු.395,000

08 දින වන්දනා චාරිකාව
ලූර්දුව
නේවර්ස් සහ පැරිසිය සමගින්
189,000
පිටත්වීම : මැයි 23

සියලු චාරිකා සඳහා ගුවන් ප්‍රවේශ පත්‍ර, වෘත්තීය මාර්ගෝපදේශක සහය, අවට සිරි නැරඹීමේ චාරිකා සහ සියලු ආහාර වේල් අඩංගු වේ.

ක්වෙස්ට් ඩෙස්ටිනේෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ්
119 A, කාසල් වීදිය, කොළඹ 08. | දු.ක.: +94 11 2671785 - 6, ෆැක්ස්: +94 11 2671787
ඊ-මේල්: tours@qwestdestinations.com .වෙබ් අඩවිය: www.qwestdestinations.com
Hotline: 011 2687502
(Q14N8517)



# ශා. ජුසේ වාස් මුනි ඓතිහාසික ප්‍රතිමාව මහනුවර ආසන දෙව්මැඳුරේ තැන්පත් කෙරේ

ශුද්ධෝත්තම පියතුමා ගාලු මුවදොර පිටියේ දිව්‍ය පූජා යාගය ඔප්පු කළ අල්තාර මණ්ඩපය මත තැන්පත් කර තිබූ ශාන්ත ජුසේ වාස් මුනිඳුන්ගේ විශේෂ ප්‍රතිමාව මහනුවර ආසන දෙව්මැඳුරේ ගාම්භීර ලෙස තැන්පත් කැරිණ. ලීයෙන් කැටයම් කළ මෙම ප්‍රතිමාව මහනුවර ආසන දෙව්මැඳුර වෙත රැගෙන එනු ලැබුවේ එය නිර්මාණය කළ මොරටුවේ පදිංචි රේමන්ඩ් ප්‍රනාන්දු මහතා සහ ශාන්ත ජුසේ වාස් මුනිඳුන් පිළිබඳ ජාතික කාර්යාලයේ සාමාජිකයන් විසිනි.

මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමි ඔප්පු කළ දිව්‍ය පූජාවෙන් පසුව මෙම ප්‍රතිමාව මීසම් වාසීන් විසින් කර මතින් රැගෙනවිත්, චාම් වුවද අනගි ලෙස සාදා තිබූ මණ්ඩපය තුළ තැන්පත් කරන ලදී. මීසම් සේවක ගරු අයිවන් ජයසුන්දර පියතුමන් විසින් ප්‍රතිමාවේ වම් අතේ කුඩා කුරුසිය තබන ලදී. රදගුරු හිමිපාණන් විසින් රේමන්ඩ් ප්‍රනාන්දු මහතාව රැස්ව සිටි ජනතාවට හඳුන්වා දෙමින් ප්‍රතිමාව නෙලීමේදී ඔහුගේ දක්ෂතාවය උපරිම අයුරින් යොදා ගනිමින් ගැඹුරු කැපවීමකින් යුක්තව මෙම කාර්යය ඉටුකර ඇති බව සඳහන් කරන ලදී. **(වික්ටර් සිල්වා)**

# 2014 වසරේ නත්තල් සුබ පැතුම් පත් තරගයේ ජය වැලිවිට ගයනි තරුෂිකාට





බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය හා ඒකාබද්ධව 2014 වසරේදී ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව විසින් "නත්තලයි, සාමයයි, සංහිඳියාවයි" යන තේමාව යටතේ සංවිධානය කරන ලද දීප ව්‍යාප්ත නත්තල් සුබ පැතුම් පත් තරගයේදී වැලිවිට ලියනගේ දෝන ගයනි තරුෂිකා මෙනෙවිය ප්‍රථම ස්ථානය දිනාගන්නට සමත්විය.

වැලිවිට ශාන්ත මරියා දේවස්ථානයේ "සුනිමල" දහම් පාසලේ දහම් ගුරුවරියක ලෙස දහම් සේවයක නියැලෙන ගයනි තරුෂිකා 1 වසරේ සිට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වාම බම්බලපිටිය ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ ආදි සිසුවියකි. මීගමුව කලාපීය අනුනායක ගරු පැට්‍රික් පෙරේරා පියතුමන් හිටපු අග්‍රාමාත්‍ය සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය දී.මු. ජයරත්න මැතිතුමන්, හිටපු තැපැල් සේවා අමාත්‍ය ජීවන් කුමාරතුංග මැති තුමන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගිත්වයෙන් 2014 නොවැම්බර් මස 30 වන දින මීගමුව මහ වීදියේ ශාන්ත මරියා දේවස්ථාන ශාලාවේදී පැවති උත්සවයකදී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතින් ජයග්‍රාහී තිළිණය සහ සහතිකය ප්‍රදානය කළේ 2014 වසරේ හොඳම නත්තල් පත ඉදිරිපත් කිරීම වෙනුවෙන්ය.

කුඩා අවධියේ සිටම චිත්‍ර කලාවට දක්ෂකම් පෙන්වා විවිධ චිත්‍ර තරග වලින් ජයගෙන ඇති ගයනි තරුෂිකා වැලිවිට සිරිල් මාටිනස් මහතාගේ සහ ෂර්ලීන් ලීනා මහත්මියගේ දයාබර දියණියය.

**(වැලිවිට එම්.ජෝ. පාරිස්)**



මග්ගොන මීසමට අයත් කුමාරකන්ද වේලන්කන්නි දේවමාතාවන්ගේ ප්‍රතිමාව ස්ථාපිත කර වසර පහක් පිරීමේ මංගල උලෙළ ඉකුත් දින සිදුකරන ලදී.

කළුතර - කටුකුරුන්ද මහා විදුහලේ ආචාර්ය ගරු අසන්ත ප්‍රියනාල් ප්‍රනාන්දු, මග්ගොන මීසම් සේවක ගරු ඉෂාන් ප්‍රමීන පියතුමා මංගල දේව මෙහෙය සිදු කළ අතර වේලන්කන්නි දේවමාතාවන්ගේ ප්‍රතිමාව රැගෙන පෙරහර යැමෙන් පසු දානය බෙදා දීමද සිදුවිය. **(ඕ. ඇන්සලම් ප්‍රනාන්දු)**

# කටුනේරියෙන් නවගමුවට එති

කටුනේරිය මීසමේ බැතිමතුන් සිදුකරන නවගමුව කතෝලික දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය මාර්තු 15 දා (අද) සිදුකිරීමට නියමිතය.

අර්ධ ශතවර්ෂයකට වැඩි කාලයකදී කටුනේරිය ජනතාවට වැළඳුණු වසංගත රෝගයකට ජනතාව සහ කටුනේරිය ශාන්ත සෙබස්තියන් දෙව්මැඳුරේ මීසම්පති පියතුමන්ලා විසින්වූ බාරයක් ඉටු කිරීම සඳහා නවගමුවේ පිහිටි දේවමාතාවන්ට කැප කළ දේවස්ථානයේදී, කටුනේරිය ජනතාව පවත්වනු ලබනුයේ ශුද්ධවූ ජුසේතුමාගේ මංගල්‍යය වීම මෙහි විශේෂත්වයකි.

කඩුවෙල වැලිවිට මීසමේ සහ කටුනේරිය මීසමේ පියතුමන්ලා සහ බැතිමතුන් මෙම මංගල්‍යය සංවිධානය කරති. දිව්‍ය පූජාව පෙ.ව. 8.00 ට පැවැත්වේ.

**(රෙක්ස් හැරිසන්)**

# "නියම කුකුළා ඇන්තනීස් කුකුළාට" 'කිතු හඬ' කණ්ඩායමේ විරෝධය

මේ දිනවල රූපවාහිනියේ විකාශය වන කුකුළ් මස් දැන්වීමකට අනුව ශුද්ධ වූ අන්තෝනි මුනිතුමන්ගේ නමින් 'නියම කුකුළා ඇන්තනීස් කුකුළානේ' යනුවෙන් සඳහන් වෙළඳ දැන්වීම තුළින් කතෝලික ජනයාගේ අති මහත් ගෞරවාදරයට පාත්‍ර වූ ශුද්ධ වූ අන්තෝනි මුනිතුමන්ගේ චරිතය දැඩි ලෙස අගෞරවයට ලක්වන බවත්, මේ වන විටත් ඒ සම්බන්ධව තම සංවිධානයට පැමිණිලි ගලා එන බවත් 'කිතු හඬ' කතෝලික දහම රැකගැනීමේ ජාතික ව්‍යාපාරය සිය විරෝධය ප්‍රකාශ කරමින් සඳහන් කර සිටියි.

අදාල කුකුළු මස් නිෂ්පාදන ආයතනයේ හිමිකරුවන් ඇතැම් විට කතෝලිකයින් විය හැකි බවත්, අන්තෝනි මුනිඳුන්ට ඇති දැඩි භක්තිය නිසා වැටහීමකින් තොරව මෙම දැන්වීම නිර්මාණය කිරීමට හා එම නිෂ්පාදනයට අන්තෝනි මුනිවරයාගේ නම යොදන්නට ඇති වුවද ඒ තුළින් අන්තෝනි මුනිතුමන්ට විශාල අපහාසයක් සිදුවන බවත්, දැනටමත් අන්තර්ජාලය හරහා මෙම දැන්වීම පාදක කර ගනිමින් අන්තෝනි මුනිතුමන් උපහාසයට ලක් කිරීමට ඇතැමුන් කටයුතු කරමින් සිටින බවත්, මෙනිසා මෙම දැන්වීමේ අන්තෝනි මුනිතුමන්ට අපහාස වන කොටස් ඉවත් කර දැන්වීම පල කරන ලෙසත්, 'ඇන්තනීස් චිකන්' යන්න වෙනුවට නිෂ්පාදනයට වෙනත් නමක් යොදා ගන්නා ලෙසත් තම සංවිධානය කරුණාවෙන් ඔවුන්ගෙන් ඉල්ලා සිටින බවත් සඳහන් කරයි.

මීරිගම ශුද්ධවූ ජපමාල දේවමාතා දේවස්ථානයේ අඩුවක්ව පැවති අඩි 7ක් උසැති සිමෙන්තියෙන්ම තනන ලද අලංකාර දේව මාතා ප්‍රතිමාවක් පසුගියදා මීසම් සේවක ගරු අනුර ශ්‍රී කමල් පියතුමන් අතින් ආසිරි ගැන්විණ. මෙම ප්‍රතිමා මණ්ඩපය ගිරිඋල්ල මීරිගම ප්‍රධාන මාර්ගයට මුහුණලා දේවස්ථාන භූමිය ඉදිරිපිට ස්ථාපිත කර ඇත.

**(අමල් ඉංදික, අතුල, ලක්මාල්)**



# මැසිනොද් පාපන්දු පිටිය ආසිරි ගැන්වේ

කඳාන ද මැසනොද් විද්‍යාලීය පාපන්දු පිටිය රුපියල් මිලියන ගණනක වියදමකින් පුනරුත්තාපනය කර, ශ්‍රී ලංකා පාපන්දු සංගමයේ සභාපති රන්ජිත් රුද්‍රිගු මහතා අතින් විවෘත විය. මෙසේ විවෘත කරන ලද පාපන්දු පිටිය විද්‍යාලීය ආත්මීක අනුශාසක ගරු ක්‍රිෂාන්ත ප්‍රනාන්දු පියතුමා ආශිර්වාද කළේය.

**(ක්වින්ටස් පෙරේරා)**





වසර 35ක අමිල සේවයෙන් පසුව ගුරු සේවයෙන් විශ්‍රාම ලැබූ පමුණුගම මහ විදුහල්පති අනුර ගුණවර්ධන මහතාට උපහාර දැක්වීමේ උළෙලක් එම විදුහලේ පැවති අතර ගරු පියවරුන් හා මැති ඇමතිවරුන් සමග උත්සව ශාලාව වෙත ගමන්ගත් අයුරැයි මේ.

**(එස්.කේ.ජේ. කුරේරා)**

# කිතුනු ස්ථාවර බව මංගල උළෙලින්

පන්නිපිටිය මීසමේ දික්හැතැක්ම ලූර්දු දේව මාතාවන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල උලෙළ දෙව්මැඳුරට අයත් කිතුනු සංසයේ දායකත්වයෙන් ඉතා අර්ථාන්විතව පසුගියදා පැවැත්විණි. මීසම් ප්‍රදේශය තුළ කිතුනු ස්ථාවරභාවය පෝෂණය කිරීමෙහිලා මෙවර මංගල උළෙල තේමා කර ගන්නා ලදී.

මීසම් සේවක ගරු ටිරෝන් පෙරේරා සහ සහයක ගරු තුසිත සෝලංගආරච්චි පියවරුන් සමග එක්ව දික්හැතැක්ම ක්‍රියාකාරී කමිටුව සහ සැදැහැවතුන් විවිධ කිතුනු තේමාවන් ඔස්සේ මෙවර නුවාන මෙහෙයන්ට දායක වූහ. මංගල දින මහා දේව මෙහෙය මග්ගොන ළමා නිවාසයේ අධ්‍යක්ෂක ගරු සම්පත් පෙරේරා නි.ම.නි. පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මීසමේ සෙසු දෙව්මැඳුරු වල සැදැහැවතුන්ද තම සහෝදර සංසයේ මංගල උලෙළට දායකත්වය ලබා දුනි.

**(ක්‍රිස්ටෝපර් රණසිංහ)**

# රාජකදළුවට නව පියතුමන් දෙනමක්

රාජකදළුව මීසමේ අවුරුදු තුනක් පමණ සේවය කළ ගරු චමින්ද ප්‍රසාද් සහ සහයක මාලන් විජේන්ද්‍ර තමෙල් යන පියවරු රාජකදළුව මීසම් සේවයෙන් පසුගියදා සමුගත්හ. ගරු චමින්ද ප්‍රසාද් පියතුමා හලාවත පදවි අනුනායක පදවියටද, ගරු මාලන් විජේන්ද්‍ර තමෙල් පියතුමා පුත්තලම මීසමේ සහයක ලෙසද පත්වීම් ලදහ.

නොරොච්චෝලේ මීසම් සේවකව සිටි ගරු සම්පත් ප්‍රසන්න රාජකදළුව නව මීසම් සේවක පියතුමා ලෙසද ගරු ඇන්ටන් නිරෝෂන් පියතුමා සහයක ලෙසද සේවයට පැමිණි අතර නව පියතුමන් හරසරින් පිළිගෙන සේවය කළ පියතුමන්ට සමුදුන්හ. **(ක්‍රිස්ටෝපර් ජාන්ස)**



සග සුව දිනු චන්ද්‍ර කීර්ති කුලරත්නයන්ගේ "අපි එතෙර වෙමු" පාස්කු දැක්ම මෙවරත් මීසම්වල ප්‍රදර්ශනය කිරීමට චන්ද්‍ර කීර්ති කුලරත්න පදනම විධිවිධාන යොදා ඇත. එම නාට්‍යයේ අවස්ථාවකි මේ.

**(සී.ආර්. ඩික්සන් ඇන්ටනි)**



හලාවත පදවියේ 'දෙව්මිණ' පුවත්පත වෙනුවෙන් කාර්යාලයක් 'සුදසුන' ආයතනයේ වෙන්කර ගරු ලින්ටන් නිහාල් පියතුමා විසින් ආශිර්වාද කර විවෘත කරන ලදී. හලාවත පදවි ජනසංනිවේදන අධ්‍යක්ෂක ගරු ප්‍රැන්ක් තිසේරා පියතුමන්ගේ අනුශාසකත්වයෙන් සිදු කළ අතර ලේඛක හවුලේ සාමාජික සාමාජිකාවන්ද මේ අවස්ථාවට සහභාගි වූහ. **(ශ්‍රියාංගනී ෆිලීෂියා)**



හැඳල බලගල මීසමට අයත් ගලගහදූව ශුද්ධවූ සෙබස්තියන් මුනිඳුන්ගේ දේවස්ථානයේ වාර්ෂික මංගල්‍ය උළෙල නොබෝදා මහත් උත්සවාකාරයෙන් සිදුකරනු ලැබීය. මංගල්‍ය දිව්‍ය පූජා මෙහෙය සිදු කිරීම සඳහා පැමිණි කොච්චිකඩේ ශුද්ධවූ අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ මීසම් සේවක ගරු ජූඩ් රාජ් ප්‍රනාන්දු පියතුමා දෙව්මැඳුර වෙත පෙරහරින් කැඳවාගෙන පැමිණි අවස්ථාව මෙහි දැක්වේ. බලගල සදාසරණ දේවස්ථානයේ මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමා සහ මීසම් සහයක ගරු ඉසිර ජයසූරිය පියතුමාද බස්නාහිර පළාත් සභාවේ හිටපු අමාත්‍ය ලෝරන්ස් මාදිවල මහතාද ඡායාරූපයේ වෙති.

**(නිමල් පෙරේරා)**